

මහාවග්ග පාළි සන්නය.

නමොත්‍ථුස්ස භගවතෝ
අරහතෝ සම්මා සම්බුද්ධස්ස.

1. තෙන සමයෙන බුද්ධෝ භගවා උරුවෙලායං විහරති නජ්ජා තෙරක්ඛ්‍රාය තීරෙ බොධිරුක්ඛමූලෙ පඨමාභි සම්බුද්ධෝ. අථඛෝ

සමන්තචක්ඛුං සම්බුද්ධං ඤත්වා විනය දෙසකං
පවක්ඛාමි මහාවග්ග පාළිඤ අත්ථවණ්ණනං.

විනයඤ්ඤථාදිඤව දිඨාපකරණානිව
ඔලොකෙත්වාන සඤ්ඤාවං සිහළාඤ නිරුත්තිඤ.

1. තෙන සමයෙන, (යම්කාලෙකැ අප බුදුරජාණෝ සියලු කෙලෙසුන් මුල්සිඳ බුඩරාජ්‍යයට පැමිණ වදුළසේක්ද) එකල්හි; බුද්ධෝ, චතුරාර්‍යසත්‍ය ධර්මයන් සර්වඥතඥානයෙන් අවබොධකළාවූ; භගවා, (භගවා රාගොති භගවා යනාදීන් විශිෂ්ටතර ගුණොපලක්ෂිතවූ) භාග්‍යවතුන් වහන්සේ; තෙරක්ඛ්‍රාය, (මඩ සෙවෙල් පණකාදි) දෙෂවිරහිතවූ ජලය ඇති; නජ්ජා, නදියගේ; තීරෙ, ඉවුරෙහිවූ; උරුවෙලායං, මහත්සීමා ඉවුරක්සේ පිහිටි වැලිරැස සම්පයෙහිවූ; බොධිරුක්ඛමූලෙ, බෝරුක් මුල්හි පැනනැඟි විදුරස්නෙහි; (බොධිවුච්චති චතුසු මග්ගෙසු ඤාණං, තං බොධිං භගවා එත්ථ පත්තොති රුක්ඛොපි බොධිරුක්ඛොත්වෙව නාමං ලභි යනු අටුවා හෙයින් ඥෝවාන් ආදි සතරමඟ ඥාණතෙම බොධියයි කියනු ලැබේ, භගවත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ ඒ සිවිමඟ ඥාණට මේ රුක්මුලදී පැමිණියේක් යයි රුක් හෙතම්ද බෝරුක් මයයි

භගවා බොධිරුක්ඛමූලෙ සත්තාහං එකපල්ලඞ්කෙන නිසීදි විමුත්තිසුඛ පටිසංවෙදී. අථඛෝ භගවා රත්තියා පඨමං යාමං පටිචචසමුප්පාදං

නම් ලැබුයේය, මෙසේ එකදෙසයකින්ම අට්ඨවාචාර්යයන් වහන්සේ ඉසින් දක්වනලදි. "බොධිවුච්චති චතූසු මග්ගෙසු ඤාණන්ති එත්ථ ඒකාඤාණං බොධීති වුත්තං, "පපෙපාති බොධිං වරභූරිමෙධසෝ"ති එත්ථ සබ්බඤ්ඤුතඤාණං, උභයම්පි භගවා එත්ථ පත්තොති රුක්ඛොපි බොධි රුක්ඛොත්වෙව නාමං ලභති අථවා සත්තබොජ්ඣඞ්ගෙ බුජ්ඣතීති භගවා බොධි, තෙන බුජ්ඣනත්තෙන සන්තිස්සිතත්තා සෝ රුක්ඛෝ බොධි රුක්ඛොති නාමං ලභති" යනු සාරත්ථදීපනී ටීකායෙ "බොධිවුච්චති චතූසු මග්ගෙසු ඤාණං" යන මෙහි ඒකාඤාණය බොධි යයි කියනලදි, "පපෙපාති බොධිං වරභූරි මෙධසෝ" යන මෙහි සබ්බඤ්ඤුතඤාණය කියනලදි, භාග්‍යවතුන් වහන්සේ මේ රුක්මූලදී ඒ දෙකටම පැමිණි සේක් යයි රුක්තෙමේද බෝරුක් මයයි නම් ලබයි නොහොත් සපත බොධ්‍යඞ්ගයන් අවබොධ කෙළේ යයි භාග්‍යවතුන් වහන්සේ බොධිනම්, අවබොධකරන්නාවූ උන්වහන්සේ හා සන්නිශ්‍රිතභාවයෙන් ඒ රුක් තෙමේ බෝරුක් යයි නම්ලැබී) අභිසම්බුද්ධෝ, සම්‍යක්සම්බුද්ධවූයේම්; පඨමං, සිඟිල්ලට පලමුවම; (පඨමං අභිසම්බුද්ධෝ, අභිසම්බුද්ධෝ හුත්වා සබ්බපඨමං යෙවාති අත්ථෝ යනු අට්ඨවාසි). විහරති, වැඩවාසය කරවදරනසේක; අථඛෝ, එකල්හි; නොහොත් ඉක්බිති; ("අථාති තස්මිං සමයෙති එවමත්ථෝ ගහෙතබ්බෝ අනෙකාත්ථතානිපාතානං, යස්මිං සමයෙ අභිසම්බුද්ධෝ හුත්වා බොධිරුක්ඛමූලෙ විහරති තස්මිං සමයෙති අත්ථෝ, තෙනෙව උදානපාළියං තෙන ඛොපන සමයෙන භගවා සත්තාහං එකපල්ලඞ්කෙන නිසින්නෝ හොති විමුත්තිසුඛං පටිසංවෙදීති වුත්තං, අථාතිවා පච්ඡාති ඉමස්මිං අත්ථෙ නිපාතෝ, තස්මා අභිසම්බොධිතෝ පච්ඡාති එවමත්ථෝ ගහෙතබ්බෝ, ඛොති පදපූරණෙ නිපාතෝ" යනු සාරත්ථදීපනී ටීකායෙ, අථ යනු ඒ කාලයෙහි යයි මේ ආකාරයෙන් අර්ථයතෙම ගතයුත්තේය නිපාතශබ්ද අනෙකාර්ථ හෙයිනි, යම්කලෙක සම්මාසම්බුදුවී බෝරුක්මුල් අසල වැඩවසූ සේක්ද එකල්හිය යන අර්ථයි එබැවින්ම උදානපාළියෙහිදී "තෙන ඛෝ —පෙ— පටිසංවෙදී" යනු වදරනලද්දේය, නොහොත් අථ යනු පසුවය යන මේ අර්ථයෙහි නිපාත යෙකි, එබැවින් සම්‍යක්සම්බොධිය කෙරෙන් පසුව යයි මේ ආකාර යෙන් අර්ථයතෙම ගතයුත්තේය, ඛෝ යනු පදපූරණාර්ථයෙහි නිපාත යයි) භගවා, භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ; බොධිරුක්ඛමූලෙ, බොධිවෘක්ෂමූල සමීපයෙහි; සත්තාහං, සතියක්තුළ; විමුත්තිසුඛං, ඵල සමාපත්ති සැපය; (තදඞ්ග වික්ඛම්භන සමුච්ඡෙද පටිප්පස්සද්ධි නිස්සරණ යන පඤ්ච විමුත්තීන් අතුරෙන් පටිප්පස්සද්ධි විමුත්ති සංඛ්‍යාත භාග්‍ය වතුන් වහන්සේගේ ඵලවිමුක්තිසුඛෝ මෝ කාමතිවත ලද්දී යයි "විමුත්ති සුඛං, ඵලසමාපත්තිසුඛං පටිසංවෙදයමානෝ" යි අට්ඨවාසයෙහි කියේය, විමුත්ති යනුද පඤ්චනීවරණයන් කෙරෙන් පටිප්පස්සද්ධි විමුත්තියගේ

අනුලොමපටිලොමං මනසාකාසි— අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමරූපං, නාමරූපපච්චයා සළායතනං, සළායතනපච්චයා ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනා

විෂයෙන් චිත්තයාගේ මිදීම්බවවේ, සිතම හෝ එසේ මිදීම දනයුතු, ඒ මිදිම හා ගටගත්තාවූ හෝ සම්ප්‍රයුක්තවූ සැපය විඳුතති සැපයවේ, "යායං භන්තෙ උපෙක්ඛා සන්තෙ සුඛෙ වුත්තා භගවතා" යනු කි හෙයින් මෙහි උපෙක්ෂා තොමෝද සැපම යයි දනයුතු. ඒ එසේමය, සමෙමාහවිනොදනියෙහි "උපෙක්ඛාපන සංතත්තා සුඛම්වේවම භාසිතා" යි කියනලදි. භාග්‍යවතුන් වහන්සේ චතුර්ථ්‍යානිකවූ රහත්පල සමවතට සමවදින සේක අනික් සමවතහට සමනොවදින සේක නොහොත් "තෙසංවුප සමොසුඛො" යනාදි තන්හි යම්සේ සංඝාර දුඃඛයන්ගේ ව්‍යපසමනය සැපයයි නියනු ලැබේද, එසේ සියලු කෙලෙස් දුක් සන්සිඳවීම බැවින් අග්‍ර ඵලයෙහි ලබන්නාවූ පරිප්පස්සඩි විඳුතති තොමෝම මෙහි සැපයයි දතයුත්තිය.) පටිසංවෙදි, විදිනසේක්; එන පලලඛෙකන, එක පය්‍යඞ්කයෙන්; නිසිදි, වැඩඋන්සේක; (සකිමපිඅනුඛ භිත්වා යථා ආභුජිතෙන එකෙනෙව පලලඛෙකන යනු අටුවා බැවින් එකවරකුදු නොනැඟිට බෝසත්කලැ විදුරජුන් මතුයෙහි වැඩහුන් පරිදි වෙනස් නොකොට වැඩහුන්සේක යන අර්ථයි.) අථඛො, ඉක්බිති; භගවා, භාග්‍යවත්තෙම; රත්තියා, රාත්‍රියගේ; (අවයැව සම්බන්ධියෙහි සාම්වචනයි) පඨමංයාමං, ප්‍රථමයාමය මුළුල්ලෙහි; (අත්‍යන්ත සංයොගයෙහි දුතියා බැවින් එදවස් රැපිළිබඳ සකල ප්‍රථමයාමයෙහිම භාග්‍යවතුන් වහන්සේ ප්‍රතීත්‍ය සමුත්පාද මනසිකාරයෙන් යුතුවූ සේකැයි ප්‍රකාශ කෙරේ) පටිවචසමුපපාදං, ප්‍රත්‍යයාකාරය; (ඔවුනොවුන්නිසා එක්වූ ධර්මයන් ඉපදවීමය යන අර්ථයි) අනුලොම පටිලොමං, අනුලොම ප්‍රතිලොමය; මනසි, සිත්හි; අකාසි, කළසේක; අවිජ්ජාපච්චයා, (අවිඤ්ඤං කායදුච්චරිතාදිං විඳනතීති අවිජ්ජා— නොවින්දයුතු කායදුශ්චරිතාදිය විඳීනුයි අවිද්‍යා නම් යනාදීන් කියනලද) අවිද්‍යා ප්‍රත්‍යයෙන්; සඞ්ඛාරා, සංස්කාරයෝ වෙත්; (සංඛරොනතීති සංඛාරා මනාකොට රැස්කෙරෙත් නුයි සංස්කාරයෝ නම් වෙති ලෞකික කුශලා කුශල චෙතනාවෝයි, ඔව්හු පුණ්‍යාභිසංස්කාර අපුණ්‍යාභිසංස්කාර ආනෙඤ්ජාභි සංස්කාර යන්ගේ වශයෙන් ත්‍රිවිධවේ) සංඛාරපච්චයා, සංස්කාර ප්‍රත්‍යයෙන්; විඤ්ඤාණං, ප්‍රතිසන්ධි විඥානය හෙවත් ප්‍රතිසන්ධි වශයෙන් එකුන්විසි වැදෑරුම්වූ ප්‍රවෘත්තිවශයෙන් දෙතිස් වැදෑරුම්වූ විපාක විඤ්ඤාණයේවේ; විඤ්ඤාණපච්චයා, (යථොකත) විඤ්ඤාණ ප්‍රත්‍යයෙන්; නාමරූපං, නාමය හා රූපයවේ; (වෙදනාදිසඤ්ඣිත්‍රය නාමය නම්, භූත රූපද වඤ්ඣු ආදි උපාදු රූපද රූප නම්) නාමරූපපච්චයා, නාම රූප ප්‍රත්‍යයෙන්; සළායතනං (චක්ඛු සොත ඝාන ජිවහා කාය මන ඉන) ෂඩායතනයවේ; සළායතනපච්චයා, ෂඩායතන ප්‍රත්‍යයෙන්; ඵස්සො, (චක්ඛු සොත ඝාන ජිවහා කාය මන ඵස්ස) ෂඩ්විධ ස්පර්ශයවේ; ඵස්සපච්චයා, ස්පර්ශ ප්‍රත්‍යයෙන්; වෙදනා, (චක්ඛුසම්ඵස්සජාදින්ගේ වශයෙන් ෂඩ්විධවූ හෝ

පච්චයා තණ්හා, තණ්හාපච්චයා උපාදානං, උපාදානපච්චයා භවෝ, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරා මරණ සොක පරිදෙව දුක්ඛදෝම නයසුපායාසා සම්භවන්ති, එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයෝ හොති, අවිජ්ජායත්වේව අසෙසවිරාගනිරෝධා සඞ්ඛාරනිරෝධෝ, සඞ්ඛාරනිරෝධා විඤ්ඤාණනිරෝධෝ, විඤ්ඤාණනිරෝධා නාමරූපනිරෝධෝ, නාමරූපනිරෝධා සළායතනනිරෝධෝ, සළායතනනිරෝධා ඵස්ස නිරෝධෝ, ඵස්සනිරෝධා වෙදනානිරෝධෝ, වෙදනානිරෝධා තණ්හා නිරෝධෝ, තණ්හානිරෝධා උපාදානනිරෝධෝ, උපාදානනිරෝධා භව

නොහොත් සුඛ දුක්ඛ උපෙක්ඛා විශයෙන් ත්‍රිවිධවූ) වෙදනාතොමෝ වන්නීය; වෙදනාපච්චයා, වෙදනා ප්‍රත්‍යයෙන්: තණ්හා, (කාමතණ්හා භවතණ්හා විභවතණ්හා යයි සංක්ෂේපවශයෙන් ත්‍රිවිධවූ විස්තර හෙයින් එක්සිය අට් ප්‍රභෙදවූ) තෘෂ්ණා තොමෝ වන්නීය; තණ්හා පච්චයා, තෘෂ්ණා ප්‍රත්‍යයෙන්: උපාදානං, (කුමහිරග්‍රාහයක්මෙන් අරමුණු දැඩි කොට ගැනීම් ලක්ෂණවූ කාමුපාදානාදීන්ගේ වශයෙන් චතුර්විධවූ උපාදානයවේ; උපාදානපච්චයා, උපාදාන ප්‍රත්‍යයෙන්; භවෝ, (පුණ්‍යාභි සංස්කාර අපුණ්‍යාභිසංස්කාරාදීන්ගේ වශයෙන් එකුන්තිස් වැදෑරුම්වූ) කර්මභවයද (කාමභවය යනාදි වශයෙන් නවවිධවූ) උපපත්තිභවයදවේ; භවපච්චයා, (මේ මිවිධවූ භවයන් අතුරෙන්) කර්මභව ප්‍රත්‍යයෙන්; ජාති (ඒ ඒ භවයෙහි සත්ත්වයන්ගේ පහළවීම් සංඛ්‍යාත) සඤ්ඤාතතන්ති තොමෝ වන්නීය; ජාතිපච්චයා, ජාතිප්‍රත්‍යයෙන්; ජරා මරණ සොක පරිදෙව දුක්ඛ දෙමනස්ස පායාසා,- ජරා, සත්ත්වයන්ගේ මිහිකිරීම් සංඛ්‍යාතවූ) ජරාවද; මරණ, (සත්ත්වයන්ගේ බිඳීම් සංඛ්‍යාත) මරණයද; සොක, (මට යමක් පළමුවිද ඒ මට දැන් නැතිවිය යි ඇතුළත සිතීම් වශයෙන් උපදනාවූ) සොකයද; පරිදෙව, හඬනිශ්‍රිත ආලාපයයි කියන ලද) පරිදෙවයද; දුක්ඛ, කායික දුඃඛයද; දෙමනස්ස, (සිත පෙළීම් ලක්ෂණ ඇති) දෙමනසද; උපායාසා, දැඩි ආයාසයද යන මොහු; සම්භවන්ති, දෙන්; එවං, මෙසේ; එතස්ස, මේ කියනලද්දාවූ; කෙවලස්ස, අසංමිශ්‍රවූ නොහොත් සියලු; දුක්ඛක්ඛන්ධස්ස, දුක්ඛරාශියේ; සමුදයෝ හොති, හටගැනීමවේ.

අවිජ්ජායත්වේව, අවිද්‍යාවේමේ වතාහි; අසෙසවිරාගනිරෝධා, නිරවශෙෂ නිරෝධයෙන්; සංඛාරනිරෝධෝ, සකල සංස්කාරයන්ගේ අනුපපාද නිරෝධයවේ; සංඛාරනිරෝධා, සංස්කාරයන්ගේ නිරෝධ හෙතුවෙන්; විඤ්ඤාණනිරෝධෝ, ප්‍රතිසන්ධිවිඤ්ඤාණයන්ගේ නිරෝධයවේ; විඤ්ඤාණනිරෝධා, ප්‍රතිසන්ධි විඤ්ඤාණයන්ගේ නිරෝධ හෙතුවෙන්; නාමරූප නිරෝධෝ, නාමරූපයන්ගේ නිරෝධයවේ; නාමරූප නිරෝධා, නාමරූපයන්ගේ නිරෝධ හෙතුවෙන්; සළායතන නිරෝධෝ, ෂඩායතනයන්ගේ නිරෝධයවේ; සළායතන නිරෝධා, ෂඩායතනයන්ගේ නිරෝධ හෙතුවෙන්; ඵස්ස නිරෝධෝ, ස්පර්ශයාගේ නිරෝධයවේ; ඵස්ස නිරෝධා, ස්පර්ශයාගේ නිරෝධ හෙතුවෙන්; වෙදනා නිරෝධෝ, වෙදනාවන්ගේ නිරෝධයවේ;

නිරෝධෝ, භවනිරෝධා ජාතිනිරෝධෝ, ජාතිනිරෝධා ජරා මරණ සෝක පරිදෙව දුක්ඛදෝමනස්සූපායාසා නිරුජ්ඣන්ති, එවමෙතස්ස කේවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරෝධෝ හොතීති. අථඛෝ භගවා එත මත්ථං විදිත්වා තායං වේලායං ඉමං උදානං උදානෙසි.

යදා හවේ පාතු භවන්ති ධම්මා
ආතාපිනෝ ඣායතෝ බ්‍රාහ්මණස්ස
අථස්ස කඞ්ඛා වපයන්ති සබ්බා
යතෝ පජානාති සහෙතු ධම්මන්ති.

වේදනා නිරෝධා, වේදනාවන්ගේ නිරුද්ධ හෙතුවෙන්; තණ්හා නිරෝධෝ, තෘෂ්ණාවගේ නිරුද්ධයවේ; තණ්හා නිරෝධා. තෘෂ්ණාවගේ නිරෝධ හෙතුවෙන්; උපාදාන නිරෝධෝ, උපාදානයන්ගේ නිරුද්ධයවේ; උපාදාන නිරෝධා, උපාදානයන්ගේ නිරෝධ හෙතුවෙන්; භව නිරෝධෝ භවයාගේ නිරෝධයවේ; භව නිරෝධා, භවයාගේ නිරෝධ හෙතුවෙන්; ජාති නිරෝධෝ, ජාතිහුගේ නිරුද්ධයවේ; ජාති නිරෝධා, ජාතිහුගේ නිරෝධ හෙතුවෙන්; ජරා මරණ සෝක පරිදෙව දුක්ඛ දෝමනස්සූපායාසා, ජරාවය මරණය සෝකය පරිදෙවය දුඃඛය දෝමනස්සය උපායාසය යන මොහු; නිරුජ්ඣන්ති, නිරුද්ධවෙත්; එවං, මෙසේ; එතස්ස, මේ කියනලද්දාවූ; කේවලස්ස, සියලුම; දුක්ඛක්ඛන්ධස්ස, දුක්ඛස්කන්ධයාගේ; නිරෝධෝ හොති ඉති, නිරෝධය වේයයි; (මේසේ භාග්‍යවතුන් වහන්සේ අනුලෝම ප්‍රතිලෝම වශයෙන් මෙනෙහි කළසේක.) අථඛෝ, ඉක්බිති; භගවා, භාග්‍යවතුන් වහන්සේ; එතං අත්ථං, මේ කාරණය; විදිත්වා, දැන; තායං වේලායං, ඒ වෙලායෙහි; ඉමං උදානං, මේ ප්‍රීතිවාක්‍යය; උදානෙසි, පහළකළසේක.

භවේ, එකාන්තයෙන්; යදා, යම් කලෙක්හි; (නොහොත්) යදාභවේ, යම් කෙලෙස යුද්ධයෙක්හි; (යදාභවෙති එත්ථභවෙති බ්‍යත්තනන්ති ඉමස්මිං අත්ථේ නිපාතෝ, කෙවිපන භවේති ආභවේ යුද්ධෙති අත්ථං වදන්ති යනු ටීකායි) ආතාපිනෝ, කෙලෙස්තවන වීර්‍යඇත්තාවූ; ඣායිනෝ, ආරම්මණූපනිධ්‍යාන ලක්ෂණූපනිධ්‍යානයන් සවභාවකොට ඇති ධ්‍යානයෙන්) ධ්‍යානකරන්නාවූ; බ්‍රාහ්මණස්ස, දුරුකරතලද පවිඇති ක්ෂීණාශ්‍රවයන් වහන්සේහට; ධම්මා, අනුලෝම ප්‍රත්‍යයාකාර ප්‍රතිවේධ සාධකවූ බොධිපාක්ෂික ධර්මයෝ; නොහොත් චතුරාර්‍යසත්‍ය ධර්මයෝ; පාතුභවන්ති, පහළවෙත්ද; අථ, එකල්හි; නොහොත් ඉක්බිති; අස්ස, මේ රහත්හුගේ; සබ්බාකඞ්ඛා, සියලු සැකයෝ; වපයන්ති, දුරුවෙත්; (කෙසේද) යතෝ, යම් හෙයකින්; සහෙතු ධම්මං, අවිද්‍යාදිවූ හෙතුවෙන් සහෙතුකවූ මේ සංස්කාරාදිවූ සකල දුඃඛඝාතක ධර්මයන්; (අවිජ්ජාදිසෙන හෙතුනා සහෙතුකං ඉමං සංඛාරාදිං කෙවලං දුක්ඛක්ඛන්ධධම්මං යනු අට්ඨවාසි) පජානාති, දනීද; අවබොධ කෙරේද; එහෙයිනි.

අථඛෝ භගවා රත්තියා මජ්ඣිමං යාමං පටිච්චසමුප්පාදං අනුලෝම පටිලෝමං මනසාකාසි- අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමරූපං, නාමරූපපච්චයා සළායතනං —පෙ— එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයෝ හොති —පෙ— නිරෝධෝ හොතීති. අථඛෝ භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි.

යදා හවෙ පාතු භවන්ති ධම්මා
ආතාපිනෝ ඣායතෝ බ්‍රාහ්මණස්ස
අථස්ස කඞ්ඛා වපයන්ති සබ්බා
යතෝ ඛයං පච්චයානං අවෙදි.

අථඛෝ භගවා රත්තියා පච්ඡිමං යාමං පටිච්චසමුප්පාදං අනුලෝම පටිලෝමං මනසාකාසි— අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං —පෙ— එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයෝ හොති —පෙ— නිරෝධෝ හොතීති. අථඛෝ භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි.

යදා හවෙ පාතු භවන්ති ධම්මා
ආතාපිනෝ ඣායතෝ බ්‍රාහ්මණස්ස
විධූපයං තිට්ඨති මාරසෙනං
සූරියොව ඔභාසය මන්තලික්ඛන්ති.

බොධිඤ්ඤා නිඞ්ඨිතා.

අථඛෝ, ඉක්බිති; භගවා, භාග්‍යවතුන් වහන්සේ; රත්තියා, රැපිළි බඳ; මජ්ඣිමංයාමං, මැදයම මුළුල්ලෙහි; පටිච්චසමුප්පාදං —පෙ— උදානං උදානෙසි, (පළමු කී සේ අර්ථ දතයුතු.)

පළමු ගාථාවට කී සේ මෙහිදු අරුත් බිණිඅයුතු, ඊට වෙනස්වූ සතරවෙනි පාදයට අර්ථ දක්වනු ලැබේ. යතෝ, යම් හෙයකින්; පච්චයානං, (අවිද්‍යාදි) ප්‍රත්‍යයන්ගේ; ඛයං, ක්ෂයකිරීම් සංඛ්‍යාත නිර්වාණය; අවෙදි, අවබොධකළ සේක්ද; එනෙහිනි.

අථඛෝ, ඉක්බිති; භගවා, භාග්‍යවතුන් වහන්සේ; රත්තියා, රැපිළි බඳ; පච්ඡිමංයාමං, පශ්චිමයාමය මුළුල්ලෙහි; පටිච්චසමුප්පාදං —පෙ— උදානං උදානෙසි, (පළමු කී සේ අර්ථ දතයුතු.)

මීටද පළමු ගාථාවට කී සේ අර්ථ දතයුතු, ඊට වෙනස්වූ තුන්වෙනි සතරවෙනි පාදවලට පමණක් අර්ථ දක්වනු ලැබේ. (තදා, එකල්හි; ඒ ක්ෂීණාශ්‍රව බ්‍රාහ්මණතෙම උපන්නාවූ ඒ බොධිපාක්ෂික ධර්මයන්හෙන් හෝ යම් ආර්‍යමාර්ගඵලට වතුරාර්‍යසත්‍ය ධර්මයෝ පහළවූවාහුද ඒ ආර්‍ය මාර්ගයෙන්) මාරසෙනං, ("කාමා තෙ පඨමා සෙනා" ආදීන් කියනලද පරිදිවූ) මරසෙනාව; (කෙලෙස්සමූහය) විධූපයං, නසමින්; තිට්ඨති, පවතී;

අථඛෝ භගවා සත්තාහස්ස අච්චයෙන තම්හා සමාධිම්හා වුට්ඨහිත්වා බොධිරුක්ඛමූලා යෙන අජපාලනිග්‍රොධෝ තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා අජපාලනිග්‍රොධමූලෙ සත්තාහං එකපල්ලඞ්කෙන නිසීදි විමුත්තිසුඛ පටිසංවෙදී. අථඛෝ අඤ්ඤතරෝ හුහුඞ්කජාතිකෝ බ්‍රාහ්මණෝ යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මෝදි, සම්මෝදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං අට්ඨාසි, එකමන්තං ඨිතො ඛෝ සො බ්‍රාහ්මණෝ භගවන්තං එතදවොච, කිත්තාවතා නුඛෝ භො ගොතම බ්‍රාහ්මණෝ හොති, කතමෙ චපන බ්‍රාහ්මණකරණා ධම්මාති– අථඛෝ භගවා එතමත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි

සෙසේද? අන්‍යාලිකඛං, අඝස; ඔනාසයං, බබ්‍රුඑවන්නාවූ; සුරියොඉව, හිරුමෙනි. (මෙහි පළමුවෙනි උදානය ප්‍රතීත්‍යධර්මයන් ප්‍රත්‍යවෙක්ෂා වශයෙනි දෙවෙනි උදානය නිවන්පසක් කිරීම් වශයෙනි තුන්වෙනි උදානය මාගීය ප්‍රත්‍යවෙක්ෂා කිරීම් වශයෙනි)

බොධිඝථාකොමෝ නිවනලදි.

අථඛෝ, ඉක්බිති; භගවා, භගවත් බුදුරජාණෝ; සත්තාහස්ස අවසෙසා, සතියක් ඇවැමෙන්; තම්හා සමාධිම්හා, ඒ පල සමවත කෙරෙන්; වුට්ඨහිත්වා, නැගීසිට; බොධිරුක්ඛමූලා, බෝරුක්මූල කෙරෙන්; අජපාල නිග්‍රොධෝ, අජපල් නුගරුක් තෙම; යෙන, යම් තැනෙක්හිද; තෙන, එතන්හි; උපසඞ්කමි, එළඹියේක; උපසඞ්කමිත්වා, එළඹ; අජපාල නිග්‍රොධමූලෙ, අජපල් නුගරුක්මුල; සත්තාහං, සතියක්තුළ; විමුත්ති සුඛපටිසංවෙදී, පලසමවත්සුව විඳිනසේක්; එකපල්ලඞ්කෙන, එකපයීඞ්කයෙන්; නිසීදි, වැඩඋන්සේක; අථඛෝ, ඉක්බිති; හුහුඞ්කජාතිකෝ, හුහුඞ්ක සවභාව ඇති; අඤ්ඤතරෝ බ්‍රාහ්මණෝ, එක්තරා බමුණෙක්; භගවා, භාග්‍යවතුන් වහන්සේ; යෙන, යම් තැනෙක්හිද; තෙන, එතන්හි; උපසඞ්කමි, එළඹියේඇ; උපසඞ්කමිත්වා, එළඹ; භගවතා සද්ධිං, භාග්‍යවතුන් වහන්සේ හා; සම්මොදි, සතුටුවූයේය; සම්මෝදනීයං, සතුටුවිය යුතුවූ; සාරාණීයං, සිහිකටයුතුවූ; කථං, කථාව; වීතිසාරෙත්වා, කොටනිමවා; එකමන්තං අට්ඨාසි, එකත්පසෙක සිටියේය; එකමන්තං, එකත්පසෙක; ඨිතොඛෝ, සිටියාවූ; සෝ බ්‍රාහ්මණෝ, ඒ බමුණුතෙම; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; එතං, මේ වදන්; අවොච, සැලසෙළේය; භොගොතම, භවත් ගෞතමයන් වහන්ස; කිත්තාවතා නුඛෝ, කෙපමණකින්; (කෙතෙක් ධර්මයන්ගෙන්) බ්‍රාහ්මණෝ හොති, බමුණුවේද; බ්‍රාහ්මණකරණා, බමුණන් කරන්නාවූ; ධම්මා, සවභාවයෝ; කතමෙචපනත්ථකි, කවරහුදැයි; අථඛෝ, එකල; භගවා, භාග්‍යවතුන් වහන්සේ; එතං අත්ථං, මේ කරුණ; විදිත්වා, දැන; තායං වෙලායං, ඒ වෙලාවෙහි; ඉමං උදානං, මෙ ප්‍රීතිවාක්‍යය; උදානෙසි, ප්‍රකාශ කළසේක.

(භගවත් බුදුරජාණන් වහන්සේ ඒපලසමංකින් නැගිසිට අනතුරු වම බෝරුක්මුල කෙරෙන් අජපල්නුගරුකතරු තොවැඩසේත යම්සේ විළඳ සැතපේ යයි කීතල වැළඳීමෙන් පසුව සැතපීම ඔදුවී යයි ප්‍රකාශ කළ පමණවූත් අත්මුව තොසෝදා යහනවෙත නොපැමිණ අන්කිසි කතාබහක් නොකොට සැතපේම යයි නොකියනලද්දේ වේද? එසේම මෙහිදු ඒ සෘවතින් නැගී සිට අනතුරුවම වැඩසේකැයි නොකියන ලද්දේවේ සමවතින් නැගිසිටි පසු වැඩසේකැයි මෙයම මෙහිදී දක්වන ලද්දේය, අනතුරුව නොවැඩ භාග්‍යවතුන් වහන්සේ කුමක් කළ සේක්දයත්? අතිකුදු සතිතුණක් බෝමුල අසලම කල්ගැවූසේක, මෝ තොමෝ එහි පිළිවෙළ කථාවන්නිය; භාග්‍යවතුන් වහන්සේ බුදුබැව් පැමිණ සතියක් මුළුල්ලෙහි එකපයින්ඬකයෙන් වැඩහුන්කල හගවත් තෙමේ විදුරස්තෙන් නැගී නොසිටිනසේක, කිමෙක්ද? අතිකුදු බුදු බැව්කරන ධම්මෝ දේත්දූයි කිසි දෙවිතෙණෙකුන්හට සැකයක් උපති ඉක්බිති බුදුරජාණෝ අටවෙනි දිනයෙහි සමවතින් නැගී සිට දෙවි යන්ගේ සැකය දුන වදරා සැක දුරලනු පිණිස අහසට පැනනැගී යමා මහ පෙළහරදක්වා ඒ දෙවියන්ගේ සැකය දුරලා විදුරස්තෙන් මඳක් තැගෙනහිරට බරවූ උතුරුදිග වැඩසිට සරුසැකිකප්පුවහස් මුළුල්ලෙහි රැස්කරනලද පාරමී ධම්මයන්ගේ ප්‍රයෝජන සිඳියට කරුණුවූ විදුරස්න හා බෝරුක අනිමිසවූ ඇස්වලින් යුකතව බලනසේක් සතියක් මුළුල් ලෙහි කල්ගැවූසේක ඒ ඉඩම අනිමිසවෙතිය නම්වී, ඉක්බිති විදුරස් තට හා වැඩසිටි සථානය අතුරෙහි පෙරදිග සක්වළමුවවිට පටන් පසු දිගසක්වළමුවවිට දක්වා දික්වූ රුවන්සක්මනෙහි සතියක් කල්ගැවූ සේක, ඒ ඉඩම රතනවඩ්ක්‍රමණ චෛත්‍යනම් වී, ඒ රතනවඩ්ක්‍රමණය කෙරෙන් පසුදිග්හි දෙවියෝ රුවන්ගෙයක් මැවූහ සිව්වෙනි සතියෙහි ඒ රුවන්ගෙයි පලක්බැඳ වැඩහිද විජම්පිටකෘද විශෙෂ වශයෙන් අන නතනය සමනතපඨානය විමසමින් සතියක් කල්ගැවූසේක, ඒ ඉඩම රතනඝර චෛත්‍යනම් වී, මෙසේ බෝරුක් අසලම සිව්සතියක් කල්යවා පස්වෙනි සතියෙහි බෝරුක් කෙරෙන් අජපාල නුගරුක්තෙමේ යම් තැනකවිද එහි වැඩසේක, අජපාලයෝ අනවරතයෙන් පැමිණ යම් නයග්‍රොධයක් පිළිබඳ සෙවනෙහි හිඳිත්ද එබැවින් ඒ රුකට අජපාල නයග්‍රොධ යයි නම්වී, මේ රුක වනාහී බොධිය කෙරෙන් පූජිදිශාභාග යෙහි පිහිටියේවේ, මෙසේ භාග්‍යවතුන් වහන්සේ මේ රුක්මුල වැඩහුන් කල නම්ගොත් වශයෙන් ප්‍රකටනොවූ එක් බමුණෙක් පැමිණ උන් වහන්සේගෙන් පැන පිළිවිසි, එබැවින් "අථඛෝ අඤඤතරෝ" යනාදිය කියනලදී. නෙසේනම් මේ බමුණුතෙම එකෙණෙහි පැමිණ භාග්‍යවතුන් වහන්සේගේ ගොත්‍රය දත්තේදයත්? හෙතෙම එකෙණෙහි පැමිණි යෙක් නොවේ, සයඅවුරුද්දක් ප්‍රදන් විචාරීවබනකල උපසථායක පස් වග මහණුන් හා වසන්නාවූද ඉන්පසුකල ඒ ව්‍රතය හැරදමා උරුවෙල් දනවියෙහි සෙනානම් නියම්ගම තනිව වෙසෙමින් පිඬුසිඟා වඩනාවූද

යො බ්‍රාහ්මණෝ බාහිතපාපධම්මෝ
නිහුහුංකකෝ නික්කසාවෝ යතත්තෝ
වේදන්තගූ වුසිතබ්‍රහ්මචරියෝ
ධම්මේන සෝ බ්‍රහ්මවාදං වදෙය්‍ය
යස්සුස්සදා නත්ථි කුහිඤ්චි ලෝකෙ'ති.

අජපාලකථා නිට්ඨිතා.

අථඛෝ භගවා සත්තාහස්ස අච්චයෙන තම්හා සමාධිම්හා වුට්ඨහිත්වා අජපාලනිග්‍රොධමූලා යෙන මුචලින්දෝ තෙනුපසංකමි, උපසංකමිත්වා මුචලින්දමූලෙ සත්තාහං එකපල්ලඞ්කෙන නිසීදි විමුත්තිසුඛපටිසංවෙදී

භගවත් බුදුරජ තෙම ඒ බවුණු විසින් දැන කතාතරන ලද්දේය, එබැවින් ඒ බමුණු තෙම පෙර පස්වග මහණුන් විසින් කියනු ලබන්නාවූ භාග්‍යවත් වූ බුදුරදුන්ගේ ගොත්‍රය සිහිකෙරෙමින් හෙ ගොතම කියා භගවත්වූ බුදුරදුන්ට ගොත්‍රයෙන් ඇමතුයේය; වැලිදු භගවත් බුදුරජාණන් වහන්සේ යම් දිනක පටන් මහබිනික්මන් කොට අනොමා නම් ගංතෙරදී පැවිදිවූසේක්ද එවක්පටන් සමණෝ ගොතමෝ කියා සඳ හිරුමෙන් ප්‍රකටවී.)

යෝ, යමෙක්; බාහිතපාපධම්මෝ, බැහැරකරනලද පාපධර්මයන් ඇත්තාවූ; නිහුහුංකකෝ, හුහුංකාරයන්ගේ ප්‍රහාණයෙන් නිහුහුංකවූ; නික්කසාවෝ, රාගාදිකසටතැත්තාවූ; යතත්තෝ, භාවනායෙහි එක්වන් යෙදුනු බැවින් හෝ සීලසංවරයෙන් සඤ්ඤත සිත්ඇති බැවින් හෝ සංයමවූ ආත්මඇති; වෙදන්තගූ, චතුර්මාගී ඥානසංඛ්‍යාත වෙදවලින් හෝ වෙදයන්ගේ කෙළවරට පැමිණි බැවින් වෙදන්තගූනම්වූ; වුසිත බ්‍රහ්මචරියෝ, වැසනිමවනලද මාගී බ්‍රහ්මචරියා ඇති; බ්‍රාහ්මණෝ, ක්ෂීණාශ්‍රව බ්‍රාහ්මණවේද; යස්ස, යමෙකුගට, ලොකෙ, ලෙව්හි; කුහිඤ්චි, එකාරම්මණෙක්හිදු; උස්සදා, (රාගුස්සද දෙසුස්සද මොහුස්සද මානුස්සද දිට්ඨුස්සද යන) උස්සදයෝ; නත්ථි, නැත්තාහුද; සෝ, ඒ පුද්ගලතෙම; බ්‍රහ්මවාදං, බම බ්‍රාහ්මවෙමි යන මේ කිම; වදෙය්‍ය, (ධර්මයෙන් කියන්නේය.

මේගහින් උදන්වැනු පමණවූත් ඒ බවුණුහට දහම් කොදෙසුසේක කුමක්හෙයිනයත් සිව්සස්දහම් පිළිවිදීමට නුසුදුසුබැවිනි, ඒ එසේමය, මේ උදම්කතා අසා ඒ බවුණුහට නිවන්දහම් පසක් නොවීය, එසේම උපකානම් ආජීවකයාහටද බුදුගුණවැනුම් අසා නිවන්සාත් නොවීය. දම්සක් පැවැත්වීමෙන් පෙර බුදුරදුන් විසින් වදරනු ලැබුවක් ඇසූ සත්නට තපස්සු-භල්ලික වෙළඳුන්හට සරණදීමමෙන් වාසනාභාගියමමුත් අසෙඛභාගිය හෝ නිබ්බෙධභාගිය නුවූයේය, මෝ වනාහි ධර්මතාවකි.

අජපාලකථානොමෝ නිමවිය.

තෙනඛොපන සමයෙන මහාඅකාලමෙඝො උදපාදි සත්තාහවද්දලිකා සිතවාතදුද්දිනි, අථඛො මුචලින්දෙ නාගරාජා සකභවනා නික්ඛමිත්වා භගවතො කායං සත්තඛත්තුං භොගෙහි පරික්ඛිපිත්වා උපරිමුඛනි මහන්තං ඵණං කරිත්වා අඨාසි- මා භගවන්තං සිතං, මා භගවන්තං උණ්හං, මා භගවන්තං ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සොති. අථ ඛො මුචලින්දෙ නාගරාජා සත්තාහස්ස අච්චයෙන විඩං විගතවලාහකං දෙවං විදිත්වා භගවතො කායා හොගෙ විනිවෙඨෙත්වා සකවණ්ණං පටිසංහරිත්වා මාණවකවණ්ණං අභිනිම්මිනිත්වා භගවතො පුරතො අඨාසි පඤ්ජලිකො භගවන්තං නමස්සමානො, අථඛො භගවා එත මත්ථං විදිත්වා තායං වෙලායං ඉමං උදානං උදානෙසි.

(අථඛො —පෙ— විමුත්තිසුඛපටිසංවෙදි මිට 7 පිටේ 15 පෙල පටන් බලනු ඊට වෙනස්වූ වචනදෙකට මෙසේ දතයුතු. අජපාලනිග්‍රොධමූලා, අජපල්නුගරුක කොරෙන්; මුචලින්දෙ, මිදෙල්රුක්තෙම්;) තෙනඛොපන සමයෙන, එසමයෙහි; සත්තාහවද්දලිකා, සතියක් නොකඩව පවත්නා වැසිඇති; සිතවාතදුද්දිනි, දියඹිඳු ඇසුරුකළ සුලන් හා වැලලිදිනඇති; මහාඅකාලමෙඝො, මහත් නොකල් වැස්සෙක්; උදපාදි, පහළවි; (වස්සාන සෘතුව නොපැමිණිකල හටගත් මෙඝය අකාලමෙඝ නම්; මේ මෙඝය වසාහි ගිම්හානයාගේ පශ්චිම මාසයෙහි ඇතිවිය.) අථඛො, ඉක්බිති; මුචලින්දෙ නාගරාජා, මුචලින්දනම් නාරජ තෙමේ; සකභවනා, සිය විම නින්; නික්ඛමිත්වා, නික්මී; භගවතො, භාග්‍යවත් වූ බුදුන්ගේ; කායං, සිරුර; සත්තඛත්තුං, සත්වරක්; භොගෙහි, දරණයන්; පරික්ඛිපිත්වා, භාත්පසින් වටකොටගෙන; උපරිමුඛනි, මුදුනමතුයෙහි; මහන්තං ඵණං, මහත් පෙණයක්; කරිත්වා, කොට; (විදහා) අඨාසි, සිටියේය; භගවන්තං, භාග්‍යවත් වූ බුදුරදුන්ට; සිතං, සිත; මා, නොවේවා; භගවන්තං, භාග්‍ය වත් වූ බුදුරදුන්ට; මාඋණ්හං, උෂ්ණ නොවේවා; භගවන්තං, භාග්‍ය වත් වූ බුදුරදුන්ට; ඩංසමකස වාතාත පසිරිංසපසම්ඵස්සො, ඩැහැලේ බොන මැසිය මදුරුය සුලඟය අවිවය සපීය යන මොවුන්ගේ සපහී යෙක්; මාඉති, නොවේවාසි; අථඛො, ඉක්බිති; මුචලින්දෙ නාගරාජා, මුචලින්දනම් නාරජ තෙම; සත්තාහස්ස අච්චයෙන, සතියහුගේ ඇවැ මෙන්; විඩං, දුරුවූ; විගතවලාහකං, පහවූ වලාපටලඇති; දෙවං, අහස; විදිත්වා, (දැන් අහස දුරුවූ වලාපටල ඇත්තේය භගවත්හට සිතාදි උව දුරෙක් නැතියසි) දැන; භගවතො, බුදුරදුන්ගේ; කායා, සිරුරණකරෙන්; හොගෙ, දරණයන්; විනිවෙඨෙත්වා, ඉවත්කොට; සකවණ්ණං, සිය පැහැය; පටිසංහරිත්වා, අතුරුදහන්කොට; මාණවකවණ්ණං, මානවක වණ්ණයක්; අභිනිම්මිනිත්වා, නිර්මිතකොට; භගවතො, බුදුන්ගේ; පුරතො, ඉදිරියෙන්; පඤ්ජලිකො, ඇදිලිබැඳීම් ඇත්තේ; භගවන්තං, බුදුන්ට; නමස්සමානො, වඳිමින්; අඨාසි, සිටියේය; අථඛො භගවා —පෙ— උදානං උදානෙසි මිට 5 පිටේ 20 පෙල පටන් බලනු.

සුඛෝ විවෙකෝ තුඨස්ස සුතධම්මස්ස පස්සතෝ
අබ්‍යාපජ්ඣං සුඛං ලොකෙ පාණභූතෙසු සංයමෝ.

(මුවලිඳමූලෙති එත්ථ මුවලිඳෙ වුච්චති නීපරුක්ඛෝ යෝ නිච්ඵලෝ කිපි වුච්චති තස්ස සමීපෙති අත්ථෝ, මුවලිඳමූලෙ යත්ත මෙහි මුවලිඳ නම් මිදෙල් (බක්මී) රුක්තෙමෙ කියනුලැබේ. යම් රුකෙක් නිවුලකියාත් කියනුලැබේද ඒ රුක් අසලය යන අර්ථයි සෙවී පන මුවලොති තස්ස රුක්ඛස්ස නාමං, වනජෙට්ඨකතාය පන මුවලිඳෙති වුත්තත්තා වදන්ති. ඇතැම් ඇදුරෝ වනාහි මුවලො යනු ඒ රුකට නම්, වනයට ප්‍රධාන බැවින් මුවලිඳ යනු කියනාලද්දේ යයි කියත්. භගවත් බුදුරජාණෝ සවෙනි සතියෙහි මුවලිඳ විල්තෙර අසල මිදෙල් (බක්මී) රුක්මූල වැඩ හුන්සේක සක්විති රජෙකුගේ හෝ බුදුවරයන් වහන්සේ තමකගේ ලොවපහළවීමෙන් ඇතිවන චාතුර්වීපික මහාමෙඝයෙක් එදවස් පටන් හෙන සතියක් නොකඩව ධාරානිපාතයෙන් වැස්සේ ය, ඒ විලගේ අධෝ භාගයෙහි පිහිටි නාවිමන උපන් මුවලිඳනම් නාරජතෙමේ තම විමනින් නික්ම බුදුන්ගේ සිරුරට වැසි. සුලන් මැසි මදුරුවන්ගෙන් පීඩාතොවන සේ මෙසත්දින රැකගනිමිගි සත්දරණපටකින් බුදුන් වටකොට ගෙන මහත් පෙණයකින් මුදුන්පෙදෙස වසාගෙන සිටියේය. ඒ නාරජ වනාහි දෙවිනාරජෙකු බැවින් සත්රුවණින් පහයක් සද, බුදුන් පුදන්ට තරම් සමතෙක් නමුදු තමකය වෙහෙසීමෙන් බුදුන් පිදීම උතුම්කොට සලකා මෙසේ කෙළේය ඒ නාදරණය තුළ සිව්ඉරියව්වෙන් කැමතිසේ විසීමට සුදුසු පරිදි නිමිතකෙළේනමුදු එහි තුළවූ රුවන් අස්නෙහි වැඩහිඳ ඒ සතිය එක් ඉරියව්වකින්ම ඉක්මෙවිසේක. ඒ නාදරණය ඇතුළත පමණ ලෝවාමහපායෙහි භාණ්ඩාගාරය පමණය යනු සමන්තපාසාදිකායෙහිද යටමාලය පමණවේයයි මැදුම්සඟි අට්ඨකථායෙහිද කියනාලදි. කැමති කැමති ඉරියව්වකින් භගවත් තෙමේ වැඩවසන්නේ යයි නාරජුගේ අදහසම් එසේ හෙයින් මේසා මහත් අවකාසයක් වටකෙළේය. ඒ මැද රුවන්අස්නක් පනවනාලදි උඩ රන්තරුයෙන් විසිතුරුවූ එල්ඛෙන සුවඳදම් හා මල්ඇති රෙදිවියනක් වී සිව්කොණ සුවඳ තෙල්පහන් ඇවිලූ නාග සිව්දිගවහුන්හල සදුන්කරඬු තුබූහ. උණුසුම් වලක්වාලීම පිණිස නාදරණය මහත්කෙළේයයි ඇතැම් ඇදුරුකෙණෙක් කියත් ඒ නාදරණින් වටකිරීම කුඩාවූකල භගවත් බුදුරදුන් නාරජුගේ සිරුරෙහි හට ගත් උණුසුම පෙළන්නේය මහත් කිරීමෙන් එබදු උණුසුමක් නොපෙළාවයි නාරජුගේ අදහස වී යනු ඒ ඇදුරුමතයෙහි අභිප්‍රායයි.)

විවෙකෝ, නිස්සාණසංඛ්‍යාත උපධිවිවෙකයතෙමේ; සුඛෝ, සැප ඇත් තේවේ; තුඨස්ස, සිව්මග නුවණ සතුටින් සතුටුවූ; සුතධම්මස්ස, ප්‍රකාශ කරනලද ධර්මය පිළිබඳව; පස්සතෝ, (ඒ උපධිවිවෙකය හෝ දුක්කයුත්තු සියල්ල තමන්ගේ ඉර්ධීබලයෙන් පැමිණියාවූ නුවණ නම්‌ැති ඇසින්) දක්නාහුට්; අබ්‍යාපජ්ඣං, නොකිපීම; සුඛං, සුවවේ; ලොකෙ, ලෙව්හි; පාණභූතෙසු, සතුන් කෙරෙහි; සංයමෝ, හිංසානොකිරීමද සුවවේ.

සුඛා විරාගතා ලොකෙ කාමානං සමතික්කමෝ
අස්මිමානස්සයෝ විනයෝ එතං වෙ පරමං සුඛන්ති.

මූලපණ්ණාසකථා නිට්ඨිතා.

අථඛෝ භගවා සත්තාහස්ස අච්චයෙන තම්හා සමාධිම්හා වුට්ඨහිත්වා මූලපිළුමූලා යෙන රාජායතනං තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා රාජායතනමූලෙ සත්තාහං එකපල්ලඞ්කෙන නිසීදි විමුත්තිසුඛ පටිසංවෙදී, තෙන ඛොපන සමයෙන තපස්සුභල්ලිකා වාණිජා උක්කලා තං දෙසං අද්ධානමග්ගපටිපන්නා හොන්ති, අථඛෝ තපස්සුභල්ලිකානං වාණිජානං ඤාතිසාලොහිතා දෙවතා තපස්සුභල්ලිකෙ වාණිජෙ එතදවොච: අයං මාරිසා භගවා රාජායතනමූලෙ විහරති පඨමාභිසම්බුද්ධා, ගච්ඡථ තං භගවන්තං මච්චෙනව මධුපිණ්ඩිකායව පටිමානෙථ, තං වෝ භවි

ලොකෙ, ලෙවිහි; කාමානං, වසතුකාම කෙලෙසක මයන්ගේ; සමතික්කමෝ, ඉක්මවීමෙක්වේද; විරාගතා, ඒ නොඇලීම්තොමෝ; සුඛා, සැපවන්නීය, අස්මිමානස්ස, අහංකාරයාගේ; යෝ විනයෝ, යම් අතව ශෙෂ ප්‍රහාණයෙක් වේද; එතං, මේ අනවශෙෂ ප්‍රහාණය තෙමේ; වෙ, ඒකාන්තයෙන්; පරමං, උතුම්වූ; සුඛං, සැපයෙක්වේ. (සුඛාවිරාගතා ලොකෙ කාමානං සමතික්කමෝ යන්නෙන් අනාගාමි මාර්ගයද අස්මිමානස්ස යෝ විනයෝ යන්නෙන් අර්හත්මාර්ගයද ප්‍රකාශිතයි ඒ අර්හත්මාර්ගයටවඩා අධිකතර සැපයෙක් නැත්තේය යනු දක්වනු පිණිස "එතං වෙ පරමං සුඛං" යනු වදාරනලදි.)

මූලපණ්ණාසකථානෙමෝ නිට්ඨිතා.

(අථඛෝ —පෙ— විමුත්තිසුඛපටිසංවෙදී- මේට 7 පිටේ 15 පෙල පටන් කීසේ දතයුතු. රාජායතනං, කිරිපලුරුක;) තෙන ඛොපන සමයෙන, එසමයෙහි; තපස්සුභල්ලිකා, තපස්සුග භල්ලිකග යන නම් ඇති; වාණිජා, වෙළඳ දෙබෑයෝ; උක්කලා, උක්කලාදනවිව කෙරෙන්; තංදෙසං, ඒ මධ්‍යදෙසයට යනු පිණිස; අධානමග්ගපටිපන්නා හොන්ති, දික්මගට පිළිපන්නෝවෙත්; (අඩයොදුනද අධානමාගීයයි විනයවිභඞ්ගයෙහි හා සුමඞ්ගලවිලාසිනියෙහි කියනලදි) අථඛෝ, ඉක්බිති; තපස්සුභල්ලිකානං, තපස්සුග භල්ලිකග යන නම්ඇති; වාණිජානං, වෙළඳදෙබෑන්ගේ; ඤාතිසාලොහිතා, සහලේනෑවූ; (කිට්ටුවර නැයෙක්වසිට දෙව්අත්බැවට පැමිණි) දෙවතා, දෙවඟනක් තොමෝ; තපස්සුභල්ලිකෙ වාණිජෙ, තපස්සුග භල්ලිකග යන දෙබෑවෙළඳුන්ට; එතං, මේ වදන; අවොච, කීය; මාරිසා, නිදුකානෙනි; අයං භගවා, මේ භාග්‍යවතුන් වහන්සේ; පඨමාභි සම්බුද්ධා, සම්‍යක්සම්බොධියට පැමිණ ප්‍රථමකොට; රාජායතනමූලෙ, කිරි පලුරුක්මූල; විහරති, වැඩවසනසේක; ගච්ඡථ, යව්; තං භගවන්තං, ඒ භාග්‍යවත් වූ බුදුරදුන්ට; මච්චෙනව, අත්සුණුසෙන්ද; මධුපිණ්ඩිකායව, මීපිඬුසෙන්ද; පටිමානෙථ, පුදව්; තං, ඒ පිදීම; වෝ, තොපහට; දීඝ

සසති දිසරත්තං හිතාය සුඛාය‍ාති. අථඛො තපස්සුභල්ලිකා වාණිජා මත්ථකව මධුපිණ්ඩිකඤ්ච ආදාය යෙන භගවා තෙනුපසංකමිංසු, උප සඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු, එකමන්තං ඨිතාඛො තපස්සුභල්ලිකා වාණිජා භගවන්තං එතදවොචුං, පතිග ණ්හාතු නො භන්තෙ භගවා මත්ථකව මධුපිණ්ඩිකඤ්ච යං අම්හාකං අස්ස දිසරත්තං හිතාය සුඛාය‍ාති. අථඛො භගවතො එතදහොසි, නඛො තථාගතා හත්ථෙසු පතිගණ්හන්ති, කිමහිනුඛො අහං පතිග ණ්හෙය්‍යං මත්ථකව මධුපිණ්ඩිකඤ්චාති. අථඛො චත්තාරො මහාරාජා භගවතො චෙතසා චෙතො පරිවිතක්කමඤ්ඤාය චතුද්දිසා චත්තාරෝ සෙලමයෙ පත්තෙ භගවතො උපනාමෙසුං ඉධ භන්තෙ භගවා පති ගණ්හාතු මත්ථකව මධුපිණ්ඩිකඤ්චාති. පටිග්ගහෙසි භගවා පවව්හෙ

රත්තං, බොහෝකලක් මුළුල්ලෙහි; හිතාය, හිත පිණිසද; සුඛාය, සැප පිණිසද; භවිස්සතිඉති, වන්නේයයි; අථඛො, ඉක්බිති; තපස්සුභල්ලිකා වාණිජා, තපස්සුය භල්ලිකය යන වෙළඳදෙබෑරෝ; මත්ථංව, අත්සුණුද; මධුපිණ්ඩිකංව, මීපිඬුද; ආදාය, ගෙන; භගවා, භාග්‍යවතුන් වහන්සේ; යෙන, යම් තැනෙක්හිද; තෙන, එතන්හි; උපසඞ්කමිංසු, එළඹියාහුය; උපසඞ්කමිත්වා, එළඹ; භගවන්තං, භාග්‍යවත් වූ බුදුරදුන්ට; අභිවාදෙත්වා, සකසා වැඳ; එකමන්තං, එකත්පසෙක; අට්ඨංසු, සිටියාහුය; එකමන්තං, එකත්පසෙක; ඨිතාඛො, සිටියාවූ; තපස්සුභල්ලිකා වාණිජා, තපස්සුය භල්ලිකය යන වෙළඳ දෙබෑරෝ; භගවන්තං, භාග්‍යවත් වූ බුදුරදුන්ට; එතං, මේ වදන; අවොචුං, සැළ හළහ. යං, (නුඹවහන්සේගේ) යම් පිළිගැනීමක්; අම්හාකං, අපහට; දීඝරත්තං, දික්කලක්මුළුල් ලෙහි; හිතාය, හිත පිණිසත්; සුඛාය, සැප පිණිසත්; අස්ස, වන්නේද; භන්තෙ, සවාමිනි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; නො, අපගේ; මත්ථංව, අත්සුණුද; මධුපිණ්ඩිකංව, මීපිඬුද; පතිගණ්හාතුඉති, පිළිගන්නා සේක්වාසි; අථඛො, එකල්හි; භගවතො, භාග්‍යවත් වූ බුදුරදුන්ට; එතංඅහොසි මෙබඳු සි තක්වී; තථාගතා, තථාගතයෝ; හත්ථෙසු, අසින්; නඛො පති ගණ්හන්ති, නොපිළිගනිත්; අහං, මම; කිමහිනුඛො, කුමකින්; මත්ථංව, අත්සුණුද; මධුපිණ්ඩිකංව, මීපිඬුද; පතිගණ්හෙය්‍යංඉති, පිළිගන්නෙම් දැයි; අථඛො, එකල; චත්තාරො මහාරාජා, සතරවරම් මහරජවරු; චෙත සා, තම සිතින්; භගවතො, භාග්‍යවතුන් වහන්සේගේ; චෙතො පරිවි තක්කං, සිත පිළිබඳ නොනිමි කල්පනාව; අඤ්ඤාය, දැන; චතුද්දිසා, සිව් දිසින්; සෙලමයෙ, ශෛලමයවූ; චත්තාරෝ පත්තෙ, පාත්‍රා සතරක්; භග වතො, භාග්‍යවත් වූ බුදුරදුන්හට; උපනාමෙසුං, එළෙව්වෝය; භන්තෙ, සවාමිනි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; ඉධ, මෙයින්; මත්ථංව, අත් සුණුද; මධුපිණ්ඩිකංව, මීපිඬුද; පතිගණ්හාතුඉති, පිළිගන්නාසේක්වාසි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; පවව්හෙ, එකෙණෙහි උපන්නාවූ; **"පවව්හෙඤ්ඤි පඞ්ඞ අගහයම්හි පාටෙකඤ්ඤං මහගඝඤ්ඤිඤ්ඤි අඤ්ඤෙ, අථ වා පවව්හගඝඤ්ඤි අඝිඤවෙ අඛ්ඤ්ඤඤ්ඤ්ඤ නංඛඤ්ඤ නිඛ්ඛඤ්ඤඤ්ඤඤ්ඤිඤ්ඤි**

සෙලමයෙ පත්තෙ මත්ථකඩ මධුපිණ්ඩිකඤ්ච, පටිග්ගහෙත්වාව පරිභුඤ්ජි, අථඛො තපස්සුභල්ලිකා වාණිජා භගවන්තං එතදවොචුං, එතෙ මයං භන්තෙ භගවන්තං සරණං ගච්ඡාම ධම්මඤ්ච, උපාසකෙ නො භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතෙ සරණං ගතෙති, තෙව ලොකෙ පඨමං උපාසකා අහෙසුං වෙවාචිකා.

රාජාභිනන්දකථා නිට්ඨිතා.

අත්ථෝ" යනු විතය අටුවාසි. "පටිග්ගණ්හාති එත්ථ පුරිමං අත්ථවිකප්පං කෙචි න ඉච්ඡන්ති, තෙනෙව අවිසයභම්මපාලත්ථෙරෙන වුත්තං- පටිග්ගණ්හාති අභිනවෙ, පත්තෙකා මහග්ඝභාවෙ පටිග්ගණ්හාති කෙචි, තං න සුන්දරං, නහි බුද්ධා භගවන්තා මහග්ඝං පටිග්ගහණභාවෙ පරිභුඤ්ජන්ති වා" ති යනු සාරත්ථදීපනී ටීකායි, මින් ආචාර්‍ය්‍ය ධම්මපාල තෙරතුමන්ගේ මතය මහායසි හැගේ ඒ මතය ටීකාවාර්‍ය්‍ය සාරිපුත්‍ර මහාසාමීන්ද්‍රයන් වහන්සේටත් අභිවතවිය. "පඨමං භගවෙතා අභිනවෙ, අඤ්ඤෙව අත්ථෝ, පඤ්ඤත්ථෝ, න පුරිමෝ, නහි බුද්ධා මහග්ඝං පත්තං පරිභුඤ්ජන්ති" යනු විමතිවිනොදනී ටීකායි. සෙලමයෙ, ශෛලමයවූ; පත්තෙ, පාත්‍රයෙන්; මත්ථකං, අග්‍රභූතය; මධුපිණ්ඩිකංච, මීපිඬුද; පටිග්ගහෙසි, පිළිගත්තේක; පටිග්ගහෙත්වාව, පිළිගෙනද; පරිභුඤ්ජි, වැළඳුවේක; අථඛො, ඉක්බිත්; තපස්සුභල්ලිකා වාණිජා, තපස්සුත භල්ලිකත යන වෙළඳදෙබෑයෝ; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; එතං, මේ වදන; අවොචුං, සැළකළෝත; භන්තෙ, ස්වාමිනි; එතෙමයං, ඒ අපි; භගවන්තං, භාග්‍යවත් වූ බුදුරදුන්ද; ධම්මංච, ධර්මයද; සරණං ගච්ඡාම, සරණකොට යමු; භගවා; භාග්‍යවත් තෙම; අජ්ජතග්ගෙ, අද පටන්; (කදලිඝු ගජං රක්ඛති යන තැනමෙන් අපාදනාඵලයෙහි අදරවිබත්වූ තැනි. මෙහි අග්ගශබ්දත "අජ්ජතග්ගෙ සම්ම දෙවාරික ආචරාහි වාරං නිග්ගණ්හානං නිග්ගණ්හිතං" යනාදි තන්හිමෙන් ආදි ශබ්දපර්‍යායත වේ.) පාණුපෙතෙ, දිවිහිමි කොට; සරණං ගතෙ, සරණකොට ගියාවූ; නෙ, අප; උපාසකෙ, උපාසකයන් කොට; ධාරෙතුඉති, සලකනසේක්වාසි; තෙව, ඔහු දෙදෙනම; ලොකෙ, ලෙව්හි; පඨමං, පළමුකොට; වෙවාචිකා උපාසකා, වෙවාචික උපාසකයෝ; අහෙසුං, වූහ.

(සවෙනි සතියෙහි වැඩඋන් මුවලින්දමූලයෙන් පැනනැඟී සත්වන සතියෙහි දකුණුදිග මහත් කිරිපලුවණයකට වැඩවදරා කිරිපලුරුකක් මූල හල්අස්නෙක්හි නිල්වලාගබක්යට දිලියෙන පුන්සඳක්සේ දිලිහිදිලිහි ධ්‍යානසුවයෙන් වැඩහුන්සේක, මෙසේ මේ සත්වන සතියෙහි බුදුවූ එකුන්පනස්දින මුළුල්ලෙහි අහරකිස නැතිව නිවන් සුවම වලඳ දවස් ඇවූකල බුදුවූ පන්සවනදා උදැසන අරුණනැඟී වේලෙහි සක්දෙව් රජතෙමේ බෙහෙත් අරළු පිළිගැන්වීය, ඒ අමාඅරලු වැළඳූ කෙණෙහිම භාග්‍යවතුන් වහන්සේට සිරුරුපිළිදැගුම්විය, එවිට බුදුරජණෝ හිමාලය

වනයෙහි අනොතත්තවිලට වැඩවිදරා සුගත්තම්වූ බුදුරජාණන් වහන් සේලාටම නියවවතුබූ තොටට බැස ශ්‍රීවූඛ ඩොවනයකොට සක්දෙව් රජුන් විසින්ම දෙනලද නාලිය දඟැවි වලඳ ඉක්බිති කිරිපලුරුක්මූල වැඩහුන්සේක, එසමයෙහි බුදුකෙණෙකුන් වහන්සේහට අග්‍රහොජනයක් දන්දෙමිසි කල්පලක්ෂයක් මුළුල්ලෙහි පෙරුම්පුරා ආ තපසසුය හලලිකය යන වෙළඳදෙබෑයෝ උතුරුදිග පිහිටි උක්කලා නම් දන්වී වෙහි සිට පන්සියයක් ගැල්පුරා බඩුගෙන මඩ්‍ය දෙසෙහි යන්නෝ ඒ කිරිපලුවනයට පැමිණියෝය පෙර ඔවුන්ගේ නැවූ ඒ වෙනෙහි වසන දෙවඟනක් තොමෝ ගැල්වලින් බඩු ගෙනයන්නාවූ ඒ වෙළඳදෙබෑයන් දැක උන්ලවා මාගේ බුදුරජාණන්හට අදදනක් පිළිගන්වා ඔවුන්ට මහත් පින් ලබාදෙමිසි උන්කෙරේ අනුකම්පායෙන් ඒ ගැල් පන්සියයම් නැබ (බොස්ගෙඹිය) දන්වා පොළොවෙහි ගිල්වී හැල් අදනා ගොන් දනබිම ගසා නැවැත්නාහ එවේලෙහි වෙළඳදෙබෑයෝ කියපත්ව මේ වෙනෙහි අරක්ගත් දෙවියෙකු විසින් සැරසූ ලද්දක් යයි සිතන්නාහු ගඳදුම්මල් පහන් දූප දෙවියන්ට ආරාධනා කළහ එකෙණෙහි දිව්‍යාඟනා තොමෝ දෙවිපිරිස් පිරිවරා අහසෙහි සිට ඔවුන්ට පෙනී පෙනී හඬ හරවා මාගේ බුදුරජාණෝ බුදුවූ දින පටන් එකුන් පනස් දිනක් මුළුල්ලෙහි මේ දක්වාම අතර නැතිව සත්සතියක් ගෙවා සමපනස් දිනයවූ අද අපගේ මේ වෙනෙහි උතුම් පින්කෙත්ව වැඩහිඳිනාසේක තොපහා අපට පින් ලැබ පරලෝ වැඩ පිණිස භගවත් බුදුරජාණන්හට අග්‍රදානය තොපලවා දෙවනු කැමැත්තෙමියි මෙසේ බුදුගුණ කියා භගවත් බුදුරජාණන්හට දනක්දෙනසේ ඔවුන් ගිවිස්වා ඒ ගැල් පන්සියයම හැරියේය එකල ඒ වෙළඳදෙබෑයෝ පැහැද මීපිඬු ඉගන ගොස් බුදුරදුන් පෙරටුව සිට හිමිවූ බුදුරජාණන් වහන්ස! අපට බොහෝකලක් මුළුල්ලෙහි හිතවැඩ පිණිස මේ මීපිඬු පිළිගත මැනවැයි ආරාධනා කළහ. දැවිදිවූ දූ මහබඹු පිළිගැන්වූ පාත්‍රය සුජාතාවන් කිරිපිඬු පිළිගැන්වූ විගසම අතුරුදහන්විය ඒ කිරිපිඬු පිළිගැන්වූ තලිය නෙරඤ්ජරා නදියෙහි පූකල තාලොව බලා ගියේය. එබැවින් බුදුවරයෝ පාණිපාත්‍රඥන් (අතින්) තොපිළිගනිති කිසිම් පාත්‍රයකින් පිළිගනිම්දැයි සිතා වදළසේක. එකෙණෙහි සතරවරම් මහරජහු ඉඳුනිල්මුවාවූ පාත්‍රා සතරක් ගෙනාවෝය බුදුරජාණෝ පෙර බුදුරදුන්ගේ සිරිත් බලා ඒ තොපිළිගත්තේක. ඉක්බිති මුන්වන් පැහැඇති ශෛලමය පාත්‍රා සතරක් ගෙනවුත් පිළිගැන්වූහ, බුදුරජාණෝ සිව්වරම් මහරජුන්ට අනුකම්පා පිණිස ඒ පාත්‍රා සතරම එකක් වේවයි අධිෂ්ඨාන කළසේක එකෙණෙහි පාත්‍රා සතරම එකාබඳව් සතර මුවවිට රෙඛාපෙණි එක් පාත්‍රයක්විය. එකල බුදුරජාණෝ ඒ පාත්‍රයෙන් මීපිඬු පිළිගෙන පළමුවන බොදුන වලඳ ඒ වෙළඳදෙබෑයන්ට අනුමෙවෙනි දම්දෙසා බුදුසරණ දහම්සරණ දෙක්හි පිහිටුවා වෙවාචික නම් උපාසකයන් කළසේක. ඉක්බිති ඒ වෙළඳදෙබෑයෝ සාමිනි! නිතර වැඳපුදගැනීමට පූජනීය වසතුවක් දුන මැනවැයි ඉල්වූහ එවිට බුදු

අථඛෝ භගවා සතතාහස්ස අච්චයෙන තම්හා සමාධිම්හා වුට්ඨහිත්වා රාජායතනමූලා යෙන අජපාලනිග්‍රොධෝ තෙනුපසඞ්කමි, තත්‍රසුදං භගවා අජපාලනිග්‍රොධමූලෙ විහරති, අථඛෝ භගවතෝ රහොගතස්ස පතිසල්ලීනස්ස එවං චෙතසෝ පරිවිතක්කෝ උදපාදි, අධිගතොඛෝ ම්‍යායං ධම්මෝ ගම්භීරෝ දුද්දසෝ දුරනුබොධෝ සන්තෝ පණීතෝ අතක්කාවචරෝ නිපුණෝ පණ්ඩිතවෙදනීයෝ, ආලයරාමා ඛොපනායං පජා ආලයරතා ආලයසම්මුදිතා, ආලයරාමාය ඛොපනපජාය ආලය රතාය ආලයසම්මුදිතාය දුද්දසං ඉදං ඨානං යදිදං ඉදප්පච්චයතා පටිච්චසමුප්පාදෝ, ඉදම්පිඛෝ ඨානං සුදුද්දසං යදිදං සබ්බසඞ්ඛාරසමථෝ සබ්බූපධිපටිනිස්සග්ගෝ තණ්හක්ඛයෝ විරාගෝ නිරොධෝ නිබ්බාණං, අහඤ්චෙවඛොපන ධම්මං දෙසෙය්‍යං, පරෙ ච මෙ න ආජානෙය්‍යුං, සෝ මමස්ස කිලමථෝ, සා මමස්ස විහෙසාති, අපිස්සු භගවන්තං ඉමා අනච්ඡරියා ගාථායෝ පටිභංසු පුබ්බෙ අසුතපුබ්බා.

රජාණෝ ශ්‍රීහස්තයෙන් සිරස පිරිමැද කෙශධාතු මිටක්ගෙන තෙපි මීට පුදව්යයි ඒ වෙළඳදෙබැයන්ට දුන්හ, ඒ වෙළඳදෙබැයෝ අමෘතයෙන් අභිෂෙක කරනු ලැබුවාක්මෙන් තුටුපහටුවී තුන්ලෝ තිලක බුදුරජාණන් වැඳ පුදා නික්ම ගියෝය.

රාජායතන කථානොමෝ නිමවිණ.

(අථඛෝ —පෙ— තෙනුපසඞ්කමි- මිට 7 පිටේ 15 පෙළ පටන් කියේ අර්ථ දතයුතු.) තත්‍රසුදං, එහි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; අජපාල නිග්‍රොධමූලෙ, අජපාල නාම න්‍යග්‍රොධ මූලයෙහි; විහරති, වැඩවසන්සේක; අථඛෝ, ඉක්බිති; රහොගතස්ස, රහසිගතවූ; පතිසල්ලීනස්ස, පලසමවතින් සමාධිමත්වූ; භගවතෝ, භාග්‍යවත් වූ බුදුරදුන්ගේ; චෙතසෝ, සිත පිළිබඳ; පරිවිතක්කෝ, නොනිමිකල්පනාවෙක්; එවං, මෙසේ; උදපාදි, පහළවිය; මෙ, මා විසින්; අධිගතෝ, (මේ දුක්ඛසත්‍යය ආදී තත්වූ පරිදි) අවබොධකරන ලද්දාවූ; අයං ධම්මෝ, මේ සිව්සස් දහම්තෙම; ගම්භීරෝ, ගැඹුරුවේ; දුද්දසෝ, දුකින් දතයුතුවේ; දුරනුබොධෝ, දුකින් අවබොධ කටයුතුවේ; සන්තෝ, (සංසිඳවූ සියලු කෙලෙස්දහ ඇතිබැවින් සාන්තවේ; පණීතෝ, ප්‍රණීතවේ; (තෘප්තිනොකිරීම් අතීයෙන් මිහිරි බොජුනක්මෙන් නොපිනවන්නේකි) අතක්කාවචරෝ, (උතුම් නුවණට විසය බැවින්) තර්කයෙන් නො දතහැකිවේ; නිපුණෝ, (දක්ෂනුවණට ගොදුරු බැවින් හා සිලුවූ බැවිනුත්) සියුම්වේ; පණ්ඩිතවෙදනීයෝ, (මනාව පිළිපන්) පණ්ඩිතයන් විසින්ම දතයුතුවේ; අයංපජාඛොපන, මේ ප්‍රජාතොමෝ වනාහි; ආලයරාමා, පස්කම්සැපය තෘෂ්ණාවය යන දෙක හා ඇලෙන්නීය; ආලයරතා, පස්කම්සැපයෙහි හා තෘෂ්ණායෙහි ඇලුනීය; ආලයසම්මුදිතා, පස්කම්සැපයෙහි හා තෘෂ්ණායෙහි ඔදවැඩුනීය; (යම්සේ මනාව සැදුම්ලද මල්ගෙඩිවලින් බරවූ රුක් ආදියෙන් හෙබී සාවූ උයන්බිමකට පිවිසි රජතෙමේ ඒ ඒ සම්පතින් ඇලේද වෙසෙසින්

කිලෙජ්ජන මෙ අධිගතං හලංඤාති පකාසිතුං
රාගදෝසපරෙතෙහි නායං ධම්මෝ සුසම්බුද්ධෝ.

ප්‍රබුදිතවේද සවස්කල්බිදු නික්මෙනු නොකැමැතිවේද එපරිදි මේ පස් කාමසැපයෙන් හා තෘෂ්ණායෙන් සම්බන්ධතාසම්පයෝ සංසාරවාත්තයෙහි සැලනොකිරෙනෝ වී වෙසෙන් එහෙයින් භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ පස්කාමසැපයෙහි ඇල්ම හා තෘෂ්ණායෙහි ඇල්මත් යන දෙවැදෑරුම්වූම ඇල්ම උපන්බිමක් සේ දක්වා වදාරනසේක් ආලයරාමා යනාදිය වදාළහ්) ආලයරාමාය ඛෝපන, පස්කාමසැපය තෘෂ්ණාවය යන දෙකා හා ඇලෙන්නීවූ; ආලයරතාය, පස්කාම්සැපය හා තෘෂ්ණායෙහි ඇලුනාවූ; ආලයසම්මුදිතාය, පස්කාම්සැපය හා තෘෂ්ණායෙන් මදවැඩුනාවූ; පජාය, ප්‍රජාව විසින්; යංඉදං, යම්මේ; ඉදප්පච්චයතා. මේ සංස්කාරදින්ට ප්‍රත්‍යයවූ; පටිච්චසමුප්පාදෙ, ප්‍රතීත්‍යසමුත්පාදයෙක් වේද; ඉදං ඨානං, මේ (සංස්කාරාදීන්ට ප්‍රත්‍යයවූ අවිද්‍යාදි) හෙතුව; දුද්දසං, දුකින් දනයුතුවේ; යං ඉදං, යම් මේ; සබ්බසඞ්ඛාරසමථෝ, සකල සංස්කාරයන්ගේ සංසිදීමෙක් වේද; සබ්බූපධිපටිනිස්සග්ගෝ, සකල උපධීන්ගේ දුරැවීමෙක් වේද; තණ්හාක්ඛයෝ, (සංක්ෂපනයෙන් තුන්අයුරුවූ විස්තර හෙයින් එක්සියඅටක් ප්‍රභෙදවූ) සකල තෘෂ්ණාවන්ගේ ක්ෂයවීමෙක් වේද; විරාගෝ, සකල කෙලෙසරාගයන්ගේ නොඇල්මෙක් වේද; නිරොධෝ, (ජරා මරණාදි ප්‍රභෙදවූ) සකල දුඃඛයන්ගේ නැතිවීමෙක් වේද; නිබ්බානං, (භවය හා අන්භවයක් හෝ ඵලය හා කම්ය හෝ එකිනෙකා මිනාකොට ගලපන එක්සියඅටක් ප්‍රභෙදවූ) තෘෂ්ණාවෙන් නිදහස්වීමෙක් වේද; ඉදම්පිඛෝඨානං, මේ හෙතුවද; සුදුද්දසං, වැඩියක් දුකින් දනයුතුවේ; අහංවෙව ඛෝපන, මම ද වනාහි; ධම්මං දෙසෙය්‍යං, දහම් දෙසන්නෙම් නම්; පරෙව, අන්‍යයෝද; මෙ, මාගේ දහම්; න අජානෙයුං, නොදන්නාහුනම්; සෝ, හේ තෙමේ; මම මට; කිලමථෝ, පෙළීමෙක්; අස්ස, වන්නේය; සා, ඕ තොමෝ; මම, මට; විඝෙසාඅස්සඉති, වෙහෙසක්ද වන්නේ යයි (මෙබඳු පරිවිතර්කයෙක් පහළවී), අපිස්සු, නැවතද; භගවන්තං, භාග්‍යවත් බුදුරදුන්ට; පුබ්බෙ, පෙර; අස්සුතපුබ්බං, නොඇසුවිරූ; අනච්ඡරියා, අතිශයින් ආශ්චර්‍යවූ; ඉමාගාථාඅභාසිං, මේ ගාථාවෝ; පටිභංසු, වැටහුනෝය.

මෙ, මා විසින්; කිලෙජ්ජන, දුකින්; අධිගතං, අවබොධ කරනලද දහම්; ඉදානි, දැන්; පකාසිතුං, ප්‍රකාශකිරීම; හලං, කම්නැත; (මෙසේ දුකින් අවබොධ කරනලද දහම් දෙසීම ප්‍රයෝජන නොවේ දෙසීමෙන් වැඩක් නොවේ යනු භාවයි, හෙතුකිමයත්?) රාගදෝසපරෙතෙහි, රාග වෙෂයන්ගෙන් පෙළෙන්නන් විසින්; (රාගයෙන් හා වෙෂයෙන් මඩනලද්දවුන් විසින් නොහොත් රාගය හා ද වෙෂය හා ද ලුහුබැන්දවුන් විසින්) අයං ධම්මෝ, මේ දහම් තෙමේ; නසුසම්බුද්ධෝ, සුවයෙන් අවබොධ කරනු නොහැක්කේය

පටිසොතගාමිං නිපුණං ගම්භීරං දුද්දසං අණුං
රාගරත්තා න දක්ඛිහන්ති තමොක්ඛන්ධේන ආවටා.

ඉතිහ භගවතො පටිසංවික්ඛතො අපෙපාසුක්කතාය චිත්තං නමති නො ධම්මදෙසනාය, අථඛො බ්‍රහ්මුනො සහම්පතිස්ස භගවතො චෙතසා චෙතො පරිවිතක්කමඤ්ඤාය එතදහොසි— නස්සන්ති වත හො ලොකා විනස්සන්ති වත හො ලොකා, යත්‍රහිනාම තථාගතස්ස අරහතො සම්මා සම්බුද්ධස්ස අපෙපාසුක්කතාය චිත්තං නමති, නො ධම්මදෙසනායාති. අථ ඛො බ්‍රහ්මා සහම්පති සෙය්‍යථාපිනාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය. එවමෙවං බ්‍රහ්ම

නිපුණං, සියුම්වූ; ගම්භීරං, ගැඹුරුවූ; දුද්දසං, දැකිම දුෂ්කරවූ; අණුං, සියක්වරපැලූ ලොම්අග්‍රයක්සේ සියුම්වූ; පටිසොතගාමිං, හෙලෙස් නම්වැති සැඵපහරට විරුඬවූ (අනිත්‍ය දුක්ඛ අනාත්ම අශුභ යයි මෙසෙයින් පැමිණියාවූ) සිව්සස් දහම්; රාගරත්තා, කාමරාග භවරාග දෘෂ්ටිරාගයෙන් රත්වූ; තමොක්ඛන්ධේන, අවිද්‍යාස්කන්ධයෙන්; ආවටා, වතුරාවනලද සත්ත්වයෝ; න දක්ඛිහන්ති, (අනිත්‍ය දුඃඛ අනාත්ම අශුභ වශයෙන්) නොදක්නෝය.

ඉති, මෙසේ; ඉහ, මෙහිදී; පටිසංවික්ඛතො, සලකන්නාවූ; භග වතො, භාග්‍යවතුන් වහන්සේගේ; චිත්තං, සිත; අපෙපාසුක්කතාය, අල්පොත්සාහී භාවයට; නමති, නැමෙයි; ධම්මදෙසනාය, දහම් දෙසනු පිණිස; නො, නොනැමෙයි; (කුමක් හෙයින් සම්බුදුරජාණන්ගේ සිත මෙසේ දහම්දෙසීමට නොනැමුනේද මේ සම්බුදුරජාණෝ "මුනෙනාහං මොනෙයසාම් තිණ්ණොහං තාරෙසසාම්—

"කිඤ්හි මම අසඤ්ඤුනෙවෙසනා ධම්මං සච්ඡිකතෙනිධ
සබ්බඤ්ඤුනං පාපුණිත්වා නාරධිසසං සදේවකං"යි.

"මම සසරින් මිදුනේම් අනුන් මුදවන්නෙම් මම සසරින් එතරවූයෙම් අනුන් එතරකරන්නොම් මෙහිදී අප්‍රාප්ත වෙශයෙන් දහම්සාත් කිරීමෙන් මට ප්‍රයොජනයෙක් නම් නැති සඳ්ඵලභාවයට පැමිණ දෙවියන් සහිත මිනිසුන් සසර සයුරෙන් එතරකරන්නෙම්" යි මෙසේ දිවිකුරු බුදුන් පාවුලදී පැතුම් කොට පෙරැම්දම් පුරා බුදුබැව් පැමිණියේක් නොවේද? මේ සියල්ල සැබව ප්‍රත්‍යවෙක්ෂානු භාවයෙන් බුදුරදුන්ගේ සිත මෙසේ දහම් නොදෙසීමට නැමුනේය, බුදුබැව් පැමිණ සතුන් කෙලෙසුන්ගෙන් ගහණබැව්ද තමන් පිළිවිදී සිව්සස්දහම් ගැඹුරුබැව්ද ප්‍රත්‍යවෙක්ෂා කරන්නාවූ ඒ බුදුරදුන්ට සතුන් කෙලෙසුන්ගෙන් ආකුල බැව් හා දහම් ගැඹුරුබැව්ද සළකාප්‍රකාරයෙන් ප්‍රකටවී, එකල මේ සත්ත්ව නම් කැඳින් පිරූ ලබුමෙන්ද මෝරුපිරූ ඇලිමෙන්ද වුරුණුතෙලින් තෙත්වූ රෙදිකඩක්මෙන්ද අදුන්තැවරී අතක්මෙන්ද කෙලෙසුන්ගෙන් බරවූහ ඉතා කිළිටිවූහ රාගයෙන් රත්වූහ වෙශයෙන් දූෂ්‍යවූහ මොහ යෙන් මුලාවූහ ඒ සත්ත්ව කුමක්නම් ප්‍රතිවෙධ කරන්නෝදැයි මෙසේ සල කන්නාවූ භගවත් බුදුරදුන්ගේ සිත කෙලෙශග්‍රහණය ප්‍රත්‍යවෙක්ෂානු භාව

යෙනුදු මෙසේ දහම් නොදෙසිමට නැමුනේය, මේ දහම්තම් පොළොව දරන්නාවූ දියකඳක් සේ ගැඹුරුය පර්වතයකින් වසාතුබු අඹැටක් සේ දැකීම දුෂ්කරය සියස්වර පැලූ ලොම්අගක් සේ සියුම්ය මේ දහම් පිළිවිදිනු පිණිස උත්සාහ වඩන්නාවූ මා විසින් නොදෙනලද දනක් නම් නැයි නොරක්ෂාලද සිලයක් නම් නැති නොපුරනලද සිහි පෙරුම් දමස් නම් නැති එසේවූ මාගේ නිරුත්සාහය මෙන් මරණයෙන් දුරලද්දිද පොළෝ කම්පානොවී, පෙරයම පෙර විසූ සැදපිළිවෙළ සිහිකරද්දිද සැළ්පානොවී, මැදයම දිවැස පිරිසිදුකරද්දිද කම්පානොවී, පසුයම මා ප්‍රතීත්‍යසමුත්පාදය අවබොධකරද්දීම දසදහස් ලෝද, කම්පාවී, මෙසේ මාවැනිවූද තියුණු නුවණැතියකු විසින් දුකින්ම මේ දහම් පිළිවිදින ලද්දේය, එවැනි ඒ සිවිසස් දහම් ලෞකික මහාජනයෝ කෙසේ පිළිවිදින් නෝදැනි ධර්මගම්භීරත්වය ප්‍රත්‍යවෙක්ෂානු භාවයෙනුදු මෙසේ දහම් නොදෙසිමට සිත නැමුනේ යයි දතයුතු වැලිදු මහබඹු අයදුමෙන් දෙසනු ඇැිති බැව්නුදු බුදුරදුන්ගේ සිත මෙසේ නැමුනේය, ඒ එසේමය භග වත් බුදුරජාණෝ දන්නාසේක, නිරුත්සාහී භාවය පිණිස මා සිත නැමෙන්නකල මහබඹු තෙමේ දහම් දෙසිමට අයදින්නේය මේ සත්හුද මහබඹු හරුකොට ඇතියහ, එබැවින් ඒ සත්හු ශාස්තෘන් වහන්සේ දහම් නොදෙසනු කැමැතිවූහ, එකල මහබඹු උන්වහන්සේට අයැද දහම් දෙසවූයේය, ඒකාන්තයෙන් ඒ දහම් තෙමේ ඥානයෙවි ඒකාන්තයෙන් ඒ දහම් තෙමේ ප්‍රණීතවේ යයි සලකන්නෝ මනාකොට අසන්නාහයි මෙකරුණ නිසාද භගවත් බුදුරදුන්ගේ සිත නිරුත්සාහී භාවයට නැවුනේය දහම්දෙසනු පිණිස නොනැවුණේ යයි දතයුතු.) අථඛෝ, එකන්තී; සහම්පතිස්ස බ්‍රහ්මුනෝ, සහම්පතී බ්‍රහ්මට; (මේ තෙම් වනාහී කසුප් බුදුරදුන් සමයෙහි සහකාතම් තෙරහමක්වී හේ දුර්ථම්‍යානය උපදවා ප්‍රථම ධ්‍යාන භූමියෙහි කල්පායුෂක බ්‍රහ්මයෙක්ව උපනී එහිදී ඕහට සහම්පතී බ්‍රහ්ම යනී ව්‍යවහාරකලෝ) වෙතසා, තම සිතින්; භගවතෝ, භගවත් බුදුන්ගේ; චෙතෝ, සිත පිළිබඳ; පරිවිතක්කං, නොනිම් කල්පනාව; අඤ්ඤාය, දැන; එතං, මෙබඳු සිතෙක්; අහොසි, වී; (කෙසේදයත්?) යන්නහිතාම, යම් ලොවෙක; අරහන්තෝ, අර්හන්වූ; සම්මාසම්බුද්ධස්ස, සම්‍යක් සම්බුදුවූ; තථාගතස්ස, තථාගතයන් වහන්සේගේ; චිත්තං, සිත; අප්පස්සක්කානාය, (දහම්දෙසීමෙහි) නිරුත්සාහී භාවයට; නමති, නැමේද; ධම්මදෙසනාය, දහම්දෙසනු පිණිස; නෝ, (සිත) නොනැමේද; හෝ, පින්වත්නි; වත, එකාන්තයෙන්; ලොකෝ (ඒ) ලෝකය තෙම; නස්සති, නැසේ; හෝ, පින්වත්නි; වත, එකාන්තයෙන්; ලෝකා, (ඒ) ලෝකය තෙම; විනස්සති, වැඩියක් නසියයි; (එතංඅහොසි යනු හා සම්බන්ධයි) අථඛෝ, ඉක්බිති; සහම්පතිබ්‍රහ්මා, සහම්පති බ්‍රහ්මතෙම; බලවාපුරිසෝ, ශක්තිමත් පුරුෂයෙක්; සම්මිඤ්ජිතං, හැකිලුවාවූ; බාහං, අතක්; සෙය්‍යථාපිපසාරෙය්‍යවා, යම්සේ දිගුහරන්නේ හෝ වේද; පසාරිතං; දිගු කළාවූ; බාහං, අතක්; සෙය්‍යථාපිසම්මිඤ්ජෙය්‍යවා, යම්සේ හකුලන්නේ

ලොකෙ අන්තරහිතෙ භගවතො පුරතො පාතුරහොසි, අථ ඛො බ්‍රහ්මා සහම්පති එකංසං උත්තරාසංගං කරිත්වා දක්ඛිණජණ්ණුමණ්ඩලං පුථ්ථවියං නිහන්ත්වා යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා භගවන්තං එතදවොච, දෙසෙතු භන්තෙ භගවා ධම්මං, දෙසෙතු සුගතො ධම්මං, සන්ති සත්තා අපරජක්ඛජාතිකා අස්සවණතා ධම්මස්ස පරිහායන්ති, භවිස්සති. ධම්මස්ස අඤ්ඤාතාරොති, ඉදමවොච බ්‍රහ්මා සහම්පති ඉදං වත්වා අථාපරං එතදවොච.

හෝ වේද; එවමෙවං, එපරිද්දෙන්; බ්‍රහ්මලොකෙ, බඹලොවෑ; අන්තරහිතෙ, අතුරුදහන්වූයේ; භගවතො, භගවත් බුදුරදුන්ගේ; පුරතො, ඉදිරියෙහි; පාතුරහොසි, පහළවූයේය; අථඛො, ඉක්බිති; සහම්පතිබ්‍රහ්මා, සහම්පති නම් මහබඹු තෙමේ; උත්තරාසඞ්ගං, උතුරුසළුව; එකංසං කරිත්වා, එකස්කොට පොරවා; දක්ඛිණජාණුමණ්ඩලං, දකුණු දනමඩල; පුථුවියං, පොළොවෙහි; නිහන්ත්වා, ගසා; භගවා, භාග්‍යවත් බුදුරජතෙමේ; යෙන, යම්හෑනකද; තෙන, එහන්හි; අඤ්ජලිං පණාමෙත්වා, ඇදිලිබැඳ; භගවන්තං, බුදුරදුන්ට; එතං, මේ වදන; අවොච, සැලකෙළේය; භන්තෙ, සවාමීනි; භගවා, භගවත්තෙමේ; ධම්මං, දහම්; දෙසෙතු, දෙසනාසේක්වා; සුගතො, සුගත්වූ බුදුරජ තෙමේ; ධම්මං, දහම්; දෙසෙතු, දෙසනාසේක්වා; අපරජක්ඛජාතිකා, ත්‍රුවණ නමැති ඇසෙහි සවලපවූ රාග ද්වේෂ මොහ රජසැබෑව ඇති; සත්තා, සත්ත්‍වයෝ; සන්ති, වෙත්; ධම්මස්ස, දහම්; අස්සවණතා, අශ්‍රවණ භාවයෙන්; (කරණත්‍ථයෙහි ප්‍රථමායි) පරිහායන්ති, (ඒ සත්ත්‍ව නවලොවුතුරුදහම් පිළිලැබීමෙන්) පිරිහෙත්; ධම්මස්ස, දහම්; අඤ්ඤාතාරො, අවබොධකරන්නෝ; භවිස්සන්තීති, වන්නාහුයි; (ඒ සහම්පති නම් මහබඹු තෙමේ දසදහසක් ලෝදෑ ඇසෙනසේ "නාසාති වත භො ලොකො" යනාදින් හඬගා කියා ඒ අසා රැස්වූ දෙව්බඹුකාලන්හා වක්තළ අතක් දිගුකරන්නාට පෙරටුව බුදුරදුන් ඉදිරියට පැමිණ සඤ්ඤා වැද පුදා දෙහොත් මුදුන්දී සිට "දෙසෙතු භන්තෙ භගවා ධම්මං —පෙ— භවිස්සන්ති අඤ්ඤාතාරෙ" යි දහම් දෙසනු පිණිස ආරාධනා කොට පෙර බුදුවරුන් විසයෙහි දසපින්කිරියවත් සැපයිමි වශයෙන් කාතාධිකාරවූ සත්ත්‍ව මූකුරුයිය පියුම් නිරුරැස් පහසමෙන් දම්මුව හැමැසිවැන්නෝ සිව්පාඇති ගගක්හුනේ අවසන්හි අරියබිම් සාක්කරනු හැක්කෝ එකෙක්ද නොවේ දෙදෙනෙක්ද නොවෙත් නොයෙක් සිය දහස් සත්ත්‍ව දහම් පිළිවිදින්නෝ යයි සැලෙළේය.) සහම්පතිබ්‍රහ්මා, සහම්පති මහබඹු තෙම; ඉදං, මේ වදන; අවොච, කීයේය, ඉදං, ටේ වදන; වත්වා, කියා; අථ, නැවත; අපරං, අන්‍යවූ; එතං, මේ ගාථා බන්ධනය; අවොච, කීයේය. (මහාසුප් මහරහතන් වහන්සේ විසින් මේ පාඨය එනම් "ඉදමවොච බ්‍රහ්මා —පෙ— එතදවොච" යනු රජගහ නුවර සප්තපණ්ණි ගුහාව රමයෙහි අජාසත් මහරජුණන් විසින් කරවන ලද ධම්මසඞ්ගායනාගෙහිදී පිහිටුවන ලද්දේය.)

පාතුරහොසි මගධෙසු පුබ්බෙ
ධම්මො අසුඛො සම්ලෙහි විනතිතො
අවාපුරෙතං අමතස්ස වාරං
සුණන්තු ධම්මං විමලෙනානුබුඛං.

සෙලෙ යථා පබ්බතමුඛනිට්ඨිතො
යථාපි පඒසෙ ජනතං සමන්නතතො
තථූපමං ධම්මමයං සුමෙධ
පාසාදමාරුයහ සමන්නතවක්ඛු
සොකාවතිණ්ණං ජනතමපෙතසොකො
අවෙක්ඛසසු ජාතිජරාභිභූතං.

පුබ්බෙ, පෙර; මහධෙසු, මගද දනව්වෙහි; සම්ලෙහි, රාගාදි කෙලෙස් මලින්යුක්ත (පූරණ කාශ්‍යපාදි අට ශාස්තෘවර) යන් විසින්; විනතිතො, සිත්නාලද්දුවු; අසුඛො, අපිරිසිදුවූ; ධම්මො, ධර්මය තෙම; පාතුරහොසි, පහළවිය; (බුදුරදුන් ලොව පහළවීමට පෙරාතුවම පූරණකාශ්‍යපාදි තීර්ථකයෝ සියලු දඹදිව කටු අතුරන්නාක් මෙන් හා විසවත්කරන්නාක් මෙන් මිථ්‍යාදෘෂ්ටි ධර්මය පතුරුවා හැරියෝය, ඒ නිවටහු බුදුරදුන්ගේ ලෝ පහළවීමි අසා හටගත් කුනුල් ඇත්තෝ ලොව මූලාකොට කුහන බැවිහි පිහිටා තමන් සර්ව්ඥභාවය ප්‍රතිඥාකරමින් යම්කිසි අධර්මයක්ම ධර්මයයි ප්‍රකාශකළෝ) අමතස්සවාරං, නිවන්දොරටුවවූ; එතං, මේ ආර්ය්‍ය මාර්ගය; අවාපුර, (භාග්‍යවත්වූ බුඛවහන්සේ) විවෘතකළ මැනව; විමලෙන, දුරුවූ රාගාදි කෙලෙස් මලඇති බුදුන් විසින්; අනුබුඛං, අවබොධකරන ලද්දුවූ; ධම්මං, (ඕවිසස්) දහම්; සුණන්තු, (සත්හු) අසත්වා; (සසුප් සම් බුදුන්ගේ ශාසනනාඩීහයෙහි පටන් වසනලද නිර්ව්ණපුරයාගේ මහා වාරයක්වූ මේ ආර්ය්‍ය මාර්ගය සදහම් දෙසුන් නමැති අතින් භාග්‍යවත් වූ බුඛවහන්සේ විවෘතකළ මැනව)

සෙලෙ, ශෛලමය එකඝනවූ; (මින් පාංශු පර්වත හා මිශ්‍ර පර්වත බැහැරකරේ, ශෛලමය පර්වතය උසින් හා ස්ථිරත්වයෙන් සෙසු පර්වත පරදවා සිටින්නේය) පබ්බතමුඛනි, පර්වත මස්තකයෙහි; යථාසිතො, සිටි පරිදි සිටියාවූ ඇස්ඇති පුරුෂයෙක්; (චක්ඛුමා යනු අධ්‍යාහාරයි) සමන්නතතො, හාන්පස; ජනතං, ජනසමූහයා; යථාපිපඒසෙ, යම්සේ දක්නේද; සුමෙධ, සුන්දර ප්‍රඥාඇති භාග්‍යවතුන් වහන්ස; සමන්නතචක්ඛු, සමතැස් ඇති බුඛවහන්සේ; (එවං යනු අධ්‍යාහාරයි) තථූපමං, ඒ ශෛලමය පර්වතය වැනිවූ; ධම්මමයං, ප්‍රඥාමයවූ; (විදසුන් පැණින් හටගත්) පාසාදං, (රහත් මගවූ) පහයට; ආරුයහ, නැඟී; අපෙතසොකො, (තමන් වහන්සේ) පහවූ සොක ඇත්තේ; සොකාවතිණ්ණං, සොකයට බැසගත්; ජාතිජරාභිභූතං, ජාති ජරායෙන් මඩනාලද; ජනතං, ජනසමූහයා; අවෙක්ඛසසු, විමසනසේක්වා! (යම්සේ පර්වත පාදයක හැම පසින් විසාලවූ තැනක් මොට එහි කෙත්නියරවල නිළි සාදා රැකල ගිනිදැල්විනම් ඕව අතින් යුත් අදු

උවෙඤි වීර විජිතසඞ්ගාම සත්ථවාහ අනණවිචරලොකෙ,
දෙසස්සු භගවා ධම්මං අනුකම්පකානෙ භවිඤ්ඤතීති.

අථ ඛො භගවා බ්‍රහ්මුනොව අජ්ඣෙසනං විදිත්වා සත්තෙසුව කාරුඤ්ඤතං පටිච්ච බුබවකඛුනා ලොකං ඔලොකෙසි, අද්දසා ඛො භගවා බුබවකඛුනා ලොකං ඔලොකෙන්තො සත්තෙ අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ සවාකාරෙ මාකාරෙ සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ අප්පෙකච්චෙ පරලොකවජ්ජභයදස්සාවිනො විහරන්තෙ

රෙක් වී නමුදු ඒ උතුම් මුදුනේ සිට හිමබලන ඇස් ඇති දුරුෂයක් හට ඒ කෙතද නියරද කිළිද නිදිගත් මිනිස්හුද නොපැණෙන්නෝ නමුත් ඒ කිළිවල දැල්වූ ගිනිදැල් පමණක්ම පැණෙන්නාක් මෙන් ප්‍රඥා නමැති පහසට නැඟී සත්කැල බලන බුදුරදුන්හට පෙර නොහලාවූ කුසල්ඇති සත්හු එකවෙහෙර දකුණුලයෙහි වසන්නෝ නමුදු රැවිදිහි දක්වැරද පිහන්නාසේ බුදුඇසට හමුනොවන්නෝය මුකුරාගිහ කුසල්ඇති විනය ජනයෝ දුරසිටියෝ නමුදු ඒ නිනිදැල් හා හිමවත් පඬිතය මෙන් හමු බවට පැමිණෙන්නාහ. එහෙයින් වදුරනලදි:-

"දූරෙ සතෙනා පකාසෙන්ති හිමවන්තොව පබ්බතො
අසතෙනෙත්ථ න දිස්සන්ති රත්තිඛිත්තා යථාසරා" ති.

(දුර සිටියාවුද දැන සිලාදි වශයෙන් පෙර කළ පින් ඇති සත්පුරුෂයෝ හිමවත් පඬිතය මෙන් බුදුඇසට ප්‍රකටවෙති, මේ ලෙව්හි මේ අත් බැවම් ගරුකොට සලකන අසත්පුරුෂයෝ දකුණු දනමඩල සමීපයෙහි සිටියෝ නමුදු සිව්අහින් යුත් ගනදුරෙහි වැදි හිමෙන් නොපැණෙත්.)

විජිතසඞ්ගාම, දිනකලද පස්මරුන් ඇති; සත්ථවාහ, (ජාතිකන්තාරාදීන් විනෙදනකාලන් එතරකරා නිප්පීණන සංඛ්‍යාත නිභීය ස්ථානයට පමුණුවන හෙයින්) සාර්ථවාහකයකු වැනිවූ; අනණ, (කම්සැප නමැති නය දුරුකළ බැවින්) නය නැත්තාවූ; (යමෙක් අන්හට නය ගැතිවීනම් ඒ නය නිමියන් විසින් නය දෙවයි තජ්නය කරනු ලබන්නේ නමුදු ගරහනු ලබන්නේ නමුදු පෙළනු ලබන්නේ නමුදු නය ගැති බැවින් ඒ කිසිවකු පෙළන්ට නොහැකි වූයේ සියල්ලක් ඉවසාද එපරිද්දෙන්ම යමෙක් යමකු කෙරෙහි කාමාසාවෙන් ඇලේද තෘෂ්ණා ග්‍රහණයෙන් ඒ වසඟවගනීද හේ තෙමේ ඔහු විසින් රලුබස් කියනු ලබන්නේ නමුදු ගරහනු ලබන්නේ නමුදු පෙළනු ලබන්නේ නමුදු සියල්ල ඉවසයි මොහුගේ ඉව සිමට කරුණ නම් ගේහිම්යන් විසින් පෙළනු ලබන සත්‍රින්ගේ මෙන් ඒ කාමවජ්ජභය වේ.) වීර, (ඝාතිසය වතුර්විධ සම්‍යක්ප්‍රධානවීර්‍යයෙන්) වීර්‍යවත් වූ බුදුරජාණන් වහන්ස; උවෙඤි, (දහම් දෙසීමට අලෙප්‍රාප්‍ත සංඛ්‍යාත මැලිකමින්) නැඟී සිටිනු මැනව; ලොකෙ, ලෙව්හි; විචර, (දහම් දෙසනු පිණිස නුඹවහන්ගේ) හැසිරෙනු මැනව; භගවා, භාග්‍යවත් වූ නුඹවහන්සේ; ධම්මං, දහම්; දෙසස්සු, දෙසනු මැනව; අනුකම්පකානෙ, දහම් අවබොධ කරන්නෝ; භවිඤ්ඤතීති, වන්නාහ.

අපෙපකවේව -න පරලොකවජ්ජභයදස්සාවිනෝ විහරන්ති සෙය්‍යථාපි නාම උපපලිනියං වා පදුමිනියං වා පුණ්ඩරීකිනියං වා අපෙපකවානි උපපලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා, උදකෙ ජාතානි උදකෙ සංවඩ්ඪානි උදකානුග්ගතානි අන්‍තොනිමුග්ගපොසීනි, අපෙපකවානි උපප

අථඛෝ, ඉක්ඛිති; භගවා, භාග්‍යවාන් බුදුරජාණන් වහන්සේ; මුත්තූ නෝ, බඹුනුවෙහි; අජ්ඣෙසනංව, ඉල්ලීමද; (ගරුතර උතුමන්ගෙන් පැමිණ ගරුතර ප්‍රයෝජනයක් උදෙසා වේවැසියන් පැතීම අජ්ඣෙසනා නම්, ඒ වනාහී අර්‍හත්ඵලයෙන් ඉල්ලීමම වේ) විදිත්වා, දැන; සත්තෙසු, සතුන් කෙරෙහි; කාරුඤ්ඤතංව, කාරුණිකබවද; පටිච්ච, නිසා; බුද්ධචක්ඛුනා, (ඉන්‍ද්‍රිය පරෝපරියත්ත ඤාණ ආසයානුසය ඤාණසඞ්ඛ්‍යාත) බුදුඇසින්; (ඉන්‍ද්‍රිය පරෝපරියත්ත ඤාණය ආසයානුසය ඤාණය යන මේ බුද්ධචක්ඛු යයි ද සත්ත්වඥානයට සමන්තචක්ඛු යයි ද සොවාන් සකදාගාමී අනාගාමී යන මාර්ගත්‍රය දිළිඹද නුවණට ධර්මචක්ඛු යයි ද කියනු ලැබේ, **"බුද්ධචක්ඛුනාති ඉන්‍ද්‍රියපරෝපරියත්තඤාණඤ්ච ආසයානුසයඤාණඤ්ච, ද්වෙමෙ ධම්මා බුද්ධිඤාණා බුද්ධචක්ඛුන්ති නාමං. සබ්බඤ්ඤුතඤාණස්ස සමන්තචක්ඛුන්ති. තීණිඤාණානි මග්ගඤාණානං ධම්මචක්ඛු"** ති. යනු පපඤ්චසූදනී අට්ඨකථාවයි.) ලොකං, සත්ත්වලෝකය; ඔලොකෙසි, බැලූසේක; භගවා, භාග්‍යවතුන් වහන්සේ; බුද්ධචක්ඛුනා, බුදු ඇසින්; ලොකං, සත්ලොව; ඔලොකෙන්තෙනා, බලනසේක්; අපරජකෙඛ ප්‍රඥනමැති ඇසෙහි සවලපවූ රාග වෙෂ මෝහ රජස් ඇත්තාවූද; මහාරජකෙඛ, ප්‍රඥනමැති ඇසෙහි මහත්වූ රාග වෙෂ මෝහ රජස් ඇත්තාවූද; තික්ඛින්‍ද්‍රියෙ, ශ්‍රද්ධා ආදි තියුණු ඉඳුරන් ඇත්තාවූද; මුදින්‍ද්‍රියෙ, ශ්‍රද්ධාආදි මෘදු ඉඳුරන් ඇත්තාවූද; සවාකාරෙ, ශ්‍රද්ධා ආදි සුහදවූ (යහපත්) ආකාර ඇත්තාවූද; වාකාරෙ, අයහපත් ආකාර ඇත්තාවූද; සුවිඤ්ඤාපයෙ, සුවශෙන් හඟවනුහැකිවූද; දුවිඤ්ඤාපයෙ, දුකින් හඟවනුහැකිවූද; අපෙපකෙවෙව, සමහර; පරලොකවජ්ජභයදස්සාවිනෝ, පරලොව හා වරද බිය වශයෙන් දක්නා සුලුව; විහරන්ති, වසන්නාවූද; අපෙපකවේව, සමහර; පරලොකවජ්ජභයදස්සාවිනෝ, පරලොව හා වරද බියවශයෙන් දක්නා සුලුව; න විහරන්ති, නොවසන්නාවූද; සත්තෙ, සතුන්; අද්දසාඛෝ, දුටුසේක්මය; සෙය්‍යථාපිනාම, යම්සේ නම්; උපපලිනියං වා, උපුල් වන යක හෝ; (උපපලිනී ශබ්දයෙන් පැලැටි හෝ ජලාශය කියනු ලැබේ, මෙහිදී ජලාශය අභිප්‍රේතයි, එබැවින් උපුල්වනයෙහිය යන අර්‍ථය ගත යුතු. **"උපලානි එත්ථ සන්තීති උපලිනි, ගච්ඡොපි ජලාසයොපි; ඉධ පන ජලාසයෝ අධිප්පෙතෝ, නඞ්ගා උපලිනියන්ති උපලව නෙති එවමත්ථෝ ගහෙතබ්බෝ"** යනු සාරත්‍ථදීපනී ටීකාවයි) පදුමිනියං වා, පියුම් වනයක හෝ; පුණ්ඩරීකිනියං වා, හෙලපියුම් වනයක හෝ; අපෙපකවානි, සමහර; උපලානි වා, උපුල් හෝ; පදුමානි වා, පියුම් හෝ; පුණ්ඩරීකානි වා, හෙල පියුම් හෝ; උදකෙ, දියෙහි; ජාතානි, හට ගත්තාහු; උදකෙ, දියෙහි; සංවඩ්ඪානි, මොනවට වැඩුනාහු; උදකා, දිය

ලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවද්ධා නි සමොදකං ඨිතානි, අපෙකචවානි උපපලානි වා පදුමානි වා පුණ්ඩ රීකානිවා උදකෙ ජාතානි උදකෙ සංවද්ධානි උදකා අච්චුග්ගම්ම තිඨන්ති අනුපලිත්තානි උදකෙන එව මෙව භගවා බුඩවකඛුනා ලොකං ඔලෝ කෙත්තා අද්දස සත්තෙ අපරජකෙ මහාරජකෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ සවාකාරෙ වාසාරෙ සුවිඤ්ඤපයෙ දුවිඤ්ඤපයෙ අපෙපකවෙව පරලොකවජ්ජභයදස්සාවිනො විහරන්තෙ අපෙපකවෙව න පරලොක වජ්ජභයදස්සාවිනො විහරන්තෙ දිසවාන බ්‍රහ්මානං සහම්පතිං ගාථාය පච්චභාසි.

නොරෙන්; අතුග්ගතානි, නොනික්ඛන්නානුග්; අන්තො, ඇතුළත; නිමුග්ග පොසිනි, ගැලී (වැඩෙන්නානුග්) මුග්ගතරන්නානුග් වෙත්ද; අපෙකචවානි, —පෙ— සමොදකං, දියසමව; (ජලමට්ටමේහි) ඨිතානි, සිටියානුද; අපෙ කචවානි—පෙ— උදකා, දිය කෙරෙන්; අච්චුග්ගම්ම, උඩටනැඟී; උදකෙන, දිය හා; අනුපලිත්තානි, නොදූවට්ටනානුග්; තිඨන්ති සිටින් ද; එවං එව, එප රිද්දෙන්ම; භගවා, භාග්‍යවතුන් වහන්සේ; බුඩවකඛුනා —පෙ— විහර නෙත (කිසේ අජී දතයුග්) දිසවාන, දැක; සහම්පතිං බ්‍රහ්මානං, සහම්පති බ්‍රහ්මයාට; ගාථාය, ගයක්; පච්චභාසි, නැවත වදාළසේකි. (මෙහි පියුම් සිවිකොටසෙකි. දිය ඉක්මවා දිය හා නොදූවටි සිටි පියුම්ද දිය සම සමව සිටි පියුම්ද දිය මතු බලා එමින් දියතුළ සිටි පියුම්ද දිය මතුවට නොපැමිණ දියතුළම මස්කැසුබුවන්ට ගොදුරුවන පියුම් දැසි යන මොහු වෙති, මින් පළමුවෙනි කොටසට අයත් දිය ඉක්මවා සිටි පියුම් එදවස පිපෙන්නාවූ තිරුරැස් පහස බල බලා සිටියෝ වෙති, දිය සම සමව සිටි පියුම් දෙවෙනි දින විකසිතවන්නෝ වෙති, දිය මතු බලා එමින් සිටි පියුම් තුන්වෙනි දින විකසිතවන්නෝ වෙති, දිය මතු බලා නොඑමින් සිටි ලෙඩ සහිත පියුම් මස්කැසුබුවන්ට ගොදුරුවන්නෝ වෙති, මෙකී සිව් ආකාර පියුම්වැනි උග්ඝටිතඤ්ඤය විපචිතඤ්ඤය ඤෙය්‍යය පදපරම යකි පුද්ගලයෝද සතරදෙනෙක් වෙති, යම් පුද්ගලයකුගෙට උදාහරණ සහිතව දහම් දෙසුකල නිවන් අවබොධය වේද මේ සතරසති පට්ඨානය යනාදි නයින් සංක්ෂිප්ත නයින් මාතෘකා දක්වනු ලැබූකල දෙසනානු සාරයෙන් තුවණ යවා රහත්බැව් ගැනීමට සමත්වූ මේ පුද් ගල තෙමේ උග්ඝටිතඤ්ඤ නම්, යම් පුද්ගලයකුගෙට සැකෙවින් දෙසූ ධර්ම යාගේ විස්තර නයින් අර්ථය බෙදනු ලබන කල නිවන් අවබොධ වේද මේ පුද්ගල තෙම විපචිතඤ්ඤ නම්, උදෙසන්නාවූ නැවත නැවත පිළි විසින්නාවූ තුවණින් මෙනෙහි කරන්නාවූ කලණ මිතුරන් සෙවනය භජනය පයිරුපාසනය කරන්නාවූ යම් පුද්ගලයෙකුගෙට පිළිවෙළින් නිවන් අවබොධ වේද, මේ පුද්ගල තෙම ඤෙය්‍ය නම්, බොහෝ අසන් නාවූද බොහෝ කියන්නාවූද බොහෝ දරන්නාවූද බොහෝ උපසංහ කරන්නාවූද යම් පුද්ගලයෙකුගෙට ඒ අත්බැවිහි නිවන් අවබොධය නොවේද ඒ අත්බැවින් මාණියක් හෝ ඵලයක් හෝ යවත්පිරිසෙසින්

අපාරුතා තෙසං අමතස්ස වාරා
යෙ සොතවඤ්ඤා පමුඤ්චන්තු සද්ධං
විහිංසසඤ්ඤී පඨුණං න භාසිං
ධම්මං පණීතං මනුජෙසු බ්‍රහෙති.

අථ ඛො බ්‍රහ්මා සහම්පති කතාවකාසොඛොමනි භගවතා ධම්මදෙසනායාති භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායි.

බ්‍රහ්මායාචනකථා නිට්ඨිතා.

උපජ්ඣායස්සකම්මං න කරෙය්‍ය ලහුතාය වා පරිණාමෙය්‍යාති, කතං වා පනස්ස හෙති සඞ්ඝෙන කම්මං තජ්ජනීයං වා නියස්සං වා පබ්බාජනීයං වා පටිසාරණීයං වා උක්ඛෙපනීයං වා, සද්ධිවිහාරිකෙන උස්සුක්කං කාතබ්බං— කින්නිත්‍ථුඛෝ උපජ්ඣායෝ සම්මා වත්තෙය්‍ය ලොමං පාතෙය්‍ය නෙත්‍ථාරං වත්තෙය්‍ය සඞ්ඝා තා කම්මං පටිප්පස්සම්භෙය්‍යාති.

සචෙ උපජ්ඣායස්ස විවරං ධොවිතබ්බං හොති සද්ධිවිහාරිකෙන ධොවිතබ්බං, උස්සුක්කං වා කාතබ්බං— කින්නිත්‍ථුඛෝ උපජ්ඣායස්ස විවරං ධොවිස්සථාති. සචෙ උපජ්ඣායස්ස විවරං කාතබ්බං හොති සද්ධිවිහාරිකෙන කාතබ්බං, උස්සුක්කං වා කාතබ්බං— කින්නිත්‍ථුඛෝ

හෝ; පටිසාරණීයං තම්මං වා, ගිහින්ට ජාත්‍යාදීන් ගරා බණින භික්ෂූන්ට කළයුතු පටිසාරණීය කර්ම්ය හෝ; උක්ඛෙපනීයං කම්මං වා, ආවැත් නොදුනීම් ආදි කරුණු තුනකින් යුත් භික්ෂූන්ට කළයුතු උක්ඛෙපනීය කර්ම්ය හෝ; කත්‍තුකාමෝ හොති —පෙ- උපාධ්‍යායයන් වහන්සේ හට; කම්මං න කරෙය්‍ය, කර්ම් නොකරන්නේද; ලහුතාය වා, ලහුභාවය (උක්ඛෙපනීය කර්ම්ය වලකා තජ්ජනීය කර්ම්ය හෝ නියස්ස කර්ම්ය කරනු) පිණිස හෝ; පරිණාමෙය්‍ය ඉති, (සඟන ලවා) පිරිණැමවන්නේදැයි; අසුං උන්වහන්සේහට; සඞ්ඝෙන, සඞ්ඝයා විසින්; තජ්ජනීයං කම්මං වා, භණ්ඩනාදිය කරන භික්ෂූන්ට කළයුතු තජ්ජනීය කර්ම්ය හෝ; නියස්සං කම්මං වා —පෙ— කතං වා පන හොති, කරනලද්දේ හෝ වේද; සද්ධිවිහාරිකෙන —පෙ— සම්මා වත්තෙය්‍ය, මනාකොට පවතින්නේ ද; ලොමං පාතෙය්‍ය, භික්ෂූන්ට ගරත්ව පවතින්නේද; නෙත්‍ථාරං වත්තෙය්‍ය, (යම් ආකාර ප්‍රතිපත්තියක් සම්පූර්ණ කිරීමෙන් ඒ කර්ම්ය නිදහස්කාරම් ගැනීම හෝ ඉන් නිදහස් වීම හැකිනම් එබඳුවූ න උපසම්පාදෙති න නිස්සයං දෙති. යනාදීන් සුලුවගෙහි දැක්වූ අටළොස් වැදෑරුම් වත් සම්පූර්ණ කිරීමෙහි මනාකොට පවතින්නේ ද; ("නෙත්‍ථාරං වත්තනන්‍තීති නිත්‍ථරන්තානං එතනන්‍ති නෙත්‍ථාරං, යෙන සක්කා නිස්සාරණා නිත්‍ථරිතුං, තං අත්‍ථාරසවිධා සම්මා වත්තං වත්තනන්‍තීති අත්‍ථෝ" යනු විතය අටුවාහි) සඞ්ඝෝ, සඞ්ඝ තෙම; තං කම්මං, ඒ (තජ්ජනීයාදි සඞ්ඝ) කර්ම්ය; පටිප්පස්සම්භෙය්‍ය ඉති, සන්සිඳුවන්නේදැයි; (සඟන උපාධ්‍යායයන්හට කර්ම්යක් කරන්ට සූදානම්වන අතර එක එක නමක් පාසා හොස් සවාමිනි අපගේ උපාධ්‍යායයන්හට කර්ම් නොකළමානවැයි යාච්ඤා කළයුතු එසේත් වළකාලිය නොහැකිව කරු කර්ම්යක් (උක්ඛෙපනීය කර්ම්ය) කරන්ට සූදානම් විට එය වළඤා තජ්ජනීය – නියස්සකර්ම්දි ඊට වඩා ලඝු කර්ම්යක් කරනසේ ඉල්ලීම ලහුභාවය පිණිස පිරිණැමවා ගැන්මය. ඉක්බිති සඟන විසින් යම් කිසි කර්ම්යක් කරනලද නම් උපාධ්‍යායයන් ලවා සඟන සතුටු වනසේ පැවතුම් ඇතිකරවා කැවන උඩරණය කරනු පිණිස භික්ෂූන්ට යාච්ඤා කොට මඟසඟන ලවා කර්ම්ය සන්සිඳවියයුතු.)

උපජ්ඣායස්ස චීවරං කරියෙථාති. සචේ උපජ්ඣායස්ස රජනං පච්චතබ්බං හොති සඬ්විහාරිකෙන පචිතබ්බං, උස්සුක්කං වා කාතබ්බං— කින්ති නු ඛො උපජ්ඣායස්ස රජනං පච්චෙථාති. සචේ උපජ්ඣායස්ස චීවරං රජෙතබ්බං හොති සඬ්විහාරිකෙන රජෙතබ්බං, උස්සුක්කං වා කාතබ්බං— කින්ති නු ඛො උපජ්ඣායස්ස චීවරං රජ්ජෙථාති. චීවරං රජනෙනන්ත ඇඩ්ඪකං සමපරිවත්තකං සමපරිවත්තකං රජෙතබ්බං, තච අවජ්ජෙත්වා එවෙව උක්කමිතබ්බං.

න උපජ්ඣායං අනාපුච්ඡා එකචචස්ස පත්තො දාතබ්බො, න එකචචස්ස උත්තො පටිග්ගහෙතබ්බො. න එකචචස්ස චීවරං දාතබ්බං, න එකචචස්ස චීවරං පටිග්ගහෙතබ්බං. න එකචචස්ස පරික්ඛාරො දාතබ්බො, න එකචචස්ස පරික්ඛාරො පටිග්ගහෙතබ්බො න එකචචස්ස කෙසා ඡෙත්තබ්බා, න එකවෙචන කෙසා ඡෙදාපෙතබ්බා. න එකචචස්ස පරිකම්මං කාතබ්බං, න එකවෙචන පරිකම්මං කාරාපෙතබ්බං. න එකචචස්ස වෙය්‍යාවච්චො කාතබ්බො, න එකවෙචන

සචෙ, ඉඳින්; උපජ්ඣායස්ස, උපාධ්‍යායයන් වහන්සේගේ; චීවරං, සිවුරක්; ධොවිතබ්බං හොති, සේදිය යුතු වීනම්; සඬ්විහාරිකෙන, සඬ්විහාරිකයා විසින්; ධොවිතබ්බං, සේදිය යුතු; උස්සුක්කං වා කාතබ්බං, උත්සාහ හෝ කටයුතු; කින්ති නු ඛො, කිනම් උපායකින්; උපජ්ඣායස්ස, උපාධ්‍යායයන් වහන්සේගේ; චීවරං, සිවුර; ධොවියෙථ ඉති, සොදනු ලබන්නේ දැයි; සචෙ —පෙ— කාතබ්බං හොති, කටයුතු වීනම්; සඬ්විහාරිකෙන — පෙ— කරියෙථ ඉති, කරනු ලබන්නේ දැයි; සචෙ —පෙ— රජනං, පඬු; පච්චතබ්බං හොති, පිසිය (තෑම්බිය) යුතු වීනම්; සඬ්විහාරිකෙන — පෙ— පචියෙථ ඉති, පිසනු ලබන්නේ දැයි; සචෙ —පෙ— චීවරං, සිවුරක්; රජෙතබ්බං හොති, පඬුපෙවිය යුතු වීනම්; සඬ්විහාරිකෙන —පෙ— රජ්ජෙථ ඉති, පඬුපොවනු ලබන්නේ දැයි; චීවරං රජනෙනන්ත, සිවුර පඬු පොවන්නහු විසින්; ඇඩ්ඪකං, මනාව; සමපරිවත්තකං සමපරිවත්තකං, පෙරළ පෙරලා; රජෙතබ්බං, පඬුපෙවිය යුතු; එවෙව, දිගඹිඳු; අවජ්ජෙත්වා, නොසිඳුනු කලැ; තච පක්කමිතබ්බං, නොහැයුතු

උපජ්ඣායං, උපාධ්‍යාය තෙරුන්; අනාපුච්ඡා, නොවිචාරා; එකචචස්ස, (විසභාග) කිසිවෙකුගට; පත්තො, පාත්‍රයෙක්; න දාතබ්බා, නොදිය යුතු; එකචචස්ස, (විසභාග) කිසිවෙකුගේ; පත්තො, පාත්‍රයෙක්; න පටිග්ගහෙතබ්බා, නොපිළිගත යුතු; එකචචස්ස — පෙ— පරික්ඛාරො පිරිකරෙක්; න පටිග්ගහෙතබ්බා —පෙ— කෙසා, කෙසයෝ; න ඡෙත්තබ්බා, නොකැපිය යුත්තාහ; එකවෙචන, කිසිවකුලවා; කෙසා, කෙස ඉයෝ; න ඡෙදාපෙතබ්බා, නොකපවා ගතයුත්තාහ; එකචචස්ස, කිසිවකුගේ; පරිකම්මං, පරිකර්ම; නකාතබ්බං, නොකටයුතු; එකවෙච්ච

වෙය්‍යාවච්චෙ කාරාපෙතබ්බා. න එකච්චස්ස පච්ඡාසමණෙන හොතබ්බං, න එකච්චෙ පච්ඡාසමණෙ ආදාතබ්බා, න එකච්චස්ස පිණ්ඩපාතො නීහරිතබ්බො, න එකච්චෙන පිණ්ඩපාතො නීහරාපෙතබ්බා. න උපජ්ඣායං අනාපුච්ඡා ගාමො පවිසිතබ්බෙ, න සුසානං ගන්තබ්බං, න දිසා පක්කමිතබ්බා, සච්චෙ උපජ්ඣායො ගිලානො හොති යාවජීවං උපට්ඨාතබ්බා වුට්ඨානමස්ස ආගමෙතබ්බන්ති.

උපජ්ඣායවත්තං නිට්ඨිතං.

කිසිවකුලවා; පරිකම්මං, පරිකම්ම; නකාරාපෙතබ්බං, නොකරවාගතයුතු; එකච්චස්ස, කිසිවක්හට; වෙය්‍යාවච්චෙ, වතාවත්; න කාතබ්බා, නොකටයුතු; එකච්චෙන, කිසිවකුලවා; වෙය්‍යාවච්චෙ, වතාවත්; න කාරාපෙතබ්බා, නොකරවාගත යුතු; එකච්චස්ස, කිසිවක්හුගේ; පච්ඡාසමණෙන, පසු මහණක්හු විමෙන්; නහො තබ්බං, නොවිය යුතු; එකච්චෙ, කිසි; පච්ඡාසමණෙ, පසු මහණෙක්; න ආදාතබ්බා, නොගත යුතු; එකච්චස්ස, කිසිවක්හුගේ; පිණ්ඩපාතො, පිණ්ඩපාතය; නනීහරිතබ්බෙ, බැහැර නොකට යුතු; එකච්චෙන, කිසිවකුලවා; පිණ්ඩපාතො, පිණ්ඩපාතය; නනීහරාපෙතබ්බා, බැහැරකරවීම නොකටයුතු; උපජ්ඣායං අනාපුච්ඡා, උපාධ්‍යාය තෙරුන් නොඳිවාරා; ගාමෙ න පවිසිතබ්බෙ, (පිඬුසිඟා හෝ වෙනයම් කටයුත්තක් නිසා) ගම්නොවැදියයුතු; සුසානං න ගන්තබ්බං, (විසිම පිණිස හෝ අශුභ දර්‍ශනය පිණිස) සොහොනට නොයායුතු; දිසා න පක්කමිතබ්බා, දික්නොයායුතු; සච්චෙ, ඉදින්; උපජ්ඣායො, උපාධ්‍යාය තෙම; ගිලානො හොති, ගිලන්වීනම්; යාවජීවං, දිවිහිමියෙන්; උපට්ඨාතබ්බා, උපස්ථාන කටයුතු; අස්ස, උන්වහන්සේගේ; වුට්ඨානං, නැගී සිටීම; ආගමෙ තබ්බා ඉති, බලාපොරොත්තු වියයුතු.

උපජ්ඣායවත්තං, උපාධ්‍යායවත්ත;
නිට්ඨිතං, නිමවී.

—:÷:—

විසඳුම.

සඞ්විභාරිකයන් හා ශ්‍රද්ධිවිහාරිකයන්ගේ ප්‍රභේද.

සඞ්විභාරිකයෝ නම් උපාධ්‍යාය තෙරුන් හා එක්ව නෙත නිබඳ හැසිරෙන්නෝය, උපාධ්‍යාය තෙරුන්ගේ මෙහෙකරු මහණහුය, ඔවුහු වනාහි උපසම්පන්න භෙරණුන්ද යයි විදුසාර වෙත්, එහෙයින් කියනලදි:— "සඞ්විභාරිකොනි උපසම්පදෙහා වා හොතු සාමණෙරෙ වා යො උපජ්ඣං ගණ්හාති සො සඞ්විභාරිකො නාම" යි ඔවුනතුරෙහි උපසපන් සඞ්විභාරිකයෝ නිසෙන් මිදුනෝය සාමිදුනෝ යයි විදුසාර වෙත්, උපාධ්‍යායවත් නොකරන සැටවයස්වූ ද නොගිලන් ඒ දෙපක්‍ෂයෙහි සඞ්විභාරිකයන් වම් මහවඟ පෙළෙහි උපාධ්‍යායවත් දක්වා වදුළ බුදුරදුන් "දන්තකට්ඨං දාතබ්බං" යි වදුළසැන ඔබ "නව අවජිත්තෙ ථෙවෙ පකාමිතබ්බං" යන්න අවසන් කොට ඇති වත් කඩකිරීම නිසා එකක් පාසා දුකුළා ඇවැත්වේ.

"න උපජ්ඣායං අනාපුච්ඡා එකවස්සා පතෙතා දාතබ්බා" යන්න පවන් "සචෙ උපජ්ඣායො ගිලානො හොති යාවජීවං උපට්ඨානබ්බා වුට්ඨානම්පි ආගමෙතබ්බං" යන්න අවසන් කොට ඇති එනම් උපාධ්‍යාය තෙරුන් නොවිචාරා පාත්‍රයක් දීම හෝ ගැනීමද සිවුරක්දීම හෝ ගැනීමද අන් පිරිකරක්දීම හෝ ගැනීමද හිසකේ කැපීම හෝ කප්පවා ගැනීමද පරිකම් කිරීම හෝ කරවා ගැනීමද වතාවත් කිරීම හෝ කරවා ගැනීමද පසුමහණවීම හෝ පසුමහණක් කරවා ගැනීමද පිණ්ඩපාතය බැහැරකිරීම හෝ කරවීමද ගම්වදිනාකල හා සොහොනට යනාකලත් ඒ ඒ දිසාවන්කරා පැමිණෙන කලත් විචාරීමද ලෙඩවූකල සුවවනතුරු උවටැන් කිරීමද යන මේ වත් නිසෙන් නොමිදුනු සඞ්විභාරිකයන්ට වෙසෙසින් නියම වේ, එබැවින් මේ වත් කඩකරන ඔවුනට එකක් පාසා දුකුළා ඇවැත් වේ. සාමණෙර සඞ්විභාරිකයන්ට පළමුකිවත් හා පසුව කිමේවත්ද යන දෙපක්‍ෂයම සාධාරණ වේ, එසේ හෙයින් ඒ දෙපක්‍ෂයේ වත් අතුරෙන් යම්කිසි වතක් කඩකළ විට එකක් පාසා වත්බිඳීම වන්නේය.

දීම හා ගැනීම වැළැක්වීමට හෙතු.

"න උපජ්ඣායං අනාපුච්ඡා එකවස්සා පතෙතා දාතබ්බා" යන්න පවන් "න එකවෙච්ඡා පිණ්ඩපාතො නීහරාපෙතබ්බා" යන්න දක්වා දීම හා ගැනීම වළකනලද්දේ ඔවුනොවුන් අතර ඇතිවන කුදුමහත් විසවුල් වළක්වා සමගි දහම් දියුණු කරනු පිණිස වේ, යම්කිසි තෙරනමකට හෝ තෙරහමක් ඇටහ වසන සඞ්විභාරිකයන්ට අනික් තෙරනමක් ඇසුරු කරන සඞ්විභාරිකයන් පාත්‍රා දිය දීම දුටුකල ඔවුන්ගේ සිත්ගෙන තමන්ගෙන් අග්වනු පිණිස එසේ කරනවා යයි කුකුස් ඇතිවී ඔවුනොවුන් කෙරේ පවත්නා සමගි දහම්

හානිවීමෙන් වියවුල් හටගන්නේය, එසේ කෙසින් තම තමන්ගේ උපාධ්‍යායන් විසාරීම අනුදැන වදළසේක. තවත් යටත වසන සද්ධිවිහාරිකයන් අන් මහණුන්ගෙන් පාත්‍රාදි පිරිකර ගැනීම දුටු කල තමන්ව අවමන් වශයෙන් හෝ තමන්ගෙන් බැහැරවීම් අටියෙන් එහේ කරතවා ගයි සලකා සිත් දුම්‍යවන්නේය, ඒ වළකනු පිණිස නොවිසාරා ගැනීමද තහනම් කරනලදී. මේ දීම හා ගැනීම වළකනලද්දේ උපාධ්‍යාය තෙරුන්ට විසහාගවූ ගුණයෙන් සමවූ ලජ්ජිවූ හෝ අලජ්ජිවූ උපාධ්‍යාය තෙරුන්ගේ දියුණුව තුරුස්තා මහණුන් සමගය, උපාධ්‍යාය තෙරවනාහි අලජ්ජියෙක්ව අවවාද පවා නොපිළිගතිනම් ඔහු අතහැර ඔහුට විසහාගවූද ලජ්ජිභික්ෂූන් හා ආමිසාදි පරිභොගය වැරදී කොවේ, උපාධ්‍යාදි ශාවකට වඩා ලජ්ජිභාවය ගරුකටයුතුමය.

ගම්වැදීම-සොහොණහි විධිම දනව් සැරිසැරීම විවාරිමට කරුණු.

ගම්වැසි මිනිසුන්ගේ ගුණාගුණ හා ගම්නි කැසිරිමට සුදුසු නුසුදුසු කාලවෙලාද ගොවර සථාන හා අගොවර සථානද නිසිසේ දන්නෝ මහතෙරවරුමය එබැවින් උපාධ්‍යාය තෙරුන් විවාරා ගම්වැදීම් අනුදන්නා ලදි, පිවුසිහා යනකල පවා විවාරිම වටී, බැහැරකට ගොස් නාකල පිවුසිහා නික්ම යනවිට අතර මගදිපවා විවාරිම සුදුසුවේ සෙසු කරුණුගැන කියනු කිම. සොහොන්හි වසනවුන්ට අමනුෂ්‍යයන් හා රජුන්ගෙන් පීඩා ඇතිවේ, එය වළකනු පිණිස උපාධ්‍යාය තෙරුන් විවාරා සොහොනට යාම අනුදත්සේක, ඒ එසේමය සොහොන්හි වසන මහණුන්ව බැදුම් පිලිස්සුම් දෙය හා කැවුම් තලමුරුවට ආදි අමනුෂ්‍යයන් කැමති කැවිලි වගී අනුභව කිරීම දවල් කිදීම යන මේ කරුණුද අලසවීම හා ශ්‍රද්ධා නැතිවීමත් නිස්කතා ආදියෙන් කල් යැවීමත් නොවටී, මෙකී කරුණු වලින් වැලකිකල අමනුෂ්‍යයන්ගෙන් පීඩා නොවන්නේය. බුදු සොරුන් සොරහු හිමියන් ලුහුබැඳ එන කල හෝ වෙනයම් පීඩාවක් පැමිණි කල සොහොනෙහිදමා යන්නාහ, බුදු සොයායන්නෝ බුදුදහ සොහොනෙහිවසන මහණුන්කෙරේ සැක උපදවත්, මහතෙරුන් සාක්ෂිවීමෙන් සැකදුරු වන්නේය, මෙසේ අමනුෂ්‍යයන්ගෙන් හා රජුන්ගෙන් පැමිණෙන බිය මහතෙරුන් විවාරිම නිසා දුරු වේ.

කලින් කල ඒ ඒ දිසාවන්හි සෘතුපෙරලීමෙන් ජනපදරොගාදීහු හටගනිත්, යම් යම් කාලවල යම් යම් සෘතුවල ඒ ඒ දනවුහි හටගන්නා රොගාදිය මහතෙරහු දන්නාහ, උන්වහන්සේලා විවාරිම නිසා කිදුකින් දනව් සැරිසැරීම හෝ දනව්වක විසීම නෝ පහසුවන බැවින් මහතෙරුන් නොවිසාරා දනව් සැරිසැරීම තහනම් කරනලදි ඒ එසේ නවුදු තම දියුණුව සඳහා යම් දිසාවකට යන්න කල තමන් යන කටයුත්ත කිසා තෙව රක් ආවිඤ්ඤ කොටත් අවසර නොලැබිනම් ඔහු ඇසුරුකිරීමෙන් ආගම වශයෙන් හෝ අධිගම වශයෙන් දියුණුවකුත් නැතිනම් සෙතෙම බාල අව්‍යක්තයෙක්ම හුදෙක් තමන් වෙත නවතා ගනු කැමැත්තෙන් අවසර නොදේ නම් ආඥාදි දියුණුව සලකා ගමන වැරදී නොවේ.

දූහැපි දීම නම්- මහත් දූහැපිය මධ්‍යම දූහැපිය කුඩා දූහැපි දීම. දූහැපිය යන තුන්වර්ගයෙන් දූහැපි තුන බැගින් පිළිවෙළින් තුන්දිනක් දීමය, යම් වර්ගයක දූහැපිවක් ඒ තුන්දිනෙහිම භාරගත්තේ නම් සිව්වෙනි දින පටන් එබඳු දූහැපිවක්ම දීමද නියමයක් නැතිව ඒ තුන්වර්ගයෙන් යම්කිසි දූහැපිවක් දිළිඳුන්ගේ නම් තමන්ට ලදපරිදි දූහැපිවක් දීමද වටී, දූහැපිවක අති විසාල පමණ අඟල් අටකි කුඩාම පමණ අඟල් සතරෙකි.

මුව දෙනා පැන් දීම නම්- උදය මුවපිරිසිදු කරනු මුව දෙනා පැන් දීම. පිණිස පැන් එළවීමයි, ඒ වතාහි ඇල්පැන් උනුපැන් යන දෙවර්ගය පිළිවෙළින් තෙදිනක් දීම වටී, ඒ තුන්දිනෙහිම යම් වර්ගයක පැන් ප්‍රයෝජනයට ගත්තේ නම් සිව්වෙනි දින පටන් එම වර්ගයේ පැන් දියයුතු, නියම නැතිව ප්‍රයෝජන ගනීනම් ලැබුනු පරිදි පැන්වර්ගයක් දීමද දෙවර්ගයම ප්‍රයෝජන ගනීනම් දෙවර්ගයම දීමද වටනේය.

ජනතාඝරය නම්- සිරුරු පිළිඅම් පිණිස කරනලද ජනතාඝර. ගෙයයි. * බොහෝ ශීතල (සිනි) ඇති ප්‍රදේශවල ඒ හෙතුවෙන් හටගත් රෝගපීඩාදීන්ගේ වැළැක්වීම පිණිස සිරුරු ඔඟදිය බැහැරකරමින් සනාතඝකරන ශිනිරස්නය ඇති ගෘහය වේ, එහි වතාහි අඞ්ගාරයෙන් වැසුනු හෙයින් බොහෝදෙනා විහන්සේද එකවිට පිවිස සිවුරු තබා ශිනිදුවිල්ලෙන් හටගත් දෙස් දුරලනු පිණිස මුඛයෙහි මැටි ආලෙප කොට සිරුර කැමතිනාක් සේදීම කරමින් සුණු ආදියෙන් උලා නැම කෙරෙත්. එහෙයින් විතයාලඞ්කාරයෙහි කියන ලදි— "ජනතාඝරං ඝි නාම සිවඝාතබහුඤ්ඤු දේසෙසු තාපසවවස රොගපිලාදිනිවාරණත්ථං සරීරසෙදපනයනට්ඨානං, තත්ථකිර අඞ්ගාරපවිඣනනනාය බහූනි ඵලකානි පවිසිත්වා විවරං නිත්තිපිත්වා අග්ගිකාපපතිභාගඤ්ච මත්තිකාය මුඛං ලිම්පිත්වා සරීරං සාවදනථං සෙදෙත්වා සෙදෙත්වා සුණ්ණාදිහි උබ්බට්ටෙත්වා නහායන්ති" යි. මේජනතාඝරය කළුවරගෙයක් හා එහි එකවිට බොහෝදෙනා වහන්සේ පිවිස සනාතඝ කරනබැවි පාරාජික පාළියෙහුත් පෙණේ. "යෙන බෝ පන සමයෙන ආයස්මා ආනන්දෝ ජනතාඝරෙ අඤ්ඤතරස්ස භික්ඛුනෝ අත්තනාවාසඤ්ච අත්තනෝති මඤ්ඤමානෝ නිවාසෙසි, අථ බෝ සෝ භික්ඛු ආයස්මන්තං ආනන්දං එතදවෝච, කිස්ස මෙ ත්වං ආවුසෝ ආනන්ද අත්තනාවාසඤ්ච නිවාසෙසීති. සඤ්ඤාදි අහං ආවුසෝති. භගවතෝ එතමත්ථං ආරොචෙසුං, අනාපත්ති භික්ඛවෙ සඤ්ඤාදිස්සා" යනුයි. මෙහි සංක්ෂෙප භාවය නම්:- ආයුෂ්මත් අනඳතෙරණුවෝ ජනතාඝරයට පිවිස සනාතය කොට නික්මෙනසේක්

---

* ජායතීති – ජං, සරීරයයි, ජං තායති රක්ඛතීති – ජනතා, පිළිඅම යයි, ඝයාතෙති – ඝරං, නිවෙස්නයි, ජනතාය සරීරකිරියාය කතං ඝරං – ජනතාඝරං.

තමන්නේය යන කල්පනායෙන් අන් මහණක්හුගේ අදහස හැඳගෙන නික්මුනාහ, අදහස අයිති මහණ දුක තම අදහස සොරා ගත්තේ යයි බුදුරදුන් ඉදිරියට ගොස් සැලකෙළේය, එවිට සම්බුදුරජාණන් නඩුව ඒසඳනසේක් තමන්නේය යන කල්පනායෙන් ගත්තෙයින් අනාපත්ති යයි විසඳ වදාළසේක යනුයි.

පරිවාස නම්- ගරුකාපත්තිවලට පැමිණ ඇවැත් ප්‍රතිවිජ්ඤා කළ භික්ෂූන්ට ඉන් නිදහස්වනු පිණිස දඬුවම් වශයෙන් මහඝඝන විසින් දෙනු ලබන වතකි, හේ වනාහි අපටිච්ඡන්න පරිවාසය පටිච්ඡන්න පරිවාසය සුඛන්ත පරිවාසය සමෝධානපරිවාස යයි සිව්වැදෑරුම් වේ, එහි "යෝ භික්ඛවෙ අඤ්ඤතරං අඤ්ඤතිත්ථියං පුබ්බෙඛා ඉමස්මිං ධම්මවිනයෙ ආකඞ්ඛති පබ්බජ්ජං ආකඞ්ඛති උපසම්පදං තස්ස චත්තාරෝ මාසෙ පරිවාසෝ දාතබ්බෝ," යි මේසේ වදාළ අන්‍ය තීර්ථික පරිවාසය අපටිච්ඡන්නාපරිවාස නම් වේ, ඒ මෙහිදී අභිමත නොවේ, පටිච්ඡන්නාපරිවාසය නම් ඇවැත් ප්‍රතිවිජ්ඤා කළ භික්ෂූන්ට දෙන පිරිවෙස වේ, සුඛන්තපරිවාසය නම් දින ගණන නොදන්නාවූ හෝ එහි විමතියට පත් මහණහට දෙන පරිවාසය වේ. එක්කොට දෙන පිරිවෙස සමෝධාන පරිවාස නම්. එහි පටිච්ඡන්න පරිවාසය දෙන සඟන විසින් ප්‍රතිවිජ්ඤා දින ගණන හා ඇවැත් ගණන තත් විමසා තදනුරූප පරිදි දියයුතු එක් ඇවැතක් එක් දිනක් ප්‍රතිවිජ්ඤා වීනම් "අහං භන්තෙ එකං සඞ්ඝාදිසෙසං ආපත්තිං ආපජ්ජිං එකාහපටිච්ඡන්නං, සොහං භන්තෙ සඞ්ඝං තස්සා ආපත්තියා එකාහ පටිච්ඡන්නාය එකාහපරිවාසං යාචාමි" යි මෙසේ තෙවරක් යාච්ඤා කරවා "සුණාතු මෙ භන්තෙ සඞ්ඝෝ අයං ඉත්ථන්නාමෝ භික්ඛු එකං සඞ්ඝාදිසෙසං ආපත්තිං ආපජ්ජි එකාහපටිච්ඡන්නං" යනාදීන් සුදුවගෙහි ආකාසීන් ඤත්තිචතුත්ථකම්වාක්‍යයෙන් පරිවාසය දියයුතු

දිනවශයෙන් විහපටිච්ඡන්නා යනාදීන් තුදුස්දින දක්වා දිනනාම යෙන්ද පසළොස්දිනක් වීනම් පක්ඛපටිච්ඡන්නා කියාද දැසයවෙනි දින පටන් විසිනවවෙනි දිනදක්වා අතිරෙකපක්ඛපටිච්ඡන්නා කියාද තිස් දිනක් වීනම් මාසපටිච්ඡන්නං කියාද තිස්එක්වෙනි දිනපටන් පනස් නවවෙනි දින දක්වා අතිරෙකමාසපටිච්ඡන්නා කියාද හැවදිනක් පිරුනු කල වෙමාස පටිච්ඡන්නං කියාද හැවඑක්වෙනි දිනපටන් තුන්වෙනි මාසය පිරෙන දිනදක්වා අතිරෙක වෙමාසපටිච්ඡන්නං කියාද මාඝතුන පිරුනුකල තෙමාසපටිච්ඡන්නං කියාද යනාදි වශයෙන් එකොළොස් වෙනි මාසය අවසන්නොට යෙදියයුතු, අවුරුද්ද පිරුණුකල එකසංවච්ඡරපටිච්ඡන්නං කියාද එතැන්සිට දැවුරුද්ද පිරීම දක්වා අතිරෙක සංවච්ඡරපටිච්ඡන්නං කියාද දෙවෙනි අවුරුද්ද පිරුණුකල වෙසංවච්ඡර පටිච්ඡන්නං කියාද යෙදියයුතු, ඉදිරියටත් කී නයින් දතයුතු.

ඇවැත් දෙකක් විතම් වෙ ආපත්තියො පටිවජ්ජන්නායො කියාද තුනක් විනම් තිස්සො ආපත්තියො පටිවජ්ජන්නායෙ කියාද ඉන් වැඩිවූ කල සියයක් හෝ දහක් විනමුත් සමඟහුලා ආපත්තියෙ පටිවජ්ජන්නා යො කියාද යෙදියයුතු, නානාවසතුන ඇවැත්වූකල "අහමහනෙන සමඟහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියෙ ආපජ්ජිං එකං සුක්කවිසට්ඨිං එකං කායසංසග්ගං එකා දුට්ඨුල්ලවාචං එකං අත්තකාමං එකං සංවරිත්තං එකාහපටිවජ්ජන්නායෙ" යි මෙසේ ගණන් වශයෙන් හෝ "අහමහනෙන සමඟහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියෙ ආපජ්ජිං නානාවත්ථුකායෙ එකාහ පටිවජ්ජන්නායෙ" යි මෙසේ වසතුකිරීන වශයෙන් හෝ "අහමහනෙන සමඟහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියෙ ආපජ්ජිං එකාහපටිවජ්ජන්නායෙ" යි මෙසේ නාමමාත්‍ර වශයෙන් හෝ යෙදීම වටී.

එහි නාමය දෙවැදෑරුම් වේ සජාතිසාධාරණය සඞ්ඛාධාරණය කියාපි, එහි සඞ්ඝාදිසෙස යනු සජාතිසාධාරණ නාමය වේ ආපත්ති යනු සලීසාධාරණ නාමය වේ, එබැවින් "සමඟහුලා ආපත්තියෙ ආපජ්ජිං එකාහපටිවජ්ජන්නායෙ" යි මෙසේ සලීසාධාරණ නාමවශයෙනුදු යෙදීම වටී, ඒ එසේමය මේ පරිවාසාදි විනයකර්මය වසතුවශයෙන් හෝ ගොත්‍ර වශයෙන් හෝ නාමවශයෙන් හෝ ආපත්තිවශයෙන් හෝ කිරීම වට නේය, එහි සුක්කවිසට්ඨි යි වසතුව හා ගොත්‍රය ගන්නාලද්දේය, සඞ්ඝාදි සෙසො යි නාමය හා ආපත්තිය ගන්නා ලද්දේය, එහි සුක්කවිසට්ඨිං කායසංසග්ගං යනාදි වචනයෙනුදු නානාවත්ථුකායෙ යන වචනයෙනුදු වසතුව හා ගොත්‍රය සංගෘහිත වේ සඞ්ඝාදිසෙසා යන වචනයෙනුදු ආපත්තියෙ යන වචනයෙනුදු නාමය හා ආපත්තිය ගන්නා ලදි එබැවින් මේ වචනයන් අතුරෙන් යම්කිසි වචනයක්හුගේ වශයෙන් කර්මවාක්‍යය යෙදියයුතු. සියලු ආපත්තීන්ට සාධාරණ වශයෙන් සමඟ හුලක්‍රමයෙන් අටුවායෙහි කර්මවාක්‍යය යොදනලද්දේය

සුඛනතපරිවාසය එහි විසතර හා චුළසුඛනත පරිවාසය.

සුඛනතපරිවාසය නම් සකල රාත්‍රි පරිවෙහදය හෝ ඉන් කොටසක් හෝ තොදනීමය හිහි නොකිරීමය එහි විමති ඇතිවීමය යන කරුණුවලින් සමන්විත භික්ෂුහට නියමකළ පරිවාසය වේ හේ වනාහි චුළසුඛනතපරිවාසය මහාසුඛනතපරිවාස යයි දෙවැදෑරුම් වේ, ඉන් චුළසුඛනතපරිවාසය මෙසේ දතයුතු— යම් මහණෙක් උපසපන්වූ තැන් සිට අනුලොම ක්‍රමයෙන් හෝ ආරොචනය කළ දින පමන් ප්‍රතිලොම ක්‍රමයෙන් හෝ මෙපමණ දින යයි හෝ මෙපමණ පසු යයි හෝ මෙතෙක් මාස යයි හෝ මෙතෙක් අවුරුදු යයි හෝ තමන්ගේ පිරිසිදුබව දනීතම් ප්‍රතිඥකෙරේ නම් ඒ මහණහට දියයුතු සුඛනතපරිවාසය චුළසුඛනත පරිවාසනාම් එහි ආපත්ති ගණන දනීම හෝ තොදනීම කරුණු කොවේ ඉන් පලක් නැති ඒ පිරිවෙස් ගෙන වසන මහණ තෙමේ යම් පමණ කලක් තමන්ගේ පිරිසිදුභාවය දනී නම් ඒ කාලය තැර ඉතිරි මහක්

හෝ දෙමසක් හෝ ඉන් වැඩිගණනක් හෝ පිරිවෙස් පිරිය යුතු. ඉදින් පිරිවෙස් හන්නාකල මසක් පමණ අපිරිසිදු භාවය තමන්ට වැටහී පිරිවෙස් ගෙන පුරණ කල පසුව තව මසක් අපිරිසිදු බව වැටහුනි නම් ඒ මසත් පිරිවෙස් පිරියයුතු, නැවත සීමාවකට ගොස් සඞ්ඝයාගෙන් පිරිවෙස් ගැනීමක් උවමනා නොවේ ඉදින් දෙමසක් අපිරිසිදු යයි සිතා පිරිවෙස් ගෙන පුරණ කල මාසයක් යයි නිශ්චය වශයෙන් වැටහුනේ නම් මාසය පමණක් පිරිවෙස් පිරියයුතු නැවත සීමාවනට ගොස් සඞ්ඝයාගෙන් ගැනීමක් උවමනා නොවේ. මෙසේ මේ සුඛනානපරිවාසය පිළිබඳ කාලය වැඩිකිරීම හෝ අඩුකිරීම තමන්ගේ වැටහීමේ නිශ්චයෙන් කරනුකැකි වේ, ඊට දෙසෙක් නැති.

මහාසුඛනන පරිවාසය.

මහාසුඛනනපරිවාසය නම් යම් මහණෙක් අනුලොම ප්‍රතිලොම වශයෙන් රාත්‍රිපරිච්ඡේදය නොදනී නම් සිහි නොකෙරේ නම් එහි විමති ඇත්තේ හෝ විනම් ඔහුට දෙන පිරිවෙසය ඒ පිරිවෙස ගෙන ගත් දින පටන් උපසපන් දින දක්වා රාත්‍රි ගණන් කොට එපමණ රාත්‍රි ගණනක් පිරිවෙස් පිරියයුතු මෙහිදී වැඩිකිරීමක් නැති ඉදින් පිරිවෙස් පුරණකල මහක් හෝ අවුරුද්දක් හෝ ඇවැත් ප්‍රතිවිජ්ඣනාවියයි නිශ්චය වශයෙන් වැටහුනේ නම් එපමණකලක් පිරිවෙස් පිරියයුතු පිරිවෙස් දෙන සඟන විසින් ඒ මහණ ලවා "අහමහනෙන සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියෝ ආපජ්ජිං, ආපත්තිපරියන්තං න ජානාමි රත්තිපරියන්තං න ජානාමි, ආපත්තිපරියන්තං නස්සරාමි රත්තිපරියන්තං නස්සරාමි, ආපත්තිපරියන්තෙ වෙමතිකො රත්තිපරියන්තෙ වෙමතිකො, සොහං භන්තෙ සඞ්ඝං තාසං ආපත්තීනං සුඛන්තපරිවාසං යාචාමි" යි මෙසේ තෙවරක් යාච්ඤා කරවා "සුණාතු මෙ භන්තෙ සඞ්ඝෝ අයං ඉත්ථන්නාමො භික්ඛු සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියෝ ආපජ්ජි ආපත්තිපරියන්තං න ජානාති" යනාදි කර්මවාක්‍යයෙන් දියයුතු.

සමොධාන පරිවාස ශාගේ ප්‍රභෙද මූලායපටිකස්සනාය හා ඔධානසමොධාන පරිවාසය.

සමොධානපරිවාසය ඔධානසමොධානය අග්ගසමොධානය මිස්සකසමොධාන යයි තෙවැදෑරුම් වේ, එහි ඔධානසමොධානය නම් මූලායපටිකස්සනය කළ මහණහට දෙන පිරිවෙසය, මූලායපටිකස්සනය නම් වත හා මානත පිරුදිනගණන ඔහැරකොට මුල්ඇවතේ දිනගන්ට අණකිරීමය. ඒ මෙසේ දතයුතු- යම් මහණෙක් පිරිවෙස් ගෙන පුරන්නේ හෝ මානතට සුදුසුවූයේ හෝ මානත පුරන්නේ හෝ අබ්භානයට සුදුසුවූයේ හෝ අන්ගරුඇවතකට පැමිණ පළමු ඇවතට සමව හෝ අඩු වැඩිව හෝ රාත්‍රීන් ප්‍රතිවිජ්ඣනකෙළෙ නම් ඔහුට මූලායපටිකස්සනය කොට (ඒ පිරිවෙස්විසූ දිනගන්ද මානත පිරු දිනගන්ද හැර දැම්ම කොට) ඔධාන සමොධාන පිරිවෙස් දියයුතු (මුල් ඇවත පහළගක් ප්‍රතිවිජ්ඣනාවිනම් අනන්තරාපත්තිය එක් දිනක්

ප්‍රතිවිජ්ඣනාවූවත් මූල්ඇවතේ ගණනම් ගෙන පඤ්ඤතට නැවත පිරිවෙස් දීමයි) එහි පිළිවෙළනම් පළවුකොට මූලායපටිකස්සනයට යාවිඤ්ඤ කරවයා ඊට නියමිත කම්වාක්‍යයෙන් මූලායපටිකස්සනය කොට අක්ඛිති ඔඛාතසමොඛාතපරිවාසයට යාවිඤ්ඤ කරවයා ඊට නියමිත කම්වාක්‍ය යෙන් ඔඛාතසමොඛාතපිරිවෙස් දීමය ආයාචන වාක්‍යාදිය පාළිමුත්තක විනයවිනිශ්චයෙන් හා සුලුවගෙන් බලනු. පිරිවෙස් පුරණ මහණ නම් පිරිවිස් සමාදන්ව සිටි භික්ෂුතෙමේය, පිරිවෙස් පුරා නික්ඛිපනොකට සිටි මහණ මානතට සුදුස්සා නම්, මානතසමාදන්ව වසනුයේ මානත පුරන්නා නම්, මානත අවසන් කොට නික්ඛිපනොකළ මහණතෙමේ අබ්භානයට සුදුස්සෙකි.

අනන්තරාපත්තිය පටිවිජ්ඣනතොව් නම් මූලායපටිකස්සනය පමණක් කළයුතු නැවත පිරිවෙස්දීමක් උවමනා නොකෙරේ මූලායපටිකස්සන යෙන් වත් පිරුදින අහක්කළ බැවින් මූලයට දිනගණන පිරෙනතුරු වසපිරීම වටී. අනන්තරාපත්තිය එනම් පසුව පැමිණි ඇවත මූලාපත්තිය (මුල්ඇවත) ට වැඩිගෙන් ප්‍රතිවිජ්ඣනාවිනම් මූලාපත්තිය අනන්තරාපත්ති යෙහි ඇතුළත්කොට එනම් අනන්තරාපත්තියෙහි දිනගණනට පිරිවෙස් දියයුතු. මෙහි මහාසුම්ම - මහාපදුම තෙරවරුන්ගේ වාදයෙක්ද ඇති- ඉදින් වනාහි අනන්තරාපත්තිය මූලාපත්තියට වඩා වැඩි දිනගණනක් ප්‍රතිවිජ්ඣනාවී නම් එහිදී කුමක් කටයුතුදැයි විචාල කල මහාසුම්මතෙර ණුවෝ මේ පුද්ගලතෙමේ පිළිඤම් නොකට හැක්කෙක උපසපන් බැවින් මුදවා හැරිය යුත්තේ යයි කීහ. මහාපදුම තෙරණුවෝ වනාහි කවර හෙයකින් පිළිඤම් නොකොට හැක්කේද පිළිඤම් කරනු හැක්කේ මග, මේ සඞ්ඝවඅකඛඞ්ඛඤ නම් බුදුරදුන් වැඩසිටි කල් වැනි වේ ඇවැත් නම් ප්‍රතිවිජ්ඣන හෝ වේවා අප්‍රතිවිජ්ඣන හෝ වේවා සමව ප්‍රතිවිජ්ඣන හෝ වේවා අඩුව ප්‍රතිවිජ්ඣන හෝ වේවා වැඩිව ප්‍රතිවිජ්ඣන හෝ වේවා මෙසේදී විනයධර තෙරුන්ගේ කම්මවාක්‍ය යෙදීමෙහි සමත්බැව්ම පමණ වේ, එබැවින් යම් ඇවතක් වැඩිව ප්‍රතිවිජ්ඣනාවී නම් ඒ ඇවත මුල්ඇවතකොට එහි අතික්ක ඇවත (එනම් අඩුව ප්‍රතිවිජ්ඣනාවූ ඇවත) ඇතුළත්කොට පිරිවෙස් දියයුතු යයි කීහ. එහෙතින් කියනලදි- "යථෙව පන අනන්තරාපත්තියා මූලාපත්තිනො අනිරෙකපටිවිජ්ඣනා හොති, තථා කිං කාතබ්බන්ති වුත්තෙ මහාසුම්මත්ථෙරො ආහ- අත්‍රයකිච්චමිදං අඤං පුග්ගලෙ අනෙකිච්චන්ති නාම ආවිඤාරණපච්චා විත්තෙජ්ජනත්තා. මහාපදුමත්ථෙරෙ පනාහ- තඤහි අනෙකි චෙජ්ජා නාම නත්‍ථි අඤං සඞ්ඝවඅකඛඞ්ඛඤා නාම බුද්ධානං පිනත්තා ලදිසෙ ආපත්තිං නාම පටිවිජ්ඣන්තා වා අපටිවිජ්ඣන්තා වා සම්මාලෙනත්තාණිරෙකපටිවිජ්ඣනා වා, විනයධරස්ස කම්මවාචං සාවෙතුං සම්පජ්ජනත්තාවෙතං සබ්බං සමානං නානා යා අනිරෙක පටිවිජ්ඣනා හොති, තං මූලාපත්තිං නාම තඤ්ච අනන්තරං යථෙව බාහ පටිවාසෙ දාතබ්බා" යි.

මූලායපටිකස්සනාය නම් පිරිවෙස් පිරිමි
මූලායපටිකස්සනාය ඇදිය කරන භික්ෂූන් ගරුකොපතතියකට පැමිණ
ඔධානසමොධාන ප්‍රතිවිජ්ඣනකොකළ විට වත්මානත් පිරුදින පණ්
පරිවාසය යන දෙකේ වෙනස. ණක් අස්කිරීමද ප්‍රතිවිජ්ඣන කළ විට වතත් අස්
කිරීමද කරන සඞ්ඝකම්මය වේ, ඔධානසමොධා
නය නම් මූලායපටිකස්සනයෙන් පිරිවෙන් මානත්
බැහැරකළ භික්ෂූන්ට නැවත දෙන පරිවාසය වේ.

අහසසමොධානය නම් සඞ්ඝභූලාපත්තීන් අතු
අහසසමොධානය. රෙන් එකක් හෝ දෙකක් තුනක් හෝ වැඩිඅණ
නක් හෝ වැඩිවශයෙන් ප්‍රතිවිජ්ඣනාවී නම් ඒ වැනි
දිනගණන ප්‍රතිවිජ්ඣනාඇවැත් බලා ගෙන ඒ දිනගණනට පිරිවෙස් දීමය.
විසතර හෙයින් ඇවැත් සිටය සියය බැගින් දසදින දසදින වශයෙන්
ප්‍රතිවිජ්ඣනාවී මෙසේ ඇවැත් දහක් විසවුත් දසදිනක් පිරිවෙස් විසිමෙන්
සමපූණිවන්නේය. එහි ආසාවන වාක්‍යාදිය පාළිමුත්තකවිනයවිනිශ්ච
යෙන් සහ සුලුවගෙන් බලාගතයුතු.

මිස්සකසමොධානය නම් නානාවසතුක
මිස්සකසමොධානය. ආපත්තීන් එක් නොට දෙන්නාවූ පිරිවෙසහි
එහි කම්මවාක්‍ය හා ආරොචන වාක්‍යය පාළි
මුත්තක විනයවිනිශ්චයෙන් හා සුලුවඟපාළියෙන් බලාගතයුතු. ආයා
වනවාක්‍යය පමණක් මෙහි දස්වන්නෙමි— "අහං භන්තෙ සම්බහුලා
සඞ්ඝාදිසෙසා ආපත්තියෝ ආපජ්ජිං එකං සුක්කවිසට්ඨිං එකං කායසං
සග්ගං එකං දුට්ඨුල්ලවාචා එකං අත්තකාමං එකං සඤ්චරිත්තං එකං
කුටිකාරකං එකං විහාරකාරකං එකං දුට්ඨදොසං එකං අඤ්ඤභාගියං
එකං සඞ්ඝභෙදකං එකං සඞ්ඝභෙදානුවත්තකං එකා දුබ්බචං එකං
කුලදූසකං, සොහං භන්තෙ සඞ්ඝං තාසං ආපත්තීනං සමොධානපරි
වාසං යාචාමි" යනුයි.

මානතනම් භික්ෂූන් සතුටු කරනු පිණිස මහසඟන
මානත හා මෙතින් ලබාගන්න වතාහි. එහෙයින් "භික්ඛුනිආදාතුං
එකි ප්‍රභෙද. වුත්තං මහාහි" යනු කඞ්ඛාවිතරණියෙහි කියනලදි.
මේ මානත වතාහි අපටිවිජ්ඣනාමානතඤ්ච පටිවිජ්ඣනාමාන
තය පකතමානතය සමොධානමානත යයි බිවිඳුරුම්වේ, ප්‍රතිවිජ්ඣනා
ඇවැත්කැති මහණක්හට පිරිවෙස් නොදී ආපත්තීන්ට පැමිණීම නිසා
මානත සම්දෙනයට සුදුසු බැවින් දෙන්නාවූ මානත අපටිවිජ්ඣනාමානත
නම්, පිරිවෙස් වැස අවසන් කළ මහඟෙහ්හට දෙන මානත පටිවිජ්ඣන
මානත නම්, ඇවැත් ප්‍රතිවිජ්ඣනාකළාවූ හෝ නොකළාවූ භික්ෂුණීන්ට අඛ
ණ්ඩකව නියම කළ මානත පකතමානත නම්, එක්කොට දෙන මානත
සමොධාන මානත නම්, මේ සමොධානමානත වතාහි ඔධානසමොධා
නය අහසසමොධානය මිස්සකසමොධාන යයි තෙවැදුරුම් වේ, මූලාය

පවිකසඤ්ඤතයකළ මහණහට දෙන මානත ඔඛානසමොඛ්ඛ මානත නම්, අඤ්ඤසමොඛ්ඛ පටිවානය සමපූණී කළ මහණහට දෙන මානත අඤ්ඤ සමොඛ්ඛ මානත නම්, ඉසසකසමොඛ්ඛපරිවාසය සමපූණී කළ මහණහට දෙන මානත ඉසසකසමොඛ්ඛ මානත නම්, මෙහි පිළිවෙල නම් ප්‍රතිවජ්ජා ඇවැත් නැති භික්ෂුහට මානතදී එය සමපූණී කළ ඉක්බිති අබහානය කිරීමද එස්දිනක් නමුත් ඇවැත් ප්‍රතිවජ්ජා කළ මහණහට ඊට පිරිවෙස් දී එය සමපූණී කළ ඉක්බිති මානත දීම හා එය සමපූණී කළ පසු අබහානය කිරීමද වේ.

අබහානය. අබහානය නම් මානත සමපූණී කළ භික්ෂුහට සඞ්ඝයා විසින් කරනු ලබන සඞ්ඝකම්මයෙකි. එහි අදහස නම් සඞ්ඝයාට ඇතුළත් කරගැනීමය. ඒ අබහාන කම්මයට අනතිම පරිවෙජදයෙන් විසිනමක් භික්ෂූන් උවමනා වේ ඉන් එකනම කුද අඩුවී නම් ඒ කම්මය සිදුනොවන්නේය ඊට ඇතුළත් භික්ෂූහුද නිතර ලැබීමට සුදුසුවන්නෝය.

සඞ්ඝයා පිළිබඳ කොටස්. දක්ඛිණාහී සඞ්ඝයාය සම්මුති සඞ්ඝයා යයි විප්‍ර භෙද වේ, දක්ඛිණාහී සඞ්ඝයා නම් චීවරාදි සිවුපසය පිළිගැනීමට සුදුසු ආයෂ්මත් සඞ්ඝරත්න යයි ඒ ව්‍යාකි සෝවාන් ආදි සිවුමග සිවුපලයට පැමිණි ආයෂ්මන්ත වහන්සේලාය, සම්මුති සඞ්ඝයා නම් පෘථග්ජන සඞ්ඝයා වහන්සේය මේ සම්මුති සඞ්ඝයා කෙරෙහි කොටස් පහකට බෙදේ, ඒ මෙසේය- චතුවගී සඞ්ඝයාය පඤ්චවගී සඞ්ඝයාය දසවගී සඞ්ඝයාය විසතිවගී සඞ්ඝයාය අතිරෙක විසතිවගී සඞ්ඝයාය කියාගි, චතුවගී සඞ්ඝයාට සියලු රටවල උපසම්පදාවය පවාරණය අබහානය ඇතැ සඞ්ඝකම් හැර සෙසු කම් කරනු හැක්කේය, පඤ්චවගී සඞ්ඝයාට මධ්‍යදෙශයෙහි උපසම්පදාව හා සියලු දෙසවල අබහානයත් හැර සෙසු කම් කරනු හැක්කේය, දසවගී සඞ්ඝයාට අබහානය හැර මධ්‍යදෙශයෙහි උපසම්පදාව ආදි සෙසු කම් කරනු හැක්කේය, විසතිවගී සඞ්ඝයාට සියලු රටවල සියලුම කම් කරනු හැක්කේය, අතිරෙක විසතිවගී සඞ්ඝයාටත් එසේමය.

පිරිවෙස්ගැනීම- සමාදන්වීම- ආරොචනය කිරීම- පිරිමු. සීමාවකට මහඇතැ රුස්නොට සිවුර එකස් කොට පොරවාගෙන වැඩිමහලු තෙරුන් වැඳ අත් පසෙහි උක්කුටිකයෙන් හිඳ තමන් පැමිණි ඇවැත් සඟනහට "අහං භන්තෙ සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියෝ ආපජ්ජිං" යනාදි තමන් පැමිණි ඇවැත්වලට අනුකූල පරිදි ආරොචන වාක්‍යයෙන් සැලකොට තදනුරූප පරිදි සඟන වෙනින් පිරිවෙස් ගෙන ඒ සීමායෙහි දීම "පරිවාසං සමාදියාමි, වත්තං සමාදියාමි" යි මෙසේ තෙවරක් කියා පිරිවෙස් සමාදන්වූ අත්පසින් බැහැරවී "අහං භන්තෙ සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියෝ ආපජ්ජිං" යනාදි වශයෙන් තමන් සමාදන්වූ පිරිවෙසට සුදුසු පරිදි ආරොචනය කළයුතු ඉඳින් පිරිවෙස් නිසේෂප

ක්‍රමය කැමති වී නම් කැවත අන්පසට පැමිණ "පරිවාසං නික්ඛිපාමි, වත්තං නික්ඛිපාමි" යි තෙවරක් ප්‍රකාශ කිරීමෙන් නික්ෂේපකළයුතු, එතැන් සිට ප්‍රකෘති මහණ වේ. ඉදින් වත නික්ෂේපකරන්ට පළමු භික්ෂූහු වැඩියෝ නම් එකතමක් වත් ඉතිරිව සිටිකල උන්වහන්සේ වෙනුවෙ පැමිණ නික්ෂේපකළයුතු, එසේත් නැතිකල මඟදී සම්මුඛ වී නම් අවකාශ ලැබගෙන නික්ෂේපකිරීමද වටී, සීමායෙහි සිටි භික්ෂූන් හෝ ලැබ අන්‍යසභාග භික්ෂුනමක් ලැබුනි නම් පළමුකොට ආරොචනය කර පසුව නික්ෂේපකළයුතු, වත නික්ෂේපකරන්ට තමන්ට මතකනැතිව සීමායෙන් නික්ම ගොස් මඟ දී සිහි වී නම් තමන් කැවිව යන භික්ෂුනම් කාගේ හෝ සීමායෙහි සිටි අන් භික්ෂුනමකගේ හෝ නැතහොත් සභාග අන්‍ය භික්ෂුනමකගේ හමුයෙහි කිපරදී නික්ෂේපකිරීම වටී, මඟ දී හමු නොවී ආරාමයට පැමිණිකලද පළමුකොට තමන්ට සම්මුඛවූ භික්ෂුව සීමායෙහි සිටි නමක්නම් ආරොචනය නොකොටද අන්‍ය සභාග භික්ෂු නමක් නම් ආරොචනය කොට ඉක්බිතිවද නික්ෂේපකිරීම වටී. භික්ෂූන් සුළුගණනක් වසන වෙහෙරක්වූ කල වත නික්ෂේප නොකර දිනගණන පිරෙනතුරු වත පිරීම හා එසේ නොකැකි කල නික්ෂේපකර රාත්‍රියෙහි සමාදන්ව අරුණ නැඟිකල නික්ෂේප කිරීමද එසේත් අපහසු වී නම් පශ්චිමයාමයෙහි සමාදන්ව අරුණනැඟි කල නික්ෂේප කිරීමද මෙසේ කිරීමෙනුදු ආගන්තුක භික්ෂූන්ගේ ගමනා ගමනය නිසා වතසුඛ කිරීම අපහසු කල ආරාමයට අඟත් ප්‍රාකාරයෙන් හෝ වැටෙන් හොඳින් මායිමෙන් ලෙඩුවුපාතදෙකකින් ඇත්ව මහමාර්ගයෙන් ඉවත්වූ පශ්චිම යාමයෙහි වත සමාදන්වූ එක් භික්ෂුනමක් සඟ හෝ දෙලොස් රියන් අත්පසින් ඇත්ව වනලැහැබක වැස අරුණනැඟි කල වත නික්ෂේප කර මින් දින ගණන පිරිමද වටී ආරොචනය කළ භික්ෂුව යම් කිසි කරුණ කින් තමන් නොදැනුවත්ව බැහැර ගිය විට ඒ බැව් අරුණෙන් පසු දැන ගත්තේ නම් සුඛසිතින් වියුබැවින් රාත්‍රිවෙශ්දය නොවේ ආරම්භකවූ හෝ ආගන්තුකවූ අන් කිසි පළමු දුටු සභාග භික්ෂුවකට ආරොචනය කර ඉක් බිති නික්ෂේපකළයුතු. ඒ වනලැහැබෙහි හෝ අතරමගදී සම්මුඛනොවී නම් ආරාමයට පැමිණ කීසේ නික්ෂේපකිරීම වටී. පළමු ආරොචනය කළ භික්ෂුවක් ලැබුනු කල නැවත ආරොචනය කිරීම උවමනා නොවේ. ආරොචනය කරන කල එකතමක් වී නම් "වෙදියතීති මං ආයසමා ධාරෙතු" කියාද දෙනමක් වීනම් "වෙදියනීති මං ආයසමන්තා ධාරෙතු" කියාද තුන්නමක් වී නම් "වෙදියතීති මං ආයසමන්තා ධාරෙතු" කියාද සිවිනමක් වී නම් "වෙදියතීති මං සඞ්ඝා ධාරෙතු" කියාද බාලනමකට නම් ආවුසෝ කියාද වැඩිමහල් නමකට නම් භන්තෙ කියාද කියයුතු, මෙසේ පිරිවෙස් වසමින් ආගන්තුක භික්ෂූන්ට ආරොචනය කිරීමෙන් දින ගණන පිරෙනතුරු පිරිවස් සමාදන් කළ යුතු. විසභාගයන්ට ආරොචනය උවමනා නොවේ.

මානත ගැනීම- සමාදන් වීම- ආරොචනය කිරීම-

මානත ගැනීම තම සීමාවට රැස්වූ මහසඟන වෙතින් ලබා ගැනීමය, එහි පිළිවෙළ මෙසේ දත යුතු— වත සමවුණි කොට නිසොප සොකර සිටි මහණෙකු මානත ගන්නාකල සීමාවට රැස්වූ මහ සඟන වෙනට පැමිණ අත්පසින් බැහැර වී සිවුර එකස් කොට ගෙන දැඩි මහලු තෙරුන් වැඳ ඇදිලි බැඳ ගෙන උක්කුටිකයෙන් හිඳ ආරොචනය කොට ඉක්බිති මහසඟන ගේ අත්පසට පැමිණ පෙරසේ වැඳීම් ආදිය කොට මානතට යාච්ඤා කළයුතු. වත සමවුණි කොට නිසොපකර සිටි මහණෙකුවූ කල පළමු කොට පෙරසේ වැඳ අත්පසෙහි උක්කුටිකයෙන් හිඳ වත සමාදන්ව ඉක්බිති අත්පසින් බැහැර වී ආරොචනය කොට නැවත අත්පසෙහි හිඳ ගෙන මානතට යාච්ඤා කළයුතු. තෙවරක් යාච්ඤා කළ පසු මහ සඟන විසින් සුසන්නිවතුළු කම්වාක්‍යයෙන් මානත දියයුතු, ඉක්බිති වැඩි මහලු තෙරුන් වැඳ එහිම අත්පසෙහි උක්කුටිකයෙන් හිඳ ගෙන "මානතනං සමාදියාමි, වතනං සමාදියාමි" යි මෙසේ තෙවරක් කියා සමාදන් වැ වතම කියේ ආරොචනාදිය කළයුතු.

ආසාචන වාක්‍යය.

මෙහි ආසාචන වාක්‍යය තෙවැදෑරුම් වේ, ප්‍රතිච්ඡන්න ඇවැත්නැති මානතට යාච්ඤා කරනකල "අහං භන්තෙ සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියෝ ආපජ්ජිං අපටිච්ඡන්නා යෝ, සොහං භන්තෙ සඞ්ඝං තාසං ආපත්තීනං අපටිච්ඡන්නා නං ජාරත්තං මානත්තං යාචාමි" යි මෙසේද පටිච්ඡන්නාමානතට යාච්ඤා කරනකල "අහං භන්තෙ සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියෝ ආපජ්ජිං සම්බහුලා ආපත්තියෝ එකාහපටිච්ඡන්නායෝ සම්බහුලා ආපත්තියෝ ද්වීහපටිච්ඡන්නායෝ සම්බහුලා ආපත්තියෝ තීහපටිච්ඡන්නායෝ සම්බහුලා ආපත්තියෝ චතූහපටිච්ඡන්නායෝ සම්බහුලා ආපත්තියෝ පඤ්චාහපටිච්ඡන්නායෝ, සොහං භන්තෙ සඞ්ඝං තාසං ආපත්තීනං යා ආපත්තියෝ පඤ්චාහපටිච්ඡන්නායෝ තාසං අයෙන්න සමොධාන පරිවාසං යාචිං, තස්ස මේ භන්තෙ සඞ්ඝෝ තාසං අයෙන්න සමොධානපරිවාසං අදාසි, සොහං පරිවුත්ථපරිවාසෝ, අහං භන්තෙ සම්බහුලා සඞ්ඝාදිසෙසා පත්තියෝ ආපජ්ජිං අපටිච්ඡන්නායෝ, සොහං භන්තෙ සඞ්ඝං තාසං සම්බහුලානං ආපත්තීනං පටිච්ඡන්නානඤ්ච අපටිච්ඡන්නානඤ්ච ජාරත්තං මානත්තං යාචාමි" යි මෙසේද එක් දිනක් ප්‍රතිච්ඡන්නාඇවතට පිරිවෙස් පුරා මානත ගන්නාකල "අහං භන්තෙ සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියෝ ආපජ්ජිං එකාහපටිච්ඡන්නායෝ, සොහං භන්තෙ සඞ්ඝං තාසං ආපත්තීනං එකාහපටිච්ඡන්නානං එකාහපරිවාසං යාචිං තස්ස මේ භන්තෙ සඞ්ඝෝ තාසං ආපත්තීනං එකාහපටිච්ඡන්නානං එකාහපරිවාසං අදාසි, සොහං භන්තෙ පරිවුත්ථපරිවාසෝ සඞ්ඝං සම්බහුලානං ආපත්තීනං එකාහපටිච්ඡන්නානං ජාරත්තමානත්තං යාචාමි" යි මෙසේදුයි ඒ තුන් ආකාරය දතයුතු විසතර කැමතියන් විසින් සුලුවග සඳුවවනකඛණ්ඩක යදි විනයඅට්ඨකථා පාළිමුත්තක විනයවිනිච්ඡයන් බැලියයුතු.

මේ වාක්‍යවල සඞ්ඛ්‍යා ශබ්දය හා සඞ්ඛ්‍යාදිභෙද ශබ්දයන් යෙදීම ඇවැත් නොපමණ ගණනක් හෝ නෙළෙස් සහවෙසෙන් අතුරෙහි කොයිදම් ගරුකාපහරියක් උනත් සුඛිත ලැබිවට බාධානොවන පිණිස සුලුවශ සම්බන්ධයකඛණ්ඩයෙහි වදාරනලද ශ්‍රී බුද්ධ දෙශනාක්‍රම යෙන් බලනකල ඇඳිත් පිළිබඳ සඞ්ඛ්‍යා නියමය හා නාමකිර්තනයත් කිරීමෙන් පිරිමවස් හා මාහත ගත්කල සඞ්ඛ්‍යාවන්ගේ වැනිවීමක් හෝ අන්‍ය ආපත්තිශතයක්ගේ විද්‍යමානයක් හෝ ඉතම් නැවත පිරිවෙස් ගන්ට සිදුවන බැවි පෙණේ එහෙයින්ම අට්ඨවිශයෙහි සමීඝාධාරණ වශයෙන් සම්බන්‍ධ ශබ්දය හා සඞ්ඛ්‍යාදිභෙද ශබ්දයන් ආඝාවන වාක්‍යයෙහි යොදනලද්දේය. ආඝාවන වාක්‍යය අනුරූපපරිදි කම්මවාක්‍යය හළපා ගැනීම විනයධර තෙරුන්ගේ ඉතිහතඝාවබොධයෙහි ප්‍රතිඵලය වේ. තවද මේ ආඝාවන වාක්‍යය හා කම්මවාක්‍යය හැළපීම් ඇවැත් සිඩ වූ පරිදි කිරීමත් වැරදි නොවේ නිසැකව සවිරවශයෙන් යම් භික්ෂුවක්හට තමන් පැමිණි ඇවැත් හා ප්‍රතිවිජ්ඣා දිනගණනත් මතක තිබේ නම් ඒ ආපත්තීන්ගේ නම් යොදා දිනගණනත් සඳහන් කිරීමෙන් ආඝාවන වාක්‍යය හා කම්මවාක්‍යය යොදාගැනීම ද සුදුසු වේ, සැකයක් හෝ විමතියක් ඇතිකල නැතඝොත් වැඩි පිරිසිදුකමක් බලාපොරොත්තුවෙන් සම්බහුලා සඞ්ඛ්‍යාදිභෙසා කියා යොදාගැනීම හා වැඩි දිනගණනක් ඇතුළත්කරගැනීමත් හැමලෙසින්ම වටීමය.

මාහතපිරිමි තම් සය දිනක් හෝ අරුණු සැක් අතරතුර පිරිමි. නොසඞ්කොට පිළිවෙළින් සම්පූර්ණ කිරීම වේ ඒ කාලය තුළ නොඝොත් අරුණ තබින කල සඞ්ඝයාගෙන් මෙන් මොළු විසිවද අරුණ නැතිකල මාහත නික්ඛේප කෙළේ නම් නැවත සමාදන් වන විට සඞ්ඝයාගෙන්ම සමාදන් වීමත් එකඅමක් දෙඅමක් හෝ තුන් අමක් ඉදිරි පිට සමාදන් නොවීම හා නික්ඛේපනොකොට පුරන්නේ නමුත් දිනක් පාසා සහනවෙතින්ම සමාදන්වීමත් වටනේය, ආරොව නය කළ ඉක්බිති උවමනාවක් පැමිණි කල එකඅමක් නවත්වා මාහත වාරික භික්ෂුව නොදුනුවත්ව හෙසු භික්ෂූන්ගේ වැඩමවීම වැරදි නොවේ රාත්‍රිවෙජ්දඝද නොවන්නේය මාහතවාරික භික්ෂු තෙමේ ඒ නැවති සිටි භික්ෂූහුගේ සම්පයෙහි අරුණ නැතිකල මාහත නික්ඛේපකටයුතු. ඉඳින් නැවති සිටි භික්ෂූතෙමේද කිසියම් හෙතුවකින් මාහතවාරික භික්ෂුව නොදුනුවත්ව අරුණට පළමු ගියේ නම් වෙහෙරට හොස් එහි වැඩි අන්‍ය භික්ෂූනමක් හෝ ආගන්තුකඝඝාගන්තුකයන් හෝ යන යම්කිසි පළමු දුටු නමකට ආරොවනය කර ඉක්බිති නික්ඛේපකිරීම වටියි පළමු ආරොවනය කළ නමක් නම් නැවත ආරොවනයක් උවමනා නැත සඞ්ඝයා සමග වසනවාය යන මාහතවාරික භික්ෂුවුන්ගේ සුඛවිහාරයන් අරුණ නැගීම දක්වා විසීම හෙතුකොට ගෙන රාත්‍රිවෙජ්දය හා වතත භෙදය නොවන්නේය. සහවාසය හා අනාරොවනයත් තමන් නොදනුවම සිදුවේ ඉන් රාත්‍රිවෙජ්දය වන බැවින් අඛාහාරය කෙළේ නවුත් තමා සිඩිය නොවන නිසා පරිභෝගකාරී විය යුතු සෙස්ස පිරිවෙස් සමවේ.

රත්‍රිවෙජ්දය හා වත්තභෙදය.

රත්‍රිවෙජ්දය නම් ඒ රත්‍රිය නැතිදිමය වත්තභෙදය නම් දුකුළාඇවැත්වීමයි. විරිවෙස් වසන භික්ෂුවක් හෝ මානත්ත පුරණ භික්ෂුවක් සිටි ආරාමයකට හෝ එහි උප චාරයට හෝ වතාඅක නම් දෙලොස් රියන් අත්පසට සහාග ප්‍රකෘති භික්ෂුවක් හෝ යෑඩිවැඩුන භික්ෂුවක් හෝ නැවි ආදියකින් යන භික්ෂුවක් හෝ පැමිණ ඔවුන් නොදැනුවත්වම යාම හෝ විරිවෙස් පුරණ භික්ෂුහට ආරොචනය කළ භික්ෂූන්ගෙන් එකතමක් හෝ මානත්ත පුරණ භික්ෂුහට සිවිතමක් හෝ අරුණ නගිනා කල නොසිටීම හෝ එක්පියස්ස ඇතිවේක හෝ විහාරයක හෝ බෝගෙහෙක හෝ ප්‍රකෘති භික්ෂුවක් හා විහිම හෝ යන මින් එකක්වත් සිදුවූ කල රත්‍රි වෙජ්දය වේ, යම් කිසි උවමනාවක් පැමිණි විට ආරොචනය ලැබූ සියලු භික්ෂුහුම ඔවුන් නොදැනුවත්ව ගියක් පාරිවාසික -- මානත්තචාරික භික්ෂූන් අරුණෙන් පසු දුන ගත්කලද ඔවුන්ට රත්‍රිවෙජ්දය නොවේ, තමන් සුඛවිහාරයෙන් විසූබැවිනි සහාග ප්‍රකෘතිභික්ෂුවක් හෝ එසේම යෑඩියෙන් වඩින භික්ෂුවක් හෝ නැවිආදියෙන් වඩින භික්ෂුවක් හෝ ආරාමයට හෝ එහි උපචාරයටද වතාඅෙහි හා මගදී තම් දෙලොස් රියන් අත්පසට පැමිණි බැව් දුන හෝ පැමිණීම නඩ අසා හෝ ආරන් විසෙන් දුන හෝ ආරොචනය නොකිරීම හා ඊට උත්සාහ නොකිරීමද යන මින් එකක් සිදුවූ කල රත්‍රිවෙජ්දය හා වත්තභෙදයෙහි දුකුළා වේ, ආරොචනය කරනු පිණිස උත්සාහ වඩා නොහැකිවූ විට රත්‍රිවෙජ්දය පමණකි, විසහාගභික්ෂූන්ට ආරොචනය නොකිරීමෙන් රත්‍රිවෙජ්දය හා වත්තභෙදයෙහි දුකුළා නොවේ, එදහසින් වදරන ලදි- "යාවෙ බ්‍රා උපාලි පාරිවාසිකස්ස භික්ඛුනො රත්තිවෙජ්දෝ - සහවාසෝ විප්පවාසෝ අනාරොචනා" යි මෙහි අදහස තම් ප්‍රකෘති භික්ෂූන් හා එක පියස්ස ඇති ගෙවල් ආදියෙහි විසීමය ප්‍රකෘති භික්ෂුවක් නැතිව හුදු කළාව විසීමය සහාගආගන්තුගාදීන්ට ආරොචනය නොකිරීමය යන මේ කරුණු තුනෙන් එකක්වත් සිදුවී නම් පාරිවාසික භික්ෂූන්ගේ රත්‍රි වෙජ්දය වේ. මානත්තචාරික භික්ෂූන්ගේ රත්‍රිවෙජ්දය වතාහි සහවාස විප්පවාසය අනාරොචනය සිවිතමකින් අවූ භික්ෂූන් හා විසීමය යන මේ කරුණු සතරින් එකකින් නමුදු සිදුවන්නේය. එයද වදරන ලදි- "මානත්තචාරිකස්ස භික්ඛුනො රත්තිවෙජ්දෝ — සහවාසෝ විප්පවාසෝ අනාරොචනා ඌනෙ ගණෙ චරති" යි. පිරිවෙස් පුරණ භික්ෂුහට සහකාර භික්ෂූන් අහිමි වශයෙන් එකතමක්ද මානත්ත පුරණ භික්ෂුහට සිවිතමක්ද සිවියයුතු සහවාසාදිය තමන් නොදැනීමෙන් සිදු වීතම් රත්‍රිවෙජ්දය වේ, දුන දුන කිරීම නිසා වත්තභෙදය හා දුකුළා ඇවැත් වේ. රත්‍රිවෙජ්දයෙන් වැළකීම මෙහි ප්‍රධාන කාරණයක් වශ යෙන් සලකනු ලැබේ ඊට කුවා කිළියක මිස විසාල පන්සල් ගෙවල් ධර්මශාලාදියෙහි පාරිවාසික — මානත්තචාරික භික්ෂූන්ගේ නොනිදිම හා ආගන්තුක භික්ෂූන්ගේ ගමනා ගමනය හැන මනාසේ පරිහාරාදි ඒමත් වටී.

ගෞරව නොපිළිගැනීම හා පිළිනැනීම.

වැඳීම හුනස්නෙන් නැගිසිටීම් ආදිලිබැඳීම් සුදුසු ගෞරව කිරීම් වැඩහිදින අසන් පැනවීම් නිදන අසුන් පැනවීම පාදෙනා පැන් එළවීම් පාසෝදන සුවුවෙගන ඊම් ඉටියෙන් හෝ ලීයෙන් සළ පාතබන ලැල්ල ගෙන ඊම පාසිවුරු පිළිගැනීම නහන විට පිට ඉඳීම ඇත ඔවුන් ප්‍රකෘති මහණුන්ගෙන් හෝ තෙරණුන් ගෙන් පාරිවාසිකාදීන්ට පිළිගැනීම සුදුසු නොවේ, වැඩිමහලු පාරිවාසිකාදීන්ට බාල පාරිවාසිකාදින්ගෙන් හෝ මූලායපටිකස්සනාදියට සුදුස්සන්හට පිරිවෙස් වහන්නවුන්ගෙන් හෝ ඉවසීම් වැරදි නොවේ.

කටුයුතුඛණ්ඩි හා මානාණවුතුඛණ්ඩි.

පාරිවාසික මහණය මූලායපටිකස්සනාය ට සුදුසු මහණය මූලායපටිකස්සනාය ලැබූ මහණය මානතට සුදුසු මහණය මානත පූරණ මහණය ඇත මේකී භික්ෂූන් අතුරෙන් කිසියම් භික්ෂුවක් ගණපූරක කොටගෙන පිරිවෙස් දීම මූලායපටිකස්සනාය කිරීම මානත දීම අබ්භාන කිරීම ඇත කම් නොකටයුතු එකී භික්ෂූන්ගෙන් අත්පය කැඩෙන බැවින් කම් නොපැවැත්තේය, පාරිවාසික මහණෙකු සිව්වෙනි කොට ගෙන අන් මහණෙකුට පිරිවෙස් දීම මූලායපටිකස්සනාය කිරීම මානත දීම අබ්භාන කිරීම මීළඟිවෙනි කොට ගෙන අබ්භාන කිරීම ඇත කම් කෙළේ නම් ඒ කම් නොපිහිටන්නේය. පොහෝ පවාරණාදි සෙසු කම් කිරීම වැරදි නොවේ කම්සිද්ධ වන්නේය.

පිරිවෙස් සමාදන්ව වසන කල උපාධ්‍යායාදීන්ගේ වත්.

පිරිවෙස් සමාදන්ව වසන කල උපාධ්‍යාය ම උපසපන් කරවීම හා කම්වාචනා වාඇස්සීම ද ආගන්තුක භික්ෂූන්ට කිසදිමද නොවටී, උපාධ්‍යායවීමට හෝ කම්මවාචනාචාඇස්සීමට උවමනාම වීනම් වතනිස්සේප කොට එසේ සළයුතු, ප්‍රකෘතියෙන් නිසඟෙන වසන මහණුන් ඇතිකල මම ඕනෑයකමක් නෙරෙමි තෙපි අසවල් තෙරුන් වෙතට ගොස් නිඝ සමාදන් වෙයව් මට වත් නොකරව් ගම් වැදීම මා අතින් නොවිමාරව් යි ඔවුන්ට කියයුතු, මෙසේ වළැක්වූ තැන් සිට ඔවුන් වත්කිරීමෙහුදු කමක්ට ඇවැත් නොවේ, අන් තෙරණ නමකුදු නොගසයුතු පළමු යිපි තෙරණුන්ටද මම විනය කමක් නෙරෙමි තෙපි මට වත් නොකරව් ගම් වැදීම ඒ අතින් නොවිවාරව් යි කියයුතු, ඉක්බිති ඔවුන් වත්කළ කල්හිදු වළැක්වූ තැන්හිට ඇවැත් නොවේ, භික්ෂුණීන්ට අවවාද දීම සම්මුතිය නොපිළි ගැනීමද පළමු පිළිගෙන තිබුනේ නමුදු අවවාද නොනිරීමද බික්ඛාහානට හෝ සමත් මහණෙකුට හෝ පැවරීමද භික්ඛුණීන් අවවාද පිණිස තමන් වෙතට පැමිණි කල සඟන වෙතින් හෝ අනුවල් තෙරුන් වෙතින් ලබා ගනිව් යි පිටත් කිරීමද වටී, සඟන වීසින් ගම් ඇවහකට පිරිවෙස් දෙන ලදතම් ඒ ඇවතට හෝ එබදු අන් ඇවතකට හෝ රට වඩා ලාමක ඇවතකට හෝ නොපැමිණිමේදෑ කම්යට හෝ කම්කළ භික්ෂූන්ට නොගැරහීමද ප්‍රකෘති

මහණෙකුගේ උපොසථය හෝ පවාරණය නොවැළැක්වීමද අන් මහණුන්ට වොදනා නොකිරීමද වෙහෙර අධිපතිකම් නොකිරීමද පාමොක් උදෙසීම හෝ උදෙසීමට ආරාධනා හෝ දහම්දෙසීම හෝ නොකිරීමද තෙළෙස් සම්මුතීන් අතුරෙන් එකයින් හෝ අධිපතිකම් නොකිරීමද ප්‍රකෘති මහණෙකුට වසනුවකින් හෝ ආපත්තියකින් වොදනා නොකිරීමද මේ නුඹවහන්සේගේ දෙස යයි කියා නොකර වීමද භික්ෂූන් ඔවුනොවුන් ගොදවා කොලාහල නොකර වීමද සඟතෙරුන් මේ ප්‍රකෘති මහණුන්ගේ ඉදිරියෙන් නොයාම හා නොකිදීමද දෙලොස්රියන් උපචාරය හැර තනිව යාම හා කිදීමද වරි.

බොජ්ඣන්හල් ආදියෙහි සඟනගේ නොළුවර අසුන් හා (උපසපන් භික්ෂූන්ගේ අන්තිම ආසනය) හැමට ලාමක ඇඳ හා පුටුවද පන්සල් මඟයද පිරිවෙස් වසන මහණකට දියයුතු, වස්වසන දිනා ලත් ප්‍රත්‍යය තමන්ගේ වස්ගණනට කිම්වත පරිදි ගැනීම වරි, එසේදවුව භික්ෂූන්ගේ පේළියෙහි නොකිඳ පැත්තකින් කිඳ ගැනීම යුතුවේ, සෙනසුන එසේ නොගතයුතු, නිබඳ වස්සාවාසිකය හා සෙනසුන ගතුකැමති කල වත නික්ෙපකර ගැනීම වරි, නැගන්ගේ හෝ පැවරුවන්ගේ ආරාධනයක් පිළිගෙන භික්ෂූන් එක් කොට ගෙන පෙරටුවැ හෝ පසුවැ හෝ කුලගන් කරා නොයාම හා සබාමීනි අසවල් ගම වසන මිනිස්සු භික්ෂූන්ගේ වැඩම වීම කැමතිය ඔවුන්ට නුඹවහන්සේලා සංග්‍රහ කරනසේක් නම් යහ පතැයි කීමද වරි, පැමිණි පැමිණි මහණුන්ට ආරොචනය කිරීම හා එසේ කිරීමට ලජ්ජායෙන් ආරණ්‍යක ධුතඞ්ගය සමාදන් නොවීමද පළමු ආරණ්‍යක ධුතඞ්ගය සමාදන්ව සිටියෙක් නම් දෙවෙනි මහණකු ගෙන අරුණ නඟින කල වනයෙහි සිටීම හා තනිව වනයෙහි නොවසීමද බොජ්ඣන්හල් ආදියෙහි කොළවර අස්නෙහි කිදීමට ලජ්ජායෙන් පිණ්ඩපාතික ධුතඞ්ගය සමාදන් නොවීම හා ප්‍රකෘතියෙන් පිණ්ඩපාතිකයෙක්වූ කලි එසේ කිරීමද පිඩුසිඟා ගිය කල අන්‍යයෝ පිරිවෙස් වසන්නෙක කියා දුන ගන්නාහුගේ සිතමින් වෙහෙරට පිණ්ඩපාතය නොගෙන් වීම හා එක් මහණෙක් ද මා පිරිවෙස් රක්නා බැව් නොදනීවා සි මෙසේ සතිටු ගන් කොට භෙරණුන් ලවා පිසවා ගෙන නොවැලඳීමද වරි, ගමට පිඩුසිඟා යායුතුමය, ගිලන්හුගේ ද නවකම්මිකයාගේ ද ආචාර්‍ය උපාධ්‍යාය ආදීන්ගේ කටයුතුවල යෙදුනහුගේ ද වෙහෙරෙහි වීසීම වැරදි නොවේ, ගමෙහි නොයෙක් සියගණන් භික්ෂූන් වසන කල ආරොචනය කිරීමෙන් නිමාවක් නැති නම් වනයෙහි සඟාඟ භික්ෂූන් වසන අරමක විසියයුතු

අන් වෙහෙරකට ගිය කල එහි වසන සියලු මහණුන්ට ආරොචනය කළයුතු සියලුදනා වහන්සේ එක් තැනකදී හමු නොවී නම් රුක්මුල් ආදී ඒ ඒ වැඩ කිදින තැන් කරා පැමිණ හෝ ආරොචනය කිරීම වරි, දුන දුන ආරොචනය නොකිරීම නිසා රාත්‍රිවෙන්දය හා වත් කිදීමෙහි දුකුළා ඇවැත් වේ එසේ සොයන කල කිසියම් මහණකෙණෙකුන් හමු

නොවී ආරොචනය කරනු නොහැකි වී නම් රාත්‍රිවෙජ්දය පමණකි, තමන් වෙතට පත් ආගන්තුක භික්ෂූන්ටද ආරොචනය කළයුතු යම් ආගන්තුක මිහණ කොණෙක් තමන් වසන අරමට හෝ උපචාරයට පැමිණ නොදුනුවත්ව ගියෝ නම් රාත්‍රිවෙජ්දය වේ, එසේ ගිය බැව් දැනගත් කල වහාම පසුපස්සෙහි ගොස් ආරොචනය කරනු පිණිස උත්සාහ දැරීම වටී, එසේද කොට නොහැකි වී නම් රාත්‍රිවෙජ්දය වේ, යම් ආගන්තුක මහණුන් උපචාරයට පැමිණි බැව් ඔවුන්ගේ කුඩහඬින් හෝ කැරින් හඬින් හෝ කිඹිසිලි හඬින් හෝ දැන ගත් විට එහි පැමිණ ආරොචනය කළයුතු තමන් එහි පත් විට ඔවුහුතුමූ නික්ම ගියෝ නම් පුහුබැඳ ගොස් හෝ ආරොචනය කිරීම වටී, එසේ නොහැකි වී නම් රාත්‍රිවෙජ්දය වේ.

යම් මහණෙක් පිරිවෙස් පුරණ මහණ නිදිගත් කල පැමිණ අවදි වීමට පෙර ගියේ නම් රාත්‍රිවෙජ්දය වේ, තමන් නොදත් බැවින් වත්ත වෙජ්දයෙහි දුකුළා නොවේ, ඉදින් රාත්‍රිවෙජ්දයවූ බැවි නොදුන අබ්භානය කෙළේ නම් නොකරත්තලදම යහි කුරුන්දි අට්ඨකථායෙහි කී බැවින් මැඩපුර රාත්‍රීන් ගෙන පිරිවෙස් පිරීම වටී නැවකින් යන කල ඉවුරෙහි සිටි මහණෙකු හෝ ඉවුරෙහි සිටි කල නැවකින් යන මහණෙකු හෝ අහසින් යන මහණෙකු හෝ පළිතමුදුන් වන ආදියෙහි දුර සිටි මහණෙකු හෝ දුන භික්ෂුවක යන සතිට්ඨන් ඇතිකල මහත්තේ ශබ්දකොට හෝ නැවි ආදියකින් ගොස් හෝ වෙහසෙන් පුහුබැඳ හෝ ආරොචනය කටයුතු, එසේ නොකෙළේ නම් රාත්‍රිවෙජ්දය හා වත්තභෙදයෙහි දුකුළා වේ, එසේ උත්සාහ කොට පැමිණීමට හෝ ඇස්විමට නොහැකි වී නම් රාත්‍රිවෙජ්දය පමණකි, වත්තභෙදයෙහි දුකුළා නොවේ.

ආගන්තුක භික්ෂූන් හා සෘද්ධියෙන් වඩන්නා භික්ෂූන් ද උපොසථ පවාරණ දෙකට පැමිණෙන බැවින් උපොසථ පවාරණ දෙක්හි සඞ්ඝසන්නිපාතයට ගොස් ආරොචනය කිරීම ද ඊට පැමිණෙනු නොහැකි තරම් රොගාතුරකමක් වී නම් අන් මහණෙකු යවා ආරොචනය කරවීමද හෙරණතමක් නොඇවිම ද භික්ෂූන් වසන තැනකින් භික්ෂූන් නැති තැනකට හෝ නානාසංවාසකයන් වසන තැනකට හෝ නොගොස ද ප්‍රකෘති මහණෙකු සමඟ හෝ අන්තරායක් ඇතිකල තනිව හෝ යාම ද යම් තැනක එක ප්‍රකෘති භික්ෂුවක් ද නැති කල එහි නොවිසිම ද විසුයේ නම් ඒ රාත්‍රීන් ගණන් නොගැනීම ද දසවිධ අන්තරාය අතුරෙන් එකකුදු ඇති කල රාත්‍රිවෙජ්දය වන්නේ නමුදු අන්තරායයෙන් ඔදෙනු පිණිස යාම ද වටී, නානාසංවාසකයන් හා විනයකර්ම නොකටයුතු බැවින් ඔවුන්ට ආරොචනය නොකිරීම නිසා රාත්‍රිවෙජ්දය පවා නොවන්නේය ප්‍රකෘති භික්ෂුවක් හා එකපියස්ස ඇති පන්සල් ගේක හෝ කුටියක හෝ විහාර ගේක හෝ මඩොගෙයක හෝ මූසුන් තබන ගෙයක හෝ දුව දමන ගෙයක හෝ පැන් තබන ගෙයක හෝ වැඟිකිලියක හෝ වාරකොෂ්ඨක හෝ යන හෝ මේ ආදි කිසියම් තැනක පියස්සෙන් දිය වැටෙන ප්‍රමාණය ඇතුළත යම් කිසි අවකාශයක විසීම නොවටී.

එදවස් උපසපන්වූ ප්‍රකෘති භික්ෂුවක් දැක හුනස්නෙන් නැගිට ආදර ඇතිව ගුරුවරයකුට සේ සැලකිලි සහිතව වැඩ හිඳීමට ආරාධනා කිරීම හා සුවසෙන් උන් මා නැතුටුවන ලදැයි දෙම්හස්ව ඇවතට නොයෑම ද වටී. නවක භික්ෂූන් පිරිවෙස් පුරණ වැඩිමහලු තෙරුන්ට පීඩා කොරම් කියා හෝ අවමන් කෙරෙම් කියා හෝ ඔවුන් වෙතට නොයෑයුතු ප්‍රකෘති භික්ෂූන් හා එක අස්නෙහි නොහිඳිම ද බාලනමුදු ප්‍රකෘති භික්ෂුවක් මිටි අස්නෙහි උන්කල තෙමේ උස්අස්නෙහි නොහිඳීම ද ඕම උන් කල අස්නෙහි නොහිඳීම ද සුදුසු සේ හිඳිනාකලත් දෙලොස් රියන් උපචාරය හැර හිඳීම ද ප්‍රකෘති භික්ෂුව හා එක ඍක්මනෙහි සක්මන් නොකිරීම ද පහත් සක්මනෙහි සක්මන් කරනකල උස් සක්මනෙහි ද ඕම සක්මන් කරන කල සක්මන් මලුයෙහි ද සක්මන් නොකිරීම ද හැම ලෙසින්ම ප්‍රකෘති භික්ෂුවකට වඩා පහත් සේ සිවි ඉරියව්වෙන්ම කල් යැවීම ද වටී, කාප්පයකින් වට කළාවූ හෝ චාරකොෂ්ඨක යෙදුවාවූ හෝ පවිත අතරක හෝ වනයකින් මැදිවූ හෝ පදුරුවලින් මැදිවූ හෝ කොඳින් මැසුනු සක්මනක සක්මන් කළයුතු, එසේ නැතිකල්හිදු දෙලොස් රියන් අත්පස හැර සක්මන් කිරීම වටී.

වැඩිමහල් පිරිවෙස් වසන භික්ෂුවය මූලාගපරිකසසනයට සුදුසු මහණය මානතට සුදුසු මහණය මානත පුරණ මහණය අබ්භානයට සුදුසු මහණය යන මින් එක් නමක්හාද එක් පියස්ස ඇති පන්සලක හෝ කුටිආදියෙහි හෝ නොවිසිය යුතු, පිරිවෙස් වසන වැඩිමහලු නමක් පළමු නිදි ගත් කල බාල මහණෙක් දැන දැන නිදා නම් ඔහුට රාත්‍රිවේජ්දය හා වත් බිඳීමෙහි දුකුළා වේ, වැඩි මහල් නමට රාත්‍රිවේජ්දය පමණකි, නොදැන නිදි ගත් කල දෙනමටම වත්තභෙදයෙහි දුකුළා නොවේ, රාත්‍රිවේජ්දය පමණකි, පිරිවෙස් වසන නවක භික්ෂුවක් පළමු නිදි ගත් කල වැඩි මහල් නමක් පසුව නිදි ගත් බැව් නවක භික්ෂුතෙමේ දනී නම් රාත්‍රිවේජ්දය හා වත්තභෙදයෙහි දුකුළා වේ, වැඩි මහල් භික්ෂුහට රාත්‍රිවේජ්දය පමණකි, නොදනී නම් දෙනමටම වත්තභෙදයෙහි දුකුළානැති, රාත්‍රිවේජ්දය පමණකි, දෙනමම එකවිට නිදි ගත් කල වැඩි මහලු භික්ෂුහට රාත්‍රිවේජ්දය පමණකි, බාලනමට රාත්‍රිවේජ්දය හා වත්තභෙදයෙහි දුකුළා වේ යනු කුරුන්දි අට්ඨකථායෙහි කියනලදි, පිරිවෙස් පුරණ සමවස් ඇති දෙනමක් අතුරෙන් එක් නමක් පළමු නිදි ගත් කල අනික් නම දැන දැන පසුව නිදා නම් ඔහුට රාත්‍රිවේජ්දය හා වත්තභෙදයෙහි දුකුළාද වේ, පළමු නිදි ගත් නමට රාත්‍රිවේජ්දය වේ, වත්තභෙදයෙහි දුකුළා නොවේ. පසුව නිදි ගත් නම නොදනී නම් ඔහුට ද වත්තභෙදයෙහි දුකුළා නොවේ, එකවිට දෙනමම නිදි ගත් කල දෙනමටම රාත්‍රිවේජ්දය පමණකි, වත්තභෙදයෙහි දුකුළා නොවේ පාරිවාසික දෙනමකගේ එක් පියස්ස තුළ නිදි ගැනීම සවිප්‍රකාරයෙන් මළක්වන ලද්දේ ඔවුනොවුන්ගේ අජ්ඣාචාරය දැන කලකිරී ඒ ඇවතට හෝ ඊට වඩා ලාමක ඇවතකට හෝ පසුව ඔවුහු පැමිණෙන්නෝය සිවුරු හැරීම හෝ කරන්නෝය එබැවිනි.

මූලායපටිකස්සනාදියට සුදුසු මහණය මානතට සුදුසු මහණය මාන කතවාරික භික්ෂුවය අබභානාදියට සුදුසු මහණය යන මොවුහු පාරිවාසික භික්ෂූන්ට ප්‍රධාති භික්ෂුහු වැනිවෙත් එබැවින් ඔවුන් කෙරේ ප්‍රකෘති භික්ෂූන්ට කිංචි පිළිපැදිය යුතු. පිරිවෙස් පුරණ බාල මහණුන්ගෙන් වැඳීම් ආදිය එසේවූ වැඩිහිල් මහණුන්ට ඉවසීම් වැරදි නොවේ. බාල වූවද මූලායපටිකස්සනාදියට සුදුසු මහණුන්ගෙන් වැඩි මහල් පිරිවෙස් පුරණ මහණුන්ට වැඳීම් ආදිය ඉවසීම වැරදි වේ, යටත් පිරිසෙසින් සහවිහාරිනෙයකුගෙන් වත් නොවිමය, උපොසථය පවාරණය වසසික සාටිකය ඔණෝජනය බතය යන මේ පස ප්‍රකෘති භික්ෂූන් හා වැඩි මහලු පිළිවෙළින් සරනු ලැබේ වේ, පාමොක් උදෙසන කල අස්පස හිඳීම වටී, මහාපවරණයෙහි පෙළට නොහිඳ අස්පස නොකැඩෙන සේ කෙළවර හිඳීම යුතුගසි කියනලදී, පාරිසුඛි උපොසථය හා පවාරණය සඞඝසනවක සථානයෙහි හිඳ වස්ගණනින් තමන්ට පැමිණි වාරයෙහි කිරීම වටී, සන්න විසින් ගෙඩිය ගසා වැහිහළු බෙදහුලබන කල තමන්ට වැඩි මහලු පිළිවෙළින් පැමිණි කොටස භාරනැනීම වටී, ඔණෝජනය නම් තමන්ට පැමිණි උදෙසගතනාදිය එදින අනිසෙකුට හාර කරවා පසුදිනකට තමන් පවරවා ගැනීමය, බතනම් මිනිසුන් විසින් වෙහෙරට ගෙනවුත් දෙනලද පැමිණි පැමිණි හෙරණුන් හා මහලු පැවිද්දන් විසින් වැඩි මහලු පිළිවෙළින් ගෙන යාගුතු බතය පේළියට නොගොස් පේළියෙහි නොසිට උකුස්සෙකු සේ ඒ බත ගෙන යාගුතුය, ආරාම්කයන් හා හෙරණුන් ලවා නොගෙන්විය යුතු, ඔවුන් සිය කැමැත්තෙන් ගෙනත් දුන් කල පිළිගැනීම වටී, යම් කැනකදී වැඩහිඳුවා වලඳවත් නම් මහලු පැවිද්දන්ගේ අනුලවර හෙරණුන්ට මුල් අන්නෙහි හිඳීම වටී, මූලායපටිකස්සනාදියට සුදුසු මහණය මූලායපටිකස්සනය ලත් මහණය මානතට සුදුසු මහණය මානත පුරණ මහණය අබභානයට සුදුසු මහණය යන මොවුන්ටත් මේ වත්ම සාධාරණ වේ.

තජ්ජනීය කම්මය නියස්ස කම්මය පබබාජනීය කම්මප්පටිසාරණීය කම්මාදිභාවං. කම්මය පටිසාරණීය කම්මය උක්ඛේපනීය කම්ම තුනයහි සත් වැදෑරුම් වේ, එහි තජ්ජනීය කම්මය ප්‍රධාන වශයෙන් බබරභාරත භික්ෂූන්ට කළයුතු කම්මයෙකි, මේ කම්මය ලැබීමට සුදුසු කම්වශයෙන් කරුණු අටළොසකි, එහි කොයියම් කරුණකින් නමුත් වරදට පත් භික්ෂුවට මේ කම්මය සඳහා රැස්වූ සඞඝයා වහන්සේගේ සමානච්ඡන්දයෙන් කරනු ලැබේ වේ. මින් නිදහස ලැබීමට වත් අවලොසක් සම්පූර්ණ කිරීමෙන් ලැබේ වේ, නියස්ස කම්මය ප්‍රධාන වශයෙන් ඇවැත් බහුල භික්ෂූන්ට කළයුතු කම්මයෙකි, මිටද කරුණු අටළොසකි, නිදහස ලැබීමට වත් ද අටළොසකි, පබබාජනීය කම්මය ප්‍රධාන වශයෙන් කුලදූසක භික්ෂූන්ට කළයුතු කම්මයෙකි, මිට කරුණු තුදුසෙකි, නිදහස ලැබීමට වත් අටළොසකි. පටිසාරණීය කම්මය ගිහීන්ට ජාත්‍යාදීන් ගරා බැණීම් කළ භික්ෂූන්ට කළයුතු කම්මයෙකි, මිට

උපජ්ඣායෙන භික්ඛවෙ සද්ධිවිහාරිකම්හි සම්මා වත්තිතබ්බං. තත්‍රා යං සම්මාවත්තනා — උපජ්ඣායෙන භික්ඛවෙ සද්ධිවිහාරිනෝ සඞ්ගණ්හෙ තබ්බා අනුග්ගහෙතබ්බා උද්දෙසෙන පරිපුච්ඡාය ඔවාදෙන අනුසා සනියා. සචෙ උපජ්ඣායස්ස පත්තො හොති සද්ධිවිහාරිකස්ස පත්තො න හොති, උපජ්ඣායෙන සද්ධිවිහාරිකස්ස පත්තො දාතබ්බා, උස්සුක්කං වා කාතබ්බං — කිත්තාවතා සද්ධිවිහාරිකස්ස පත්තො උප්පජ්ජෙය්‍යාති, සචෙ උපජ්ඣායස්ස චීවරං හොති සද්ධිවිහාරිකස්ස චීවරං න හොති, උපජ්ඣායෙන සද්ධිවිහාරිකස්ස චීවරං දාතබ්බං, උස්සුක්කං වා කාතබ්බං — කිත්තාවතා සද්ධිවිහාරිකස්ස චීවරං උප්පජ්ජෙය්‍යාති, සචෙ උපජ්ඣායස්ස පරික්ඛාරෙ හොති සද්ධිවිහාරිකස්ස පරික්ඛාරෙ න හොති, උපජ්ඣායෙන සද්ධිවිහාරිකස්ස පරික්ඛාරෙ දාතබ්බා, උස්සුක්කං වා කාතබ්බං — කිත්තාවතා සද්ධිවිහාරිකස්ස පරික්ඛාරෙ උප්පජ්ජෙය්‍යාති.

කරුණු විස්සෙකි, නිදහස ලැබීමට මත් අටලොසකි. උකෙඛපනීය කම්මය තුන් ආකාර වේ, ඉන් ඇවතට පැමිණ ඇවෑත් යයි නොදත් මහණහට කළයුතු කම්මය පළමුවෙනි වේ, ඇවතට ප්‍රතිකර්ම නොන රත මහණහට කළයුතු කම්මය දෙවෙනි වේ, පව්වු දැවි ගත් මහණහට කළයුතු කම්මය තුන්වෙනි වේ, මේ තුනටම කරුණු අටලොස අටලොස බැගින් විද්‍යමාන වේ, පළමුවෙනි දෙවෙනි දෙනට මත් නතළිස් තුන නතළිස් තුන බැගින් ද තුන්වෙනි එකට අටලොසක් ද වේ. මෙයි කම්ම යන්ට නියමිත වක් නොදින් සම්පූර්ණ කිරීම නිසා දස දිනකින් නොහොත් පසළොස් දිනයකින් නිදහස ලබාගනු හැකි වේ. මේ පිළිබඳ විසතර සුලුවඟ කම්මකඛණයෙන් බැලියයුතු.

භික්ඛවෙ, මහණෙනි; උපජ්ඣායෙන, උපාධ්‍යායයන් විසින්; සද්ධි විහාරිකම්හි, සද්ධිවිහාරිකයා කෙරෙහි; සම්මා, මනාකොට; වත්තිතබ්බං, පැවතිය යුතු; තත්‍ර, එහි; අයං, මෝනොමෝ; සම්මා, මනාකොට; වත්තනා, පැවතීම් පිළිවෙළ වන්නීය; භික්ඛවෙ, මහණෙනි; උපජ්ඣායෙන, උපාධ්‍යායයන් විසින්; සද්ධිවිහාරිකා, සද්ධිවිහාරිකතෙම; උද්දෙසෙන, උද්දෙසීමෙන් ද; පරිපුච්ඡාය, කරුණු විමසීමෙන් ද; ඔවාදෙන, අවවාද දීමෙන් ද; අනුසාසනියා, අනුශාසනා කිරීමෙන් ද; සඞ්ගහෙතබ්බා, සඞ්ග්‍රහ කටයුත්තේය; අනුග්ගහෙතබ්බා, අනුග්‍රහ කටයුත්තේය; සචෙ, ඉඳින්; උපජ්ඣායස්ස, උපාධ්‍යායයන් වහන්සේහට; පත්තො හොති, පාත්‍රයෙක් වේද; සද්ධිවිහාරිකස්ස, සද්ධිවිහාරිකයාහට; පත්තො, පාත්‍රයෙක්; න හොති, නොවේ ද; උපජ්ඣායෙන, උපාධ්‍යායයන් විසින්; සද්ධිවිහාරිකස්ස, සද්ධිවිහාරිකයාහට; පත්තො, පාත්‍රයතෙම; දාතබ්බා, දියයුතු; සද්ධිවිහාරිකස්ස, සද්ධිවිහාරිකයාහට; පත්තො, පාත්‍රයෙක්; කිත්තා වතා, කෙසේනම්; උප්පජ්ජෙය්‍ය ඉති, උපදිනුලබන්නේදැයි; උස්සුක්කං වා, උත්සාහ හෝ; කාතබ්බං, කටයුතු; සචෙ, ඉඳින්; උපජ්ඣායස්ස, උපාධ්‍යායයන්හට; චීවරං හොති, සිවුරක් වේ ද; සද්ධිවිහාරිකස්ස, සද්ධි

සචෙ සද්ධිවිහාරිකො ගිලානො හොති කාලසෙසෙව වුට්ඨාය දන්ත කට්ඨං දාතබ්බං මුඛොදකං දාතබ්බං ආසනං පඤ්ඤපෙතබ්බං, සචෙ යාගු හොති භාජනං ධොවිත්වා යාගු උපනාමෙතබ්බා, යාගුපිතස්ස උදකං දත්වා භාජනං පටිග්ගහෙත්වා නීවා කත්වා ආධුකා අපරිසං සණෙන්න ධොවිත්වා පටිසාමෙතබ්බං, සද්ධිවිහාරිනම්හි වුළිතෙ ආසනං උඩ්ඩිතබ්බං, සචෙ සො දෙසො උක්ලාපො හොති සො දෙසො සම්ම ජ්ජිතබ්බා, සචෙ සද්ධිවිහාරිකො ගාමං පවිසිතුකාමො හොති නිවාසනං දාතබ්බං, පටිනිවාසනං පටිග්ගහෙතබ්බා, කායබන්ධනං දාතබ්බං, සඝුණං කත්වා සාඝාටියො දාතබ්බා, ධොවිත්වා පත්තො සඋදකො දාතබ්බා, එත්තාවතා නිවත්තිස්සතීති ආසනං පඤ්ඤපෙතබ්බං, පාදෙදකං පාදපීඨං පාදකථලිකං උපනික්ඛිපිතබ්බං, පවුග්ගහෙත්වා චීවරං පටිග්ගහෙතබ්බං, පටිනිවාසනං දාතබ්බං, නිවාසනං පටිග්ගහෙතබ්බං, සචෙ චීවරං සිබ්බනං හොති මුහුත්තං උණ්හෙ ඔතාපෙතබ්බං, නව උණ්හෙ චීවරං නික්ඛිපිතබ්බං, චීවරං සංසරිතබ්බං, චීවරං සංසරන්තෙන චතුරඞ්ගුලං කණ්ණං උස්සාදෙත්වා චීවරං සංසරිතබ්බං මා මජ්ඣෙ භඞ්ගා අහොසීති, ඔභොගෙ කායබන්ධනං කාතබ්බං.

විහාරිකයාහට; චීවරං, සිවුරක්; න හොති, නොවේ ද; උපජ්ඣායෙන, උපාධ්‍යායයන් විසින්; සද්ධිවිහාරිකස්ස, සද්ධිවිහාරිකයාහට; චීවරං දාත බ්බං, සිවුර දිය යුතු; සද්ධිවිහාරිකස්ස, සද්ධිවිහාරිකයන්හට; කිත්තකිත්තුබො, කිතම් උපායකින්; චීවරං උප්පජ්ජිසෙථ ඉති, සිවුරක් උපදිනු ලබන්නේ දැයි; උස්සුක්කං වා කාතබ්බං, උත්සාහ හෝ කටයුතු; සචෙ, ඉදින්; උප ජ්ඣායස්ස, උපාධ්‍යායයන්හට; පරික්ඛාරො හොති, පිරිකරෙක් වීනම්; සද්ධිවිහාරිකස්ස, සද්ධිවිහාරිකයන්හට; පරික්ඛාරො න හොති, පිරිකරෙක් නොවේ නම්; උපජ්ඣායෙන, උපාධ්‍යායයන් විසින්; සද්ධිවිහාරිකස්ස, සද්ධි විහාරිකයන්හට; පරික්ඛාරො දාතබෙබා, පිරිකර දිය යුතු; සද්ධිවිහාරි කස්ස, සද්ධිවිහාරිකයන්හට; කිත්තකිත්තුබො, කිතම් උපායකින්; පරික්ඛා රො උප්පජ්ජිසෙථ ඉති, පිරිකර උපදිනු ලබන්නේදැයි; උස්සුක්කං මා කාතබ්බං, උත්සාහ හෝ නට යුතු.

සචෙ, ඉදින්; සද්ධිවිහාරිකො, සද්ධිවිහාරික තෙම; ගිලානො හොති, ගිලන් වී නම්; කාලසෙසෙව, කලින්ම; උට්ඨාය, නැඟිව; (අරුණට පළමු නැඟී සිට) දන්තකට්ඨං දාතබ්බං, දැහැටි දිය යුතු; මුඛොදකං, —පෙ— පටිසාමෙතබ්බං, 152 වෙනි පිටේ 33 වෙනි පෙළ පටන් බලනු. සද්ධිවිහා රිකමහි, සද්ධිවිහාරිකයන්; වුට්ඨිතෙ, නැඟිසිටිකල්; ආසනං උඩ්ඩිතබ්බං —පෙ— සම්මජ්ජිතබ්බා, 153 වෙනි පිටේ 12 වෙනි පෙළ පටන් බලනු. සචෙ, ඉදින්; සද්ධිවිහාරිකො, සද්ධිවිහාරික තෙම; ගාමං පවිසිතුකාමො හොති —පෙ— සඋදකො පත්තො දාතබ්බා, 153 වෙනි පිටේ 15 වෙනි පෙළ පටන් බලනු. එත්තාවතා, මෙතෙකින්; නිවත්තිස්සති ඉති, නව නින්නේ යැයි; (පිඬු සිඟා ගමට වත් සද්ධිවිහාරිකයන්ගේ නැවතීම්

සවේ පිණ්ඩපාතෝ හොති සඞ්ඝිභාරිකෝ ච භුඤ්ජිතුකාමෝ හොති උදකං දත්වා පිණ්ඩපාතෝ උපනාමෙතබ්බෝ, සඞ්ඝිභාරිකෝ පාණියෙන ප්‍රවජිතබ්බෝ, භුත්තාවිස්ස උදකං දත්වා පත්තං පටිග්ගහෙත්වා නීවං කත්වා සාඩ්ඨකං අපරිසංසත්තෙන ධොවිත්වා වොදකං කත්වා මුහුත්තං උණ්හෙ ඔතාපෙතබ්බෝ, තව උණ්හ පත්තෝ නිඛ්ඛිතබ්බෝ, පත්තච්චරං නික්කිපිතබ්බං, පත්තං නික්කිපන්තෙන එකෙන හත්ථෙන පත්තං ගහෙත්වා එකෙන හත්ථෙන හෙට්ඨා මඤ්චං වා හෙට්ඨා පීඨං වා පරාමසිත්වා පත්තෝ නික්කිපිතබ්බෝ, තව අන්ත හාරහිතාය භූමියා පත්තෝ නික්කිපිතබ්බෝ, චීවරං නික්කිපන්තෙන්ත එකෙන හත්ථෙන චීවරං ගහෙත්වා එකෙන හත්ථෙන චීවරවංසං වා චීවරරජ්ජුං වා පමජ්ජිත්වා පාරතෝ අන්තං ඔරතෝ හොගං කත්වා චීවරං නික්කිපිතබ්බං, සඞ්ඝිභාරිකමහි වුට්ඨිතෙ ආසනං උඞ්ගිතබ්බං, පාදෝදකං පාදපීඨං පාදකථලිකං පටිසාමෙතබ්බං, සවේ සෝ දෙසෝ උක්කාපෝ හොති සෝ දෙසෝ සම්මජ්ජිතබ්බෝ, සවේ සඞ්ඝිභාරිකෝ නහායිතුකාමෝ හොති නහානං පටියාදෙතබ්බං, සවේ සීතෙන අත්ථෝ හොති සීතං පටියාදෙතබ්බං, සවේ උණ්හෙන අත්ථෝ හොති උණ්හං පටියාදෙතබ්බං.

සවේ සඞ්ඝිභාරිකෝ ජන්තාඝරං පවිසිතුකාමෝ හොති චුණ්ණං සන්තෙතබ්බං මත්තිකා තෙමෙතබ්බා, ජන්තාඝරපීඨං ආදාය ගන්ත්වා ජන්තාඝරපීඨං දත්වා චීවරං පටිග්ගහෙත්වා එකමන්තං නික්කිපිතබ්බං චුණ්ණං දාතබ්බං මත්තිකා දාතබ්බා, සවේ උස්සහති ජන්තාඝරං පවිසිතබ්බං, ජන්තාඝරං පවිසන්තෙන මත්තිකාය මුඛං මකෙත්වා පුරතෝ ච පච්ඡතෝ ච පරිභණ්ඩෙත්වා ජන්තාඝරං පවිසිතබ්බං, න ථෙරෙ භික්ඛූ අනුපඛජ්ජ නිසීදිතබ්බං, න නවා භික්ඛූ ආසන්නෙන පටිබාහෙතබ්බා, ජන්තාඝරෙ සඞ්ඝිභාරිකස්ස පරික්කමං කාතබ්බං, ජන්තා

කාලය දැන් වන්නේ යයි දැන) ආසනං පඤ්ඤපෙතබ්බං, අස්නාන් පැන විය යුතු; පාදෝදකං —පෙ— කායබන්ධනං කාතබ්බං, 154 වෙනි පිටේ 15 වෙනි පෙළ පටන් බලනු.

